පළාත් සභා ක්‍රමය
ශක්තිමත් කර ගැනීමේ
වැ ඩ ස ට හ න
2008

# විසි වසරක
# අත්දැකීම් ආශ්‍රිත
# ජාතික නිර්දේශ

USAID
FROM THE AMERICAN PEOPLE

CPA
Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# විසි වසරක අත්දැකීම් ආශ්‍රිත ජාතික නිර්දේශ

ප්‍රථම මුද්‍රණය - 2008 මැයි
ISBN 978-955-1655-37-2

සංස්කාරක - ලයනල් ගුරුගේ
පරිගණක සැකැස්ම - ලිත්මා ග්‍රැෆික්ස් දුර.ඇමතුම්: 011-2708377
මුද්‍රණය - ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස් දුර.ඇමතුම්: 011-2329739
ප්‍රකාශනය - විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
- ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් අංශය

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිට වනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

වැඩිදුර විස්තර සඳහා:
**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**
**ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් අංශය**
24/2, 28 වැනි පටුමග, පිටත මල් පාර, කොළඹ 07.
දුරකථන : 011-2370801-4 ෆැක්ස් : 011-2370802
ඊමේල්: cpa@cpalanka.org
වෙබ් අඩවිය: www.cpalanka.org


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# පෙළගැස්ම


1. මෙය මඟ හැරිය නොහැකි අවස්ථාවකි 5

2. හැඳින්වීම 7

3. අවසන් යෝජනාවලිය 25
(විසි වසරක අත්දැකීම් ආශ්‍රිත ජාතික නිර්දේශ මාලාව)

4. පළාත් මට්ටමේ අවසන් යෝජනා (පළාත් සභා අභිමතය) 31
- බස්නාහිර පළාත් සභා නිර්දේශ 35
- මධ්‍යම පළාත් සභා නිර්දේශ 37
- උතුරු මැද පළාත් සභා නිර්දේශ 39
- සබරගමුව පළාත් සභා නිර්දේශ 41
- දකුණු පළාත් සභා නිර්දේශ 45
- ඌව පළාත් සභා නිර්දේශ 47
- වයඹ පළාත් සභා නිර්දේශ 49
- පළාත් සභා සාර්ථක කර ගැනීම - කාල රේඛාව 51
- නැගෙනහිර පළාත් සභා නිර්දේශ 54

5. පළාත් සභා මූලික යෝජනා (දෙවැනි පියවර) 57
- බස්නාහිර පළාත් සභාව 59
- උතුරු මැද පළාත් සභාව 68
- ඌව පළාත් සභාව 86
- වයඹ පළාත් සභාව 96
- නැගෙනහිර පළාත් සභාව 107
- සබරගමුව පළාත් සභාව 118
- දකුණු පළාත් සභාව 126

6. සමස්ත වැඩසටහනෙහි පළාත් සභා නියෝජනය 137


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# මෙය මඟ හැරිය නොහැකි අවස්ථාවකි

වසර 20 ක් තිස්සේ මෙරට ක්‍රියාත්මක වූ ද බොහෝ විවාදයන්ට තුඩු දුන්නා වූ ද පළාත් සභා ක්‍රමය පිළිබඳ ආපසු හැරී බැලීම සඳහා අවස්ථාවක් උදා විය. ඒ සර්ව පාක්ෂික කමිටුවේ අතුරු යෝජනාවක් හැටියට 13 ව්‍යවස්ථා සංශෝධනයේ සියලු බලතල ලබා දීමට ජනාධිපතිවරයා ඇතුළු පාර්ශ්ව ගණනාවක් එකඟ වීම ය.

බල හවුල්කාරිත්වය ඔස්සේ ජනවාර්ගික ප්‍රශ්නයට සාමකාමී විසඳුමක් නිරතුරු අපේක්ෂා කළ ආයතනයක් හැටියට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙහි දී යම් මැදිහත්වීමක් කරන්නට අදහස් කළේ ය. ඒ අනුව පළාත් සභා ක්‍රමය පිලිබඳ ගැඹුරු කතිකාවතක් ඇරඹීම අපගේ අපේක්ෂාව විය.

මෙය අදියර කීපයකට ක්‍රියාත්මක කිරීමට අපි අදහස් කළෙමු.

පළමුව පළාත් සභාවල මහ ඇමතිවරු ඇතුළු මහජන නියෝජිතයන් හා නිලධාරීන් සමඟ මුල් වටයේ සාකච්ඡාවක් පවත්වන ලදි. ඉන් අනතුරුව පළාත් සභාවකට එකක් බැගින් තෙදින වැඩමුළු පැවැත්වීම ඔස්සේ පළාත් සභා ක්‍රමයෙහි දැන් තත්ත්වය, සපලතා, අභියෝග සහ විකල්ප මොනවා දැයි වාර්තා සකස් කළෙමු.

අවසානයේ දී සියලු පළාත් සභාවල තෝරා ගත් නියෝජිතයන් සහභාගි කර ගනිමින් අවසාන වාර්තාව සකස් කෙරුණි. මේ අවසන් වාර්තාව මැයි 28 දා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වෙන සමුළුවේ දී ජනාධිපතිවරයා හට බාර දීම මූලික අරමුණ විය. එමෙන් ම මෙය දේශපාලන පක්ෂවල සෙසු නායකයන් සහ ජනමාධ්‍ය ඇතුළු සියලු පාර්ශ්වවල අවධානයට ලක් කරමින් එය පුළුල් සමාජ සංවාදයකට ලක් කිරීම අපේක්ෂාව විය.

නැගෙනහිර පළාත් සභා මැතිවරණය පැවැත්වුණේ මේ වැඩමුළු පැවැත්වෙන අතර වාරයේ දී ය. එහි පළාත් සභාවක් පිහිටුවීම මේ ක්‍රියාවලියට යම් ශක්තියක් ද සැපයී ය.

මෙම කටයුත්තෙහි දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ පාක්‍යසෝති සරවනමුත්තු, අධ්‍යක්ෂ මණ්ඩලයේ රොහාන් එදිරිසිංහ, සෝෂල් ඉන්ඩිකේටර් ප්‍රධානී ප්‍රදීප් පීරිස් සහ ජෝශප් තවරාජා ඇතුළු විද්වතුන් විසින් කරන ලද මගපෙන්වීම හා කැපවීම සුවිශේෂී ය. සී. දොඩාවත්ත, එස්. සිවගුරුනාදන් සහ තිඹිරියාගම බණ්ඩාර යන මහත්වරුන් ද ලබාදුන් සහාය අගනේ ය.

© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

වැඩසටහනේ සම්පත් දායකත්වයට සීමා නොවී 13 වැනි සංශෝධනයෙහි ව්‍යුහයන්, එය ක්‍රියාත්මක කිරීමේ ගැටලු සහ විකල්ප සීරුවෙන් අධ්‍යයනය කරමින් අගනා නිබන්ධයක් සැපයූ ව්‍යවස්ථා හා නීති පර්යේෂක අසංග වැලිකල මහතාට අපගේ ගෞරවය හිමි වේ.

එමෙන් ම සම්පත් දායකයන් හැටියට මහාචාර්ය සුමනසිරි ලියනගේ, නීතිඥ එස්. ජී. පුංචිහේවා, මූල්‍ය කොමිසමේ සභාපති අශෝක ගුණවර්ධන, විදේශ කටයුතු අමාත්‍යංශයේ අධ්‍යක්ෂ කේ.ඞී.එස්. රුවන් චන්ද්‍ර, මහාචාර්ය නවරත්න බණ්ඩාර සහ මූල්‍ය කොමිසමේ අධ්‍යක්ෂ සාලිය ධර්මවර්ධන ඇතුළු විද්වතුන් දුන් දායකත්වය විශාල ය.

එමෙන් ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් අංශයේ කාර්ය මණ්ඩලය මෙහි ලා දුන් සහයෝගය ද සුළු පටු නොවේ.

යාපනය හැර සෙසු සරසවිවල සිසු නියෝජිතයන්ගේ අදහස් මේ යෝජනාවලිය සකස් කිරීම සඳහා දායක කර ගන්නට ලැබීම ද විශේෂත්වයකි. ඒ සඳහා සහාය දැක්වූ සරසවි ආචාර්යවරුන්ට ද ප්‍රණාමය හිමිවේ.

පළාත් සභා වැඩසටහන සම්බන්ධ ව ජනාධිපතිවරයා සමඟ කටයුතු සම්බන්ධීකරණය කිරීමේ දී සහාය දුන් ප්‍රවාහන අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතා ද ගෞරවයෙන් සිහිපත් කළ යුතු ය.

දශක කිහිපයක් තිස්සේ දහස් ගණනකගේ රුධිරයෙන් පොළෝ තලය තෙත් කිරීමට හේතු වූ යුද්ධයට විරාමයක් තැබීම දැවෙන අවශ්‍යතාවකි. නැගෙනහිර පළාත් සභා මැතිවරණය එහි දී ඉතා වැදගත් හැරවුම් ලක්ෂයකි.

පළාත් සභා මුහුණ පා සිටින අර්බුදය ගැඹුරින් වටහා ගනිමින් දුර දක්නා නුවණින් යුතු ව ඊට සුදුසු ම පිළියම් යෙදීමේ අනගි අවස්ථාව මඟහැරී ගිය හොත් අනාගතයෙහි මීට වඩා විශාල වන්දියක් අපේ මාතෘ භූමියට ගෙවන්නට සිදුවන බව මගේ හැඟීම යි.

එහෙයින් මේ අඳුරු පැයෙහි අනාගතය මිනිස්කමින් ආලෝකවත් කරන අරුණු දහරක් කැඳවා ගැනීමට අපි අධිෂ්ඨාන කර ගනිමු.

**ලයනල් ගුරුගේ**
සම්බන්ධීකාරක
ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් අංශය
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# හැඳින්වීම

> ශ්‍රී ලංකාවේ සාමය හා ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධ දේශපාලන හා ව්‍යවස්ථාමය අභියෝග ජය ගැනීමට එම බලය පවරා දීමේ වැඩ පිළිවෙළ කොතරම් යථාර්ථවත් හෝ ප්‍රායෝගික ද යන කරුණ ගැන බරපතල සැක සංකා මතු වී ඇත.

ශ්‍රී ලංකාව තුළ පළාත් සභා ක්‍රමයක් මගින් දේශපාලන බලය පවරා දීමේ ව්‍යුහාත්මක සැලැස්මක් 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට සංශෝධනයක් වශයෙන් 1987 දී ව්‍යවස්ථා ගත විය. 13 වැනි සංශෝධනය දිවයිනේ උතුරු නැගෙනහිර දෙමළ ජනතාවගේ දේශපාලන අභිලාෂයන්ට ප්‍රතිචාරයක් වශයෙන් මූලිකව සැලසුම් කළත්, විවිධ දේශපාලන සිද්ධීන් නිසා එම පරමාර්ථය ඉටුකර ගැනීමට නොහැකි විය.

අනාගතයේ බලය බෙදා හදා ගැනීම පිළිබඳ වඩා හරවත් යෝජනා, සර්ව පාක්ෂික නියෝජිත කමිටුව විසින් ඉදිරිපත් කරන තුරු, අන්තර් ක්‍රියා මාර්ගයක් ලෙස දහතුන් වන සංශෝධනයේ බලය පවරාදීමේ ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපාදන වර්තමාන ආණ්ඩුව විසින් දක්වා ඇත.

ශ්‍රී ලංකාවේ සාමය හා ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධ දේශපාලන හා ව්‍යවස්ථාමය අභියෝග ජය ගැනීමට එම බලය පවරා දීමේ වැඩ පිළිවෙළ කොතරම් යථාර්ථවත් හෝ ප්‍රායෝගිකද යන කරුණ ගැන බරපතල සැක සංකා මතු වී ඇත. එසේ වුව ද, පළාත් සභා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ අත්දැකීම් අනුව, පවතින ක්‍රමයට වඩා එය මුළුමනින් ක්‍රියාත්මක කිරීමෙන් වැඩි ප්‍රයෝජන ලැබිය හැකි අතර, අනාගත බලය බෙදා හදා ගැනීමේ ක්‍රියා කාරීත්වයක දී අත්හැරිය යුතු ගැටලු හඳුනාගත හැකි ය. එබැවින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා එක්සත් ජනපද ආයතනය එකතු වී වැඩමුළු වැඩසටහනක් ආරම්භ කරන ලදි. එහි දී මෙවැනි ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමුඛ අත්දැකීම් සහ ඊට ඉතා සමීප සබඳතා ඇති පිරිසක් සමඟ හවුල් වී ඇති කළ අදහස් හා ප්‍රායෝගික දැනුම විධිමත් ආකාරයකින් බද්ධ කිරීම මගින් ප්‍රතිපත්ති සම්පාදකයන් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණකරුවන් සහ පොදු මහජනතාවට මහඟු ප්‍රයෝජනයක් ලැබිය හැකි ය.

ඒ සම්බන්ධයෙන් ඇති කරන ලද විධිමත් සාකච්ඡා සහ වැඩමුළුවලින් හඳුනා ගැනුණු කරුණු ප්‍රධාන තේමා අටක් යටතේ මෙම වාර්තාවේ දක්වේ. වැඩමුළුවලදී ඉස් මතු වූ සෑම කරුණක් ම එහි නොදක්වේ. එම කරුණු පහසුවෙන් සොයා ගත හැකි අයුරින් වාර්තාවට ඇමුණුම් වශයෙන් දක්වා ඇත. වර්තාවෙන් අවධාරණය කරනුයේ සෑම පළාත් සභාවක ම පාහේ අත්දැකීම වූ වැදගත් ගැටලු

ය. තව ද වැඩමුළුවල කණ්ඩායම් සාකච්ඡාවල දී මතු වූ කරුණුවලට පමණක් වාර්තාව මුළුමනින් සීමා කොට නැත. පූර්ණ සැසිවාරවල දී, ප්‍රශ්නෝත්තර අවස්ථාවන්හි දී, සහභාගිකයන් ගේ අවිධිමත් වාද විවාදවලදී මතු වූ කරුණු මෙන් ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ආයතනික දැනුම ආදිය ද ඊට එකතු විය.

පළමුවන පරිච්ඡේදයේ දී, පසුව එන තුන්වන පරිච්ඡේදයේ සාකච්ඡා වන තේමාව සන්දර්භගත කිරීම සඳහා දහතුන් වන සංශෝධනයේ සැලැස්ම පිළිබඳ සංක්ෂිප්ත හැඳින්වීමක් වාර්තාවෙහි අන්තර්ගත වේ.

# දහතුන්වන ව්‍යවස්ථා සංශෝධනය අනුව බලය පැවරීමේ රාමුව

මෙම පරිච්ඡේදයේ අදහස වන්නේ, තුන්වන පරිච්ඡේදයේ සඳහන් වැඩමුළුවලින් මතු කරන ලද සාරවත් කරුණු තේමාගත කොට ඉදිරිපත් කිරීමයි. ඒ සඳහා දහතුන්වන සංශෝධනය ගැන සංක්ෂිප්ත හැඳින්වීමක් දැක් වේ. එය බලාත්මක කොට අවුරුදු විස්සකට පසු මෙම වැඩමුළුවලින් සිදුවූයේ දහතුන්වන සංශෝධනය විධිමත් ඇගැයීමකට ලක් කිරීම ය. එය ද එහි ක්‍රියාත්මක භාවිතය සමග වඩා සමීප සබඳතා ඇති, එනම් පළාත් සභාවන්හි පරිපාලන හා තෝරා ගැනුණු නිලධරයන් දකින ආකාරයට ය. මෙම උත්සාහයේ ප්‍රතිඵලය වූයේ, බලය පැවරීමේ වැඩ පිළිවෙළේ සැබෑ ක්‍රියාකාරීන්ගෙන් එහි අසාර්ථක භාවයන් සහ සාර්ථක කර ගැනීමේ අවස්ථා ගැන ගැඹුරු විමර්ශන අධික ප්‍රමාණයක් මතුවීම ය. එහෙත් දහතුන්වන සංශෝධනය වශයෙන් නීතිමය ප්‍රකාශනයක් බවට පත් වූ බලය පැවරීමේ දේශපාලන ගැටලුවේ තාර්කික පදනම ගැන නැවත විමසා බැලීමක් අවශ්‍ය වේ. ගැටුම් නිරාකරණයට හා පුළුල් ප්‍රජාතන්ත්‍රවාදයට මාර්ගයක් ලෙස පවතින බලය බෙදා හදා ගැනීම පිළිබඳ පොදුවේ සංවාදයට ලක් ව තිබෙන ගැටලු සම්බන්ධයෙන් පුළුල් වටහා ගැනීම සඳහා ප්‍රයෝජනවත් වේ.

දහතුන්වන සංශෝධනයේ විවේචකයන් හා ඔවුන්ගේ මූලික තර්ක පුළුල් ලෙස දෙකොටසකට බෙදිය හැකි ය. දේශපාලන බලය සඳහා වාර්ගික - භෞමික ඉල්ලීම්වලට විසඳුමක් වශයෙන් බලය පැවරීම හා බල හවුල්කාරීත්වයට විරුද්ධ වන්නන් දක්වන්නේ, ව්‍යවස්ථා සංශෝධනයක් වශයෙන් ඉදිරිපත් වූ දේශපාලන හා නීතිමය ක්‍රියා පටිපාටිය මූලික වශයෙන් අසම්මත බව ය. ත්‍රස්තවාදය පිළිබඳ අභ්‍යන්තර ගැටලුවකට ඉන්දියාව මැදිහත්වීම, 1987 ආණ්ඩුවේ පාර්ලිමේන්තු බහුතරය භාවිත කිරීමේ සුජාතභාවය (එය 1982 ජනමත විචාරණයෙන් දික්කර ගැනුණකි) මගින් පහසුවෙන් ම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගැනීමත්, එයට සිංහල ජනතාව අතරින් නැගුණු විරෝධය මර්දනය කළ ආකාරයත් මෙහි දී ගෙනහැර දැක්විය හැකි ය. දහතුන් වන සංශෝධනය ආපසු හැරවිය

එය බලාත්මක කොට අවුරුදු විස්සකට පසු මෙම වැඩමුළුවලින් සිදුවූයේ දහතුන්වන සංශෝධනය විධිමත් ඇගැයීමකට ලක් කිරීම ය. එය ද එහි ක්‍රියාත්මක භාවිතය සමග වඩා සමීප සබඳතා ඇති, එනම් පළාත් සභාවන්හි පරිපාලන හා තෝරා ගැනුණු නිලධරයන් දකින ආකාරයට ය.



© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

නොහැකි එකක් බවට පත්වීමෙන් පසු ඒ ගැන ප්‍රකට විවේචනයක් වූයේ එය දූෂණයට සරුබිමක් වන බවත් එය අසාර්ථක දේශපාලනඥයන් ගේ ලැගුම්හලක් වශයෙන් දකිනු විනා වෙන සාධාරණ හේතුවක් එහි පැවැත්ම ගැන දක්විය නොහැකි බවත් ය. ඒ නිසා ම 'සුදු අලියා' යන ගැලපෙන උපමාවක් ද ඊට දක්වා ඇත.

ඊට ප්‍රතිවිරුද්ධ මතවාද දරන අයගේ තර්කය අනුව දහතුන්වන සංශෝධනය, මධ්‍යගත ඒකීය රාජ්‍ය ක්‍රමයකින් හටගත්, ප්‍රතිවිරෝධතා බහුල හා ව්‍යවස්ථානුකූලව එකිනෙකට නොගැලපෙන හා ප්‍රායෝගික නොවන නෛතික සැලැස්මක් බව ය. මේ අදහස අනුව බලය පැවරීම හා ප්‍රාදේශීය ස්වපාලනය අර්ථවත් වීමට නම් මධ්‍යයේ නිරන්තර මැදිහත්වීම්වලින් ආරක්ෂා විය යුතු ය. එවිට පමණක් එක්සත් රාජ්‍යයක බල පංගුකාරිත්වය ආරක්ෂා වනු ඇත. එහෙයින් එය සාර්ථක වීමට නම් දහතුන්වන සංශෝධනය පිහිටුවා ලූ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා විෂමතාව, මූලික වෙනසක් සඳහා විමර්ශනයට ලක් කළ යුතු ය. අවසාන දේශපාලන විග්‍රහයේ දී මෙම විචාරකයන් පැහැදිලිව පෙන්වා දෙන්නේ දහතුන්වන සංශෝධනයේ මූලික පරමාර්ථයම ඉටුවී නැති බවය. එනම්, උතුරු සහ නැගෙනහිර දෙමළ ජනතාව සමඟ සාමකාමීව බලය බෙදා හදා ගැනීමක් සිදු වී නැති බව ය.

සංසන්දනාත්මකව බලන විට තුන්වැනි වර්ගයේ අදහසක් වන්නේ ශ්‍රී ලංකාවේ එක්සත්භාවය සඳහා බලය බෙදා හදාගැනීම වෙනත් ආකාරයකින් විය යුතු ය යනුවෙන් දෙමළ ජනතාව දක්වන අදහස ය. එහි වර්තමාන ආදර්ශය වන්නේ එල්ටීටීය යි. ඉතා දැඩි ස්වරූපයේ බලය බෙදීමක් හෝ බල පංගුකාරිත්වයක් එමගින් ප්‍රතික්ෂේප කරනුයේ උතුරු නැගෙනහිර සඳහා ඔවුන් වෙනම රාජ්‍යයක් පිහිටුවීම කෙරෙහි කැපවී ඇති නිසා ය.

දහතුන්වන සංශෝධනය ක්‍රියාත්මක කිරීමේ දී දැනගත හැකි වූ යෝග්‍යතා, දුබලතා සහ අත්දැකීම් නිසා බලය බෙදා හදා ගැනීම සහ ප්‍රජාතාන්ත්‍රීය කරණය පිළිබඳ වඩා ගැඹුරු සංවාදයකට යා හැකි වුව ද, මෙම අවස්ථාවේ දී ඒ ගැන විභාග කිරීමක් අදහස් නොකරනු ඇත.

# 2.1 බලය බෙදීම පිළිබඳ දේශපාලන රාමුව

බලය පැවරීම හා ප්‍රාදේශීය ස්වපාලනය අර්ථවත් වීමට නම් මධ්‍යයේ නිරන්තර මැදිහත්වීම්වලින් ආරක්ෂා විය යුතු ය. එවිට පමණක් එක්සත් රාජ්‍යයක බල පංගුකාරිත්වය ආරක්ෂා වනු ඇත.

ව්‍යවස්ථාමය රාජ්‍ය ව්‍යුහයක් සඳහා තරග වැදීමේ ප්‍රභවය වූයේ ශ්‍රී ලාංකීය සමාජයේ වාර්ගික, සංස්කෘතික හා ආගමික විවිධත්වය යි. පොදුවේ නිදහසින් පසු ඉතිහාසය අනුව, සිංහල ජනතාව වැඩි ඇල්මක් දක්වූයේ ඒකීය රාජ්‍ය ක්‍රමයක් තුළ ප්‍රජාතන්ත්‍රවාදයකටය. සිය වැඩි සංඛ්‍යාව මගින් රාජ්‍ය බලය මෙහෙයවිය හැකි නිසා ය. ඊට පටහැනිව, සංඛ්‍යාවෙන් කුඩා වූ දෙමළ ජනතාව, සිංහල බහුතර ආධිපත්‍යය ගැන සැක පහළකොට සිය අයිතිවාසිකම් ආරක්ෂාව උදෙසා බලාපොරොත්තු වූයේ ද ව්‍යවස්ථා ව්‍යුහයේ වෙනස්කමකි. මෙම

© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

බලපෑම නිසා මධ්‍ය ආණ්ඩුව තුළින් බල පංගුකාරිත්වය පිළිබඳ අදහස් මතු විය (උදාහරණයක් ලෙස ජාතික ව්‍යවස්ථාදායකයේ සුළු ජාතීන් වෙනුවෙන් සමාන නියෝජනයක්). ෆෙඩරල්වාදය ද තවත් අදහසකි. 70 සහ 80 දශකය වන විට වෙනම රාජ්‍යයක් පිහිටුවීම දක්වා බලපෑම් සිදුවිය. 1980 දශකයෙන් පසු මෙම දේශපාලන කැලඹීම ප්‍රචණ්ඩ වාර්ගික ගැටුමක් හා සිවිල් යුද්ධයක් බවටත් පත්විය. මෙම වාර්ගික ගැටුම උග්‍රවීම නිසා එය ගෝලීය - දේශපාලන තත්වයකට පරිවර්තනය වූයේ ද මේ වකවානුවේ ය. කලාපීය සුපිරි බලවතා වූ ඉන්දියාව, මෙහි දී සක්‍රීය කොටසක් රඟ පෑවේ ය. එහි දී බොහෝ අවස්ථාවන්හි ශ්‍රී ලංකා රජයට එරෙහිව දෙමළ බෙදුම්වාදයට සහාය දුන් අතර හැසිරවීමේ පිළිවෙතක් වශයෙන් සීමිත සහයෝගයක් දෙමින් අනික් අතට එක්සත් ශ්‍රී ලංකාවක් සඳහා ව්‍යවස්ථාමය විසඳුමක් ඇති කිරීමට ශ්‍රී ලංකා ආණ්ඩුව හා දෙමළ ජාතිකවාදී කණ්ඩායම් අතර එකඟතාවක් උදෙසා සහාය දුන්නේ ය.

ඉහත සඳහන් වර්ගයේ ඉන්දීය මැදිහත්වීම් නිසා 1980 න් පසු සාකච්ඡා මාර්ගයෙන් විසඳුමකට පැමිණීමේ ක්‍රියා මාර්ග රැසක් ඇති විය. විශේෂයෙන් ම 1983 කළු ජූලියෙන් පසු, එහි ඉහළ ම උත්සාහය වූයේ 1985 තිම්පු සාකච්ඡා ය. එහි අවසාන ප්‍රතිඵලය වූයේ 1987 අගෝස්තු මාසයේ දී එම ගැටුමට විසඳුමක් වශයෙන් ඉන්දු ලංකා ගිවිසුමක් ඇති කිරීම ය.

# එම ගිවිසුමේ පරමාර්ථ මෙසේ ය.

1980 න් පසු සාකච්ඡා මාර්ගයෙන් විසඳුමකට පැමිණීමේ අවස්ථා රැසක් උදා විය. විශේෂයෙන් ම 1983 කළු ජූලියෙන් පසු, එහි ඉහළම උත්සාහය වූයේ 1985 තිම්පු සාකච්ඡා ය. එහි අවසාන ප්‍රතිඵලය වූයේ 1987 අගෝස්තු මාසයේ දී එම ගැටුමට විසඳුමක් වශයෙන් ඉන්දු ලංකා ගිවිසුමක් ඇති කිරීම ය.

1. ශ්‍රී ලංකාවේ එක්සත්භාවය, ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කර ගැනීම.
2. සියලුම රට වැසියන්ගේ සමානත්වය, ආරක්ෂාව සහ සමගිය ආරක්ෂා වන, බහු වාර්ගික, බහු භාෂාමය බහු විධ සමාජ සැලැසුමක් යටතේ සෑම ජන වර්ගයකම භාෂාමය හා විශේෂ සංස්කෘතික අනන්‍යතාවන් පෝෂණය කිරීම.
3. ශ්‍රී ලංකාවේ දෙමළ භාෂාව කතා කරන ජනතාවගේ ඓතිහාසික වාසස්ථාන ලෙස උතුරු නැගෙනහිර ප්‍රදේශ පිළිගැනීමට ලක්විය යුතු ය.

එහි පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවස්ථාවට සංශෝධනයක් වශයෙන් ආයතනික සැලැස්මක් යෝජනා කරනු ලැබුවේ ඉන්දීය ආර්ධ ෆෙඩරල් ක්‍රමය මත ගැලපීමක් නැතිව පදනම් වෙමිනි.


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# 2.2. දහතුන්වන සංශෝධනයේ ව්‍යුහාත්මක සැලැස්ම

1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් වූ උග්‍ර ඒකීය ස්වභාවය නිසා, බලය පැවරීම සම්බන්ධයෙන් ඊට බද්ධ වූ ව්‍යවස්ථාමය සැලැස්ම බෙහෙවින් සීමාවලට යටත් වූවක් විය (ඒ ගැන අත්දැකීම් තුන්වන පරිච්ඡේදයේ එයි). එසේ ම අර්ථාන්විත බලය පැවරීම යටපත් කරන්නක් ද විය. 1987 පැවති 2 SLR 312 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන නඩුවේ බහුතර විනිශ්චයකාර වරුන්ගේ අදහස වූයේ, 'පළාත් සභා යනු ජනාධිපතිට සහ පාර්ලිමේන්තුවට ද්විතීයික වශයෙන් පවතින්නක්' යනුවෙනි. බහුතර විනිසුරුවරුන් සිතුවේ, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 2 ව්‍යවස්ථාවෙන් ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයකි යි යන ප්‍රකාශය සමග ප්‍රතිසංන්ධානගත කළ හැකි එකම මාර්ගය එය බවය. දහතුන්වන සංශෝධනය පැහැදිලි කරන ව්‍යාවස්ථානුකූල ප්‍රතිපාදන (1987 අංක 42 දරන පළාත් සභා පනත) පවා ඒ හා සමානව සීමාවන්ට යටත් විය. මෙයින් පැහැදිලිව පිළිබිඹු කරන්නේ, බලය පැවරීමට විරුද්ධ වූ, දේශපාලන, නිලධරවාදී සහ නෛතික අවසංවේදී මානසික ස්වභාවය හෙවත් සැක මුසු ගතිය යි. බලය පැවරීමේ අවංක වුවමනාවක් නැති බව එයින් පැහැදිලි වේ.

බලය පැවරීමේ භෞමික ඒකකය වන්නේ පළාත ය. ශ්‍රී ලංකාවේ පළාත් නවයක් ඇත. කෙසේ වෙතත් ඉන්දු ලංකා ගිවිසුම සහ දෙමළ ජාතික වාදීන්ගේ ඉල්ලීම අනුව - උතුරු සහ නැගෙනහිර දේශපාලන වශයෙන් එකාබද්ධ කිරීමට තීරණය කෙරිණ. එය එසේ ක්‍රියාත්මක වූයේ නැගෙනහිර පළාතේ ජනමත විචාරණයකට යටත්ව, ජනාධිපති නියෝගයක් යටතේ ය. ජනමත විචාරණය මගින් ඒ පළාතේ වැසියන් විසින් එසේ ඒකාබද්ධ විය යුතු ද නැද්ද යනු තීරණය කරනු ලැබිය යුතු ය. 2006 වන තුරු මෙම ජනමත විචාරණය වාර්ෂිකව කල් තැබිණ. (විජේසේකර සහ තවත් අය එදිරිව නීතිපති සහ තවත් අය 2006 SC(FR) App. Nos 243/06, 244/06, 245/06, 2006 ඔක්. 16 ) 2006 දී උතුරු නැගෙනහිර ඒකාබද්ධව සැලකීමේ ජනාධිපති නියෝගය ශ්‍රේෂ්ඨාධිකරණය බලරහිතය යි තීන්දු කළේ ය. ඒ අනුව ඒ පළාත් දෙකක් වශයෙන් සැලකිණ. 2008 මැයි මාසයේ දී නැගෙනහිර පළාත් සභාවට මැතිවරණයක් පැවැත්විණ.

දහතුන්වන සංශෝධනය ක්‍රියාත්මක කිරීමත් සමඟ ව්‍යවස්ථාදායක සහ විධායක බලය පළාත් සභා අටකට පැවරිණ. එම පළාත් සභා අනුපාතික ඡන්ද ක්‍රමය යටතේ තෝරා ගැනිණ. පළාත් සභාවක විධායක බලය ජනාධිපති විසින් පත්කරනු ලබන ආණ්ඩුකාරවරයාට පැවරේ. විශේෂ අවස්ථාවන්හි දී හැර එම විධායක බලය ආණ්ඩුකාරවරයා විසින් භාවිත කළ යුත්තේ මහ ඇමතිවරයාගේ උපදෙස් අනුව ය. මහඇමතිවරයා ආණ්ඩුකාරවරයා විසින් පත්කරනු ලබන්නේ, බහුතර මන්ත්‍රීන්ගේ සහාය ලබන තැනැත්තා ලෙස ය. පළාත් සභාවක් මහ ඇමතිවරයාගෙන් ද තවත් ඇමතිවරුන් හතර දෙනකුගෙන් ද සමන්විත වේ. ප්‍රාදේශීය මූල්‍ය පාලනය පැවරෙන්නේ ද ආණ්ඩුකාරවරයාට ය.

පළාත් සභාවක විධායක බලය ජනාධිපති විසින් පත්කරනු ලබන ආණ්ඩුකාරවරයාට පැවරේ. විශේෂ අවස්ථාවන්හි දී හැර එම විධායක බලය ආණ්ඩුකාරවරයා විසින් භාවිත කළ යුත්තේ මහ ඇමතිවරයාගේ උපදෙස් අනුව ය. මහඇමතිවරයා ආණ්ඩුකාරවරයා විසින් පත්කරනු ලබන්නේ, බහුතර මන්ත්‍රීන්ගේ සහාය ලබන තැනැත්තා ලෙස ය.

© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

බලය පැවරෙන කරුණු වශයෙන් විෂය ලැයිස්තු තුනක් දක්වේ. පළාත් සභා ලැයිස්තුව, සංවෘත ලැයිස්තුව (එය මධ්‍යම ආණ්ඩුවට සීමා වී ඇත) සමගාමී ලැයිස්තුව වශයෙනි. සමගාමී ලැයිස්තුවේ ඇති ඕනෑම විෂයයක් සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුවේ බල පවත්නා නීතිය පළාත් සභා ප්‍රඥප්ති ඉක්මවා යයි. සංවෘත ලැයිස්තුව මගින් මධ්‍යම ආණ්ඩුවට බලය පැවරීම යටපත් කිරීමට බලය ඇත. ඒ සියලුම විෂයයන් ගැන ජාතික ප්‍රතිපත්ති' සැකැසීමේ ආකාරයෙනි. සියලු අවශේෂ බලය පැවරෙන්නේ මධ්‍යම ආණ්ඩුවට ය.

දහතුන්වන සංශෝධනය මගින් සෑම පළාතකට ම මහාධිකරණයක් බැගින් පිහිටුවන ලදි. ඊට මුල් අධිකරණ බලය ඇතුළුව අපරාධ සම්බන්ධ අභියාචන, ප්‍රතිශෝධන හා අධිකරණ බලය ද ඇත්තේ ය. පළාත් සභා විෂයයක් සම්බන්ධ රිට් ආඥා නිකුත් කිරීමේ බලය ද පැවරේ.

# වැඩමුළු සාකච්ඡා : ප්‍රධාන තේමා

වැඩමුළු මාලාවේදී සැලසුම් කරන ලද සාකච්ඡා මගින් සහභාගිවූවන් විසින්, බලය පැවරීමේ දහතුන් වන සංශෝධනයේ ව්‍යුහය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පළාත් වශයෙන් ඇතිවන ප්‍රායෝගික අත්දැකීම් ඇසුරෙන් එහි අභියෝග සහ ඒවාට විසඳුම් ද, විකල්පයන් ද හඳුනා ගැනීමට සලසන ලදි. එම අභියෝග ජය ගැනීමට යෝජිත විසඳුම් ක්‍රියාත්මක කිරීමේ හෙවත් වෙනස්කම් කිරීමේ මාර්ග ද හඳුනා ගන්නා ලෙස යොමු කරන ලදි.

මෙම අභ්‍යාසයේ දී මතු වූ අදහස් හා ගැටලු සම්භාරය, පළාත් වශයෙන් ස්වභාවික ලෙස ම විවිධ විය. එම විවිධත්වයට පදනම් වූයේ, ආර්ථික සංවර්ධනය සම්බන්ධ පළාත්වල අසමානතාව; සාපේක්ෂක දිළිඳුකම හා සශ්‍රීකත්වය, ජනගහනය, ජනගහන ව්‍යාප්තිය හා වාර්ගික සංයුතිය; පළාත්වල අවශ්‍යතා සහ මනාපකම්; ප්‍රතිපත්තිමය අභියෝග සහ ප්‍රමුඛතා; මධ්‍යම ආණ්ඩුව සමඟ ඇති දේශපාලන සබඳතා; ඒ ඒ පළාත් ආර්ථිකයේ ආංශික හා කාර්මික ආකෘතිය ආදියයි.

පළාත් සභාවලට අනන්‍ය වූ ගැටලු හා විසඳුම් විවිධාකාර වෙතත් එම ගැටලුවල පොදු බවක් ද ඇත. මේ තත්ත්වය නිසා පළාත් සභාවලට බලය පැවරීම සාර්ථක ව කළ හැකි ය. එම ගැටලු තේමා වශයෙන් පහත සඳහන් පරිදි දක්විය හැකි ය.

- ව්‍යවස්ථාමය ගැටලු : දහතුන්වන සංශෝධනය යටතේ බලතල බෙදාහැරීම.
- දේශපාලන හා පරිපාලනමය ගැටලු : මධ්‍යගත කිරීමේ සංස්කෘතිය
- පොදු ආදායම් හා මූල්‍යමය ගැටලු : ව්‍යුහාත්මක දුර්වලතා සහ ප්‍රායෝගික අත්දැකීම්
- ප්‍රාදේශීය ආණ්ඩුකරණය : ව්‍යුහාත්මක සහ දේශපාලන ගැටලු
- කුසලතා ගැටලු : මානව සම්පත් හා පරිපාලන යෝග්‍යතා

දහතුන්වන සංශෝධනය මගින් සෑම පළාතකට ම මහාධිකරණයක් බැගින් පිහිටුවන ලදි. ඊට මුල් අධිකරණ බලය ඇතුළුව අපරාධ සම්බන්ධ අභියාචන, ප්‍රතිශෝධන හා අධිකරණ බලය ද ඇත්තේ ය. පළාත් සභා විෂයයක් සම්බන්ධ රිට් ආඥා නිකුත් කිරීමේ බලය ද පැවරේ.


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

- නෛතික ගැටලු : නීතියේ ආධිපත්‍යය යටතේ බලය පවරා දීම

- පළාත් සුළුතර ජාතීන් සහ භාෂා ගැටලු : පළාත් සභාවල කාර්ය භාරය සහ හැකියාව

- ප්‍රාදේශීය සිවිල් සමාජය : සහභාගිත්වය, ප්‍රතිචාර දක්වීමේ ස්වභාවය, වගකීම්භාරය

සමස්තයට ම අදාළ වන සේ, මේ උපශීර්ෂයන් ප්‍රධාන තේමාවන් දෙකකට වෙන් කළ හැකි ය. පළමුව, දහතුන් වන සංශෝධනයෙන් දක්වෙන විශේෂ ව්‍යවස්ථා සැලැස්මට සම්බන්ධ ව්‍යුහාත්මක ගැටලුවක් පවතී. සමගාමී ලැයිස්තුව මගින් බලය බෙදීමේ ක්‍රියා පිළිවෙළ මූලික වශයෙන් ම ව්‍යවස්ථාමය ගැටලුවකි. එසේම මූල්‍ය හා පරිපාලන ගැටලු ද එම ක්‍රියා පිළිවෙළෙන් ම ඇතිවන ඒවා ය. දෙවනුව, දේශපාලන හා නිළධරවාදී භාවිතයන් මෙන්ම අධිකරණයේ ආකල්පයන් ද ව්‍යවස්ථාවෙන් ඇති කළ ව්‍යුහයන් කෙරෙහි නිශ්චිත බලපෑම් කරන අතර ඊට අර්ථයන් ද ලබා දෙන බව පැහැදිලි ය. මේ අයුරින් ව්‍යවස්ථා කෙටුම්පත් කරන අයගේ බලය බෙදීමේ සැලැස්මට පටහැනිව, නිලධර සංස්කෘතිය විසින් මධ්‍යගතවාදය උනන්දු කරවමින් ව්‍යවස්ථා සැලසුම් යටපත් කළ හැකි ය. එහි අනික් පැත්තද සත්‍යය. එනම්, මධ්‍යගත ආයතන ව්‍යුහයන් භාවිතයේ දී අධික ලෙස විමධ්‍යගත ස්වරූපයෙන් ක්‍රියාත්මක විය හැකි ය. එසේ වන්නේ නිලධර සංස්කෘතියේ සහ මහජනයාගේ බලාපොරොත්තුවල බලපෑම් නිසා ය. මෙම තේමා දෙක ඉහත උප ශීර්ෂ වශයෙන් ගොනු කළ තේමාවන්ට මෙන්ම, මතුවට කරන සාකච්ඡාවලට ද අදාළ වේ.

## 3.1 ව්‍යවස්ථාමය ගැටලු : දහතුන්වන සංශෝධනය යටතේ බලය බෙදාහැරීම

> දහතුන්වන සංශෝධනය ඒකීය රාජ්‍යය පිළිබඳ සංකල්පයට ගැලපෙන බවට ඒ පිළිබඳ නඩුවේදී බහුතර විනිශ්චයකාරවරුන් විසින් දැක් වූ පටු අර්ථ නිරූපනයත් නිසා පළාත් සභා බලතල භාවිතය පටන් ගත්තේ ම බලවත් දෙගිඩියාවකිනි.

කලින් සාකච්ඡා කළ පරිදි, අර්ථාන්විත බලය පැවරීමකට ඇති ප්‍රධාන විලංගුව වන්නේ, ඒකීය රාජ්‍යයක පවතින සීමාකාරී සැලසුම් යටතේ ක්‍රියාකාරීවීමට සැලසීම වේ. මෙහි එක් අංශයක් වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 76(1) ව්‍යවස්ථාව ය. එයින් කියන්නේ ජාතික පාර්ලිමේන්තුව විසින් එහි ව්‍යවස්ථාදායක බලය අත්හැරීම හෝ කිසිම ආකාරයකින් අත්හැරීම හෝ නොකළ යුතු බවත්, ව්‍යවස්ථාදායක බලය ඇති අනෙක් කිසිදු ආයතනයක් නොපිහිටුවිය යුතු බවත් ය. මෙය 154(ඖ) ව්‍යවස්ථාව සමඟ නොගැලපේ. එයින් නීති හැදීමේ බලය පළාත් සභාවලට පැවරෙන නිසා ය. මේ සීමා කිරීම් යටතේ ක්‍රියා කිරීමත්, දහතුන්වන සංශෝධනය ඒකීය රාජ්‍යය පිළිබඳ සංකල්පයට ගැලපෙන බවට ඒ පිළිබඳ නඩුවේදී බහුතර විනිශ්චයකාරවරුන් විසින් දැක් වූ පටු අර්ථ නිරූපනයත් නිසා පළාත් සභා බලතල භාවිතය පටන් ගත්තේ ම බලවත් දෙගිඩියාවකිනි. ගැටුමක දී එය විසඳිය හැකි වන්නේ මධ්‍යම ආණ්ඩුවේ වාසියට ය. තවත් අදහසක් පවතී. එනම් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, අසීමිත ලෙස විධායක බලය දරන ජනාධිපති විසින් විධායක බලය මධ්‍යගත කිරීම (ඒ අතර අවස්ථා

© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

බෙදා හැරීමට උපදෙස් දෙයි) බලය පැවරීමේ බුද්ධිමත් ක්‍රමයකට පටහැනි ය.

බලය පැවරීමකට හා ප්‍රාදේශීය ස්ව පාලනයකට ඇති ප්‍රධාන බාධකයක් වන්නේ සමගාමී ලැයිස්තුව යි. සමගාමී ලැයිස්තුවේ අංකිත විෂයයන් සම්බන්ධ ව්‍යවස්ථාදායක හා විධායක බලය ව්‍යවස්ථාවෙන් ම සහතික කර ඇති පරිදි මධ්‍යය හා පළාත් විසින් හවුලේ භාවිත කළ යුතුව ඇතත් ව්‍යවස්ථාවේ ම වෙනත් ප්‍රතිපාදන (එනම් 76 ව්‍යවස්ථාව හා වඩාත් නිශ්චිතව 154(ඔ) ව්‍යවස්ථාව මගින් පළාත් ව්‍යවස්ථාව අභිබවා නීති සම්පාදනය කිරීමේ බලය පැවරේ.) මෙන්ම මධ්‍යම ආණ්ඩුවේ දශක දෙකකට වැඩි භාවිතය මගින් සමගාමී ලැයිස්තුවේ බලය පළාත්වලට භාවිත කළ නොහැකි දෙයක් බව සහතික වී තිබේ.

සමගාමී ලැයිස්තුව අනිසි ලෙස භාවිත කිරීම ගැන නිදසුන් බොහෝ ය. අධ්‍යාපන විෂය පිළිබඳ භාවිතය ඉතා ප්‍රකට ය. පළාත් ලැයිස්තුවේ උප ලේඛන III හි 3 වන කරුණෙහි, අධ්‍යාපනය හා අධ්‍යාපන සේවා පළාත් විෂයයක් ලෙස දැක් වේ. සමගාමී ලැයිස්තුවේ 2 හා 3 යටතේ, අධ්‍යාපනය හා අධ්‍යාපන සේවා සමගාමී විෂයයක් ද වේ. කෙසේ වෙතත් මෙම ප්‍රතිපාදන මගින් අධ්‍යාපනය සමගාමී වන්නේ උපලේඛන III හි පළාත් සභා ලැයිස්තුවෙන් ඉඩ දී ඇති ප්‍රමාණයටය යනුවෙන් ද සඳහන් කොට අධ්‍යාපනය යටතේ මෙසේද පවසයි. විශේෂිත පාසල් නොවන සියලු රාජ්‍ය පාසල්වලට පහසුකම් සැපයීම පළාත් විෂයකි. මෙම 'විශේෂ පාසල්' යනු විස්තර කර ඇත්තේ 'ජාතික පාසල්' වශයෙනි. එමගින් එම පාසල් මධ්‍යම ආණ්ඩුවේ පාලනයට යටත් වේ. මේ 'ජාතික පාසල්' යනු අර්ථ නිරූපනය කර නැත. කෙසේ වෙතත් එහි ප්‍රතිඵලය වී ඇත්තේ, පළාත් බලසීමාව තුළ පිහිටි රාජ්‍ය පාසල් ආණ්ඩුවේ පාලනය යටතට ගැනීමට මෙම ප්‍රතිපාදන භාවිත කර ඇත්තේ, විමසා බැලීමක්, දැනුම් දීමක් හෝ යුක්ති සහගත බව ඔප්පු කිරීමකින් තොරව ය.

පළාත් බලය ඒ අයුරින් ම පැහැර ගැනුණු අනෙක් විෂයයන් වන්නේ රෝහල්, ගොවිජන සේවා, ජල සම්පත්, පතල් හා ඛනිජ ද්‍රව්‍ය සම්බන්ධයෙනි. තවද දේශපාලන වශයෙන් වැදගත් වූ සංවර්ධන ව්‍යාපෘති එනම් 'මග නැගුම', 'ගම නැගුම', 'නැගෙනහිර නවෝදය' සහ 'දස දහසක් වැව්' ආදී වැඩ සටහන් පළාත් කටයුතු සමඟ ගැටෙයි.

එසේම පළාත් මහාධිකරණ පිහිටුවීමත් සමඟ සමහර අධිකරණ බලතල 154(ඔ) ව්‍යවස්ථාව මගින් පවරා දීමත් සමඟ පැවරිණ. එහෙත් ඉන් පසුව වානිජ මහාධිකරණය කොළඹ පිහටුවීමෙන් යම් වටිනාකමකට වැඩි නඩු පිළිබඳ බලය සහ පළාත් අධිකරණවලින් නඩු මාරු කිරීමට අග විනිසුරුට ඇති බලයත් නිසා බලය පැවරීමේ මූලධර්ම උල්ලංඝනය වේ.

සමගාමී ලැයිස්තුව නිර්මාණයේ දෝෂයක් වන්නේ සංවෘත ලැයිස්තුවේ සඳහන් 'සියලු විෂයයන් හා ක්‍රියාකාරකම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය' යන ප්‍රතිපාදනයයි. එ මගින් මධ්‍යම ආණ්ඩුවට, පළාත් විෂයයන් කෙරෙහි පවා අසීමිතව ව්‍යවස්ථාදායක සහ විධායක බලය පැවරේ. එය ද බලය පැවරීමේ ප්‍රතිපත්තියට පටහැනි ය. නිදසුනක් වශයෙන් පාර්ලිමේන්තුව විසින් ගොවිජන සේවා පනත අංක 4, 1991 දී සංශෝධනය කිරීමට මේ ප්‍රතිපාදනය භාවිත කර ඇත. එය

පළාත් බලය ඒ අයුරින් ම පැහැර ගැනුණු අනෙක් විෂයයන් වන්නේ රෝහල්, ගොවිජන සේවා, ජල සම්පත්, පතල් හා ඛනිජ ද්‍රව්‍ය සම්බන්ධයෙනි. තවද දේශපාලන වශයෙන් වැදගත් වූ සංවර්ධන ව්‍යාපෘති එනම් 'මග නැගුම', 'ගම නැගුම', 'නැගෙනහිර නවෝදය' සහ 'දස දහසක් වැව්' ආදී වැඩ සටහන් පළාත් කටයුතු සමඟ ගැටෙයි.


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

බලය පැවරීම සඳහා හානිකර ලෙස බලපායි. තවද 1991 අංක 37 දරන ජාතික ප්‍රවාහන කොමිසම් පනත ද, දහතුන් වන සංශෝධනයෙන් පැවරුණු පළාත් සභාවල මහා මාර්ග ප්‍රවාහන බලතලවලට පටහැනි වේ.

මෙම විශේෂ අවස්ථා දෙකට අමතරව, විෂයයන් හා බලතලවල බෙදීම සම්බන්ධයෙන් ව්‍යවස්ථාවේ නොපැහැදිලිකම දැක්විය හැකි ය. මෙහි ප්‍රතිඵලය වූයේ, වගකීම් පිළිබඳ ගැටුම්, බලතල හා සම්පත්, සේවාවන් හැකිලීම, ජාතික හා පළාත් තෝරාපත් කරන ලද නිලධරයන් අතර ඇති දේශපාලන ගැටුම් ආදියයි. (විශේෂයෙන් ජාතික පාර්ලිමේන්තු සාමාජිකයන්, පළාත් සභා තමන්ගේ බලතල ආක්‍රමණය කරන බවට අදහස් දක්වා ඇත.) එසේම පළාත් ව්‍යවස්ථා සහ ප්‍රතිපත්ති තීරණය කිරීම් කෙරෙහි ගරුත්වයක් නොදැක්වීමේ ආකල්පයක් ද පෙන්වා ඇත. මධ්‍යගතකරණයේ දේශපාලන සංස්කෘතිය යටතේ මෙවැනි ආරවුල් විසඳෙන්නේ බොහෝ විට මධ්‍යයේ ආයතනවල සහ ජාතික මට්ටමේ දේශපාලකයන්ගේ වාසිය පිණිස ය. මෙයින් සිදුවන්නේ පළාත්වල බලතල භාවිතය නිෂේධනයවීම ය. පළාත් නිලධරයන්ගේ සහ දේශපාලකයන්ගේ චිත්ත ධෛර්යය සහ ආරම්භක ශක්තිය හානියට පත්වීම සිදුවේ. පළාත් ස්වාධිකාරිත්වය එයින් යටපත් වේ.

ව්‍යවස්ථාමය වැදගත්කම පිළිබඳ තවත් ගැටලුවක් වන්නේ පළාත් පාලන තලය සම්බන්ධයෙනි. ජාතික සහ පළාත් පාලන තලයන් කෙරෙහි බලය පවරාදීම අසම්පූර්ණ හා නොපැහැදිලි බවට හැඟීමක් ඇත. ඍජු පරිපාලන, මූල්‍ය සහ දේශපාලන සබඳතා පැවතීම පළාත් මට්ටමේ ස්වපාලනයකට හානිකර වන්නේ ය.

මේ තත්ත්වය ප්‍රාදේශීය ලේකම් වැඩිදුරටත් අවුලට පත් කරනු ලබයි. එමගින් මධ්‍යම ආණ්ඩුව (ජනාධිපති බලය දීර්ඝ කිරීමක් වශයෙන්) පළාත් සභා සහායක් නැතිව <u>බලතල මාරුකිරීම</u> 1992 අංක 58 (ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල) පනත යටතේ බලතල පැවරීම මඟින් ගම් මට්ටමින් ඍජුව ක්‍රියාත්මක වේ. මෙම නිලධරයෝ පළාත් සීමාව තුළ පළාත් බලධරයන්ගේ පාලනයක් හෝ අධීක්ෂණයක් නැතිව පරිපාලන ක්‍රියා සිදුකරති.

1992 අංක 58 දරන ප්‍රාදේශීය මහලේකම් කාර්යාල පනත යටතේ විධායකයේ බලය මත පළාත් සභාවේ පාලනයක් නොමැතිව එම නිලධාරීන් කටයුතු කිරීම පළාත් සභා සක්‍රීය කිරීමට බාධාවක් ව පවතී. ව්‍යවස්ථා සංශෝධනයක දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන කෙරෙහි යොමුවිය යුතු වුව ද ඒ සම්බන්ධයෙන් නිසි සැලකිල්ලක් දක්වා නැත. නිදසුනක් ලෙස 17 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ ස්වාධීන ජාතික පොලිස් කොමිසම පිහිටුවීමේ දී 154ඔ (37 ව්‍යවස්ථාව යටතේ ඇති ක්‍රියා පටිපාටිය අනුගමනය කළ හැකිව තිබිණ. මක් නිසා ද, මෙය උප ලේඛන I යටතේ වූ පළාත් ලැයිස්තුවේ පොලිස් බලතල කෙරෙහි බලපෑමක් කරන හෙයිනි. 17 වන සංශෝධනය සම්බන්ධයෙන් මේ ක්‍රියාපටිපාටිය නොයෙදිණ.

1992 අංක 58 දරන ප්‍රාදේශීය මහලේකම් කාර්යාල පනත යටතේ විධායකයේ බලය මත පළාත් සභාවේ පාලනයක් නොමැතිව එම නිලධාරීන් කටයුතු කිරීම පළාත් සභා සක්‍රීය කිරීමට බාධාවක් ව පවතී.

# 3.2 දේශපාලන හා පරිපාලන ගැටලු : මධ්‍යගතකරණයේ සංස්කෘතිය

ව්‍යවස්ථා සැලැස්මේ බලය පැවරීම ගැන පවතින දුබලතා අධික කෙරෙමින් මධ්‍යගතකරණය පිළිබඳ පැතිර යන නිල සංස්කෘතිය වැඩිපුර භාවිත කරනුයේ දේශපාලඥයන්, සිවිල් සේවකයන් සහ ජාතික මට්ටමේ උසාවි විසින් ය. සමගාමී ලැයිස්තුව, ජාතික ප්‍රතිපත්ති වගන්තිය සහ මධ්‍යම ආණ්ඩුවට හිතවාදී උසාවි භාවිතය මගින් පවරා දෙන ලද බලතල ආපසු ගැනීමට අමතරව, පළාත්වල ස්ව පාලනය යටපත් කරන වෙනත් ලක්ෂණ ද මතු වී පෙනේ.

පවරා දෙනු ලැබූ ක්‍රියාකාරිත්වයන් හා බලතල බව පැහැදිලිව පෙනෙද්දීත්, පොදු පරිපාලනය හා නීති පැනවීම පිළිබඳ පුළුල් ක්ෂේත්‍රයට මධ්‍යයේ මැදිහත්වීම ගැන අදහස් විමසීමක් හෝ සම්බන්ධීකරණයක් හෝ සාමාන්‍යයෙන් නොපවතී. ව්‍යවස්ථා පැනවීමේ ක්‍රියාවට අමතරව, පරිපාලන තීන්දු ගැනීමේ ක්‍රියාවේ දී පවා මෙම ආකල්පය ජාතික සිවිල් නිළධරයන් වෙත ප්‍රකටව පෙනේ. පළාත්වල අවශ්‍යතා, තෝරා ගැනීම් හා අදහස් ප්‍රතික්ෂේප කිරීමේ ආකල්පය දක්වේ. විශේෂයෙන් මධ්‍යයේ කළමනාකරණ මණ්ඩලයේ චක්‍රලේඛවලින් ද, අනුයුක්ත නිළධරයන් පිළිබඳ විනය පාලනයෙන් ද මේ බව ඔප්පුවේ. එහිදී පළාත් අභිලාෂයන් නොතකා මධ්‍යය ක්‍රියා කර ඇත. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ චක්‍ර ලේඛවලින් පළාතේ අවශ්‍යතා හා තත්ත්වයන් ගැන කිසිම අවබෝධයක් ඇති බව නොදක්වේ. එසේම පරිපාලන චක්‍ර ලේඛ මගින් අමාත්‍යාංශවල බල ක්ෂේත්‍රය පුළුල් කර ගැනීමේ ක්‍රියාවද සිදුවේ. බලය බෙදීම සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛයන්හි බලපෑම පාර්ලිමේන්තු නිරීක්ෂණයෙන් බැහැර වන අතර අධිකරණ විමර්ශනයකට යොමු වන්නේද කලාතුරකිනි.

ඊට සම්බන්ධ වන තවත් ගැටලුවක් වන්නේ මධ්‍යයේ විධායක අංශයේ ව්‍යුහාත්මක සංවිධානයයි. එය අමාත්‍යාංශ සම්බන්ධයෙන් වන විට මුළු මනින් ම ජනාධිපතිගේ දේශපාලන අභිමතයට යටත් ය. උදාහරණයක් ලෙස, ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශයේ ගැසට් මගින් ප්‍රකාශිත විෂයයන්, බලය බෙදුණු විෂයයන් ගැන පළාත් ස්ව පාලනය උග්‍ර ලෙස උල්ලංඝනය කරයි. ගංගා නිම්න අධිකාරියේ අලුත් මධ්‍යම දෙපාර්තමේන්තු පිහිටුවීම කර ඇත්තේ එක්කෝ පළාත් ස්වපාලනය නොසැලකීමෙන් සහ පළාත් ලැයිස්තුව ගැන දැනුමක් නැතිව ය. එසේ නැතිනම් පළාත් බලතල මධ්‍යයට ඇදීමට සිතා මතා ය. ඒ ආකාරයට ම, මධ්‍යම ආණ්ඩුව, විදේශ ආධාර මත ඇති කළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමද සිය ග්‍රහණයට ගත්තේ ය. එහි දී ඒවා ක්‍රියාත්මක කිරීමට බලතල හා හැකියාව පළාත් සභාවලට ඇද්දැයි කිසිම සොයා බැලීමක් නොකරන ලදි. දේශපාලන වශයෙන් වැදගත් වූ 'ගම නැගුම', 'මග නැගුම', 'නැගෙනහිර උදානය' හා 'දස දහසක් වැව්' පිළිබඳ ව්‍යාපෘතිවල තත්වයද එසේම ය. ජාතික මට්ටමේ දේශපාලනකයන්ට මෙම ව්‍යාපෘතිවල දේශපාලන

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ චක්‍ර ලේඛවලින් පළාතේ අවශ්‍යතා හා තත්ත්වයන් ගැන කිසිම අවබෝධයක් ඇති බව නොදක්වේ. එසේම පරිපාලන චක්‍ර ලේඛ මගින් අමාත්‍යාංශවල බල ක්ෂේත්‍රය පුළුල් කර ගැනීමේ ක්‍රියාවද සිදුවේ. බලය බෙදීම සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛයන්හි බලපෑම පාර්ලිමේන්තු නිරීක්ෂණයෙන් බැහැර වන අතර අධිකරණ විමර්ශනයකට යොමු වන්නේද කලාතුරකිනි.


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

වාසිය ලබාගත හැකි ය. එය එසේ සිදුවන්නේ මධ්‍යගතකරණය සඳහා වූ මෙම දේශපාලන සංස්කෘතිය පවත්වා ගැනීමට ය. ඡන්ද දේශපාලනයේ ප්‍රජාතන්ත්‍රවාදී තර්කය ද මේ සඳහා ගොඩ නගා ඇත.

මේ සම්බන්ධයෙන් තවත් වැදගත් සාධකයක් වන්නේ දේශපාලන පක්ෂවල සංවිධාන සැලැස්ම හා සංස්කෘතියයි. මෙය බෙහෙවින් ම නායකත්වය වටා ඇති වේ. ආධාර උපකාර මත රඳා පවතින අතර කිසිසේත් පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදයට සම්බන්ධයක් නැත. පළාත්වලට බලය බෙදීම ගැන වූ ව්‍යවස්ථා සැලැස්ම ගැන වැඩි සැලකිල්ලක් නොදක්වේ. පළාත් මට්ටම සැලකෙන්නේ ජාතික දේශපාලනයට නැගීමට ඇති පියගැටයක් ලෙස ය. එහි දේශපාලන වටිනාකම ගණනකට නො ගැනේ. මේ හේතුව නිසා පළාත් මට්ටමේ බැගෑපත් බවක් හා නොගැලපෙන බවක් පිළිබඳ හැඟීම ඇත. දක්ෂතා ඇති අය මධ්‍යම ආණ්ඩුව දෙසට ම ආකර්ෂණය වෙති. පළාත් ආයතන හෝ මහ ජනතාව කෙරෙහි එතරම් විශ්වාසයක් ගැන සිවිල් සේවයට ද ඇත්තේ එම උෟරුවම ය.

මෙම සන්දර්භය තුළ සීමිත ප්‍රමාණයකට පවා (සැලැස්මක් වශයෙන් අඩු පාඩු ඇතිව) දහතුන්වන සංශෝධනයෙන් පැවරී ඇති බලතල වටහා ගැනීම අපහසු ය. මක් නිසාද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සලසා ඇති ප්‍රතිපාදනත්, ඒවා ක්‍රියාත්මක කිරීමත් අතර පවතින බරපතල අසමානතාව නිසා ය.

# 3.3 ආදායම් හා මූල්‍ය ගැටලු : ව්‍යුහාත්මක දුබලතා සහ ප්‍රායෝගික අත්දැකීම්

දහතුන්වන සංශෝධනය ගැන පළාත් දැක්ම අනුව එන මූලික විවේචනය වන්නේ එහි ආදායම් හා මූල්‍ය සැලසුම සම්බන්ධයෙනි. එය සියලුම පළාත්වල ඒකාන්ත අත්දැකීම වේ.

මූල්‍ය බලය බෙදීම ගැන පවතින විශේෂ සැලැස්ම ව්‍යුහාත්මක වශයෙන් සම්පූර්ණ නැත. එනිසා එය භාවිතයෙන් තහවුරු කළ නොහැකි ය. එයින් පළාතට හිමි බලය බාල්දු කෙරේ.

දහතුන්වන සංශෝධනය ගැන පළාත් දැක්ම අනුව එන මූලික විවේචනය වන්නේ එහි ආදායම් හා මූල්‍ය සැලසුම සම්බන්ධයෙනි. එය සියලුම පළාත්වල ඒකාන්ත අත්දැකීම වේ. මූල්‍ය බලය බෙදීම ගැන පවතින විශේෂ සැලැස්ම ව්‍යුහාත්මක වශයෙන් සම්පූර්ණ නැත. එනිසා එය භාවිතයෙන් තහවුරු කළ නොහැකි ය. එයින් පළාතට හිමි බලය බාල්දු කෙරේ.

මෙම ව්‍යුහය විසින් පළාත් සභාවන්ට හිමි ආදායම් ගොඩනැගීමේ හැකියාව සීමා කරනු ලබයි. පළාත්වලට පැවරෙන බදු ඇති කිරීමේ සීමිත බලය සමග ආදායම් බදු එකතු කිරීමේ බලයට ද සීමා පනවා ඇත. ණය ගැනීම සහ ආයෝජනය, විදේශාධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘති පාලනය හා ආයෝජනය ගැන එම සීමා ක්‍රියාත්මක වෙයි. (පළාත් ලැයිස්තුවේ විෂයයන් ගැන) පළාත් බලතල නිවැරදි නොකළ වියදම් වගකීම් පැවරීමේ දී ව්‍යවස්ථාවෙන්, ඊට අදාළ ප්‍රමාණවත් ක්‍රියාමාර්ග හා කොන්දේසි ගැන විස්තර කර නැත. මධ්‍යම ආණ්ඩුවේ දීමනා මත පැවතීම යුක්ති සහගත කළ

© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

හැක්කේ වියදම් වගකීම් නිදහස් කිරීමට සෑහෙන සම්පත් ලැබෙන්නේ නම් පමණි. මෙය සිදු විය යුත්තක් නොවේ. මෙසේ වුවහොත් සිදුවන්නේ පුනරාවර්තන වියදම් එම වර්ෂය තුළ ගෙවීමට නොහැකිවීමෙන් පළාත් සභා බලවත් අපහසුතාවයට පත්වනු ඇත. (ඉතිරි කිරීම් හා ආයෝජන ඇතුළු) මූල්‍ය තීරණ ගැන පළාත් විධානවලට ඇත්තේ ඉතා සුළු බලයකි. එම අවස්ථාව වඩාත් උග්‍ර කරනුයේ (ජනාධිපති නියෝජිතයා වූ) ආණ්ඩුකාරවරයාට පළාත් මූල්‍ය කටයුතු ගැන අසාමාන්‍ය පුළුල් බලතල පවරා තිබීමෙනි. එමගින් ආණ්ඩුකාර වරයා පළාතේ මුදල් ඇමතිවරයාට සමාන වේ.

අවිධිමත් ලෙස, මෙම දෝෂ සහිත හා අප්‍රායෝගික සැලැස්ම යටතේ ඇති වූ පරිපාලන භාවිතයන් මගින් පළාත් සභාවල යහපත් මූල්‍ය පැවැත්ම වැඩි දුරටත් හිස් බවට පත්කර තිබේ. (සුළු බදු සඳහා වූ) බදු අනුපාතය වෙනස් කිරීමේ සීමිත ව්‍යවස්ථාපිත බලය පවා භාණ්ඩාගාරය විසින් පළාත්වලට තවත් සීමාකොට ඇත. මූල්‍ය කොමිසමේ තීරණ බලාත්මක නොවන නිර්දේශාත්මක ඒවා ලෙස සැලකීම භාණ්ඩාගාරයේ ස්ථාවරය වී ඇත. එහි ප්‍රතිඵලය වන්නේ, කොමිසමෙන් නිර්දේශ කරන මුදල් පවා නියමිතව පළාත්වලට නොයැවීම ය. එසේ යැවෙන මුදලින් පවා මූල්‍ය සේවා ගාස්තුව වශයෙන් යම් ප්‍රතිශතයක් ඉතිරි කර ගැනීමට භාණ්ඩාගාරය පුරුදුව සිටී. සමහර අවස්ථාවන්හි දී වෙන් කරන ලද මුදල් පවා මුදා නොහැරේ. සමහර විට ටික කාලයක දී මුදා හැරීම අත්හැරේ.

මූල්‍ය කොමිසමේ තීරණ බලාත්මක නොවන නිර්දේශාත්මක ඒවා ලෙස සැලකීම භාණ්ඩාගාරයේ ස්ථාවරය වී ඇත. එහි ප්‍රතිඵලය වන්නේ, කොමිසමෙන් නිර්දේශ කරන මුදල් පවා නියමිතව පළාත්වලට නොයැවීම ය. එසේ යැවෙන මුදලින් පවා මූල්‍ය සේවා ගාස්තුව වශයෙන් යම් ප්‍රතිශතයක් ඉතිරි කර ගැනීමට භාණ්ඩාගාරය පුරුදුව සිටී. සමහර අවස්ථාවන්හි දී වෙන් කරන ලද මුදල් පවා මුදා නොහැරේ. සමහර විට ටික කාලයක දී මුදා හැරීම අත්හැරේ.

පළාත් පාලන ආයතනවලට මුදල් ප්‍රතිපාදන සැපයීම අනිසි ලෙස අවුල් වන්නේ මුදල් යැවීමේ වැඩ පිළිවෙලේ සිදුවන වෙනස්කම් නිසා ය. පළාත් පාලන ආයතන අධීක්ෂණය කළ යුතු බවට පළාත් ලැයිස්තුවේ පැහැදිලිව සඳහන් වෙතත් මධ්‍යම ආණ්ඩුවේ මූල්‍ය සීමා භාවිතයන් නිසා පළාත් සභා කාර්යයභාරය යටපත් වේ.

තවද පොදුවේ ඇති අදහසක් නම්, මූල්‍ය කොමිසම ද පළාත්වල මුදල් අවශ්‍යතා ගැන නිසි සොයා බැලීමක් නැති බව ය. කොමිසම වෙත පළාත් වල නියෝජනයක් හෝ හමුවීමට ඉඩක් හෝ නැත. ඒ නිසා පළාත්වල අවශ්‍යතා භාණ්ඩාගාරයට පෙන්වා දී කැමති කරවා ගැනීමේ අවස්ථාවක් ද නැත. පළාත් අතර පවතින පුළුල් අසමානතාව ගැන පවා එය අවධානයක් යොමුකර නැත. එහෙයින් පළාත් නියෝජනයක් සහිතව මූල්‍ය කොමිසම නැවත පිහිටුවිය යුතු බවට අදහසක් ඇත. එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වැඩි බලයක් තිබිය යුතු ය. පළාත් අතර ආර්ථික හා සංවර්ධන අසමානතා සොයා බැලීමේ හා සමානත්වයට පත් කිරීමේ බලතල ක්‍රියාත්මක කිරීමේ හැකියාව වැඩි දියුණු විය යුතු ය.

අසම්පූර්ණ හා ප්‍රතිපත්ති විරහිත මුදල් වැඩ පිළිවෙළවල් නිසා පළාත් සේවා සැපයුම් ජරාවට පත් වේ. එවිට ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයක් ලෙස ව්‍යවස්ථාවෙන් ම පිහිටුවා ඇතත් ඒ කෙරෙහි මහජන විශ්වාසය හීන වේ. මෙය අද මුහුණු පෑ යුතු ප්‍රබල අභියෝගයකි. එහෙයින් ප්‍රායෝගික නොවන මූල්‍ය භාවිතයන් නිසා ම, දහතුන්වන සංශෝධනයෙන් යෝජිත බලතලවලට අමතරව තවත් බලතල නොදුන්නත්, බලය පැවරීම පූර්ණ අසාර්ථක වූවක් ලෙස සැලකෙනු ඇත.


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# 3.4 පළාත් ආණ්ඩුකරණය : ව්‍යුහාත්මක සහ දේශපාලන ගැටලු.

දහතුන්වන සංශෝධනයෙන් පළාත් සඳහා ඇති කරනු ලැබූ ව්‍යවස්ථාමය සැලසුම් සම්බන්ධ දේශපාලන හා පරිපාලන භාවිතයන් ගැන විවේචනාත්මක යොමු කිරීම් මෙම සාකච්ඡාවල දී ඇතිවිය.

පළාත් ආණ්ඩුකරණයේ ව්‍යුහාත්මක ලක්ෂණ අනුව මූල්‍ය සම්බන්ධ ආණ්ඩුකාරවරයාගේ කාර්යභාරය ගැන සෑහෙන විවේචන මතුවිය. වැඩි වැදගත් අදහස් වශයෙන් දැක්වුණේ මෙම බලතල ආණ්ඩුකාරවරයා වෙතින් (ආ.ක්‍ර.ව්‍ය. 154 උ (2) අනුව ජනාධිපතිවරයාගේ උපදෙස් මත ක්‍රියාත්මක වන ඔහුගේ නියෝජිතයා බැවින්) පළාත් සභාවෙන් තෝරාගත් සාමාජිකයකුට පැවරිය යුතු බව ය. අනෙක් අදහසක් වූයේ, දේශපාලන මට්ටමේ දී පළාත් පරිපාලනය කැටි වී ඇත්තේ මහ ඇමති සහ සෙසු ඇමතිවරුන් වෙතය. අනෙක් සමාජිකයන්ට ඇත්තේ ඉතා සුළු කාර්යයකි. 154 උ (1) අනුව අමාත්‍ය මණ්ඩලය හතර දෙනෙකුට සීමා කිරීම ද නුසුදුසු සීමාවක් වන අතර එය හත් දෙනෙකු වීම වඩා යෝග්‍ය යැයි ද අදහස් පළවිය.

දේශපාලන මට්ටමේ දී පළාත් පරිපාලනය කැටි වී ඇත්තේ මහ ඇමති සහ සෙසු ඇමතිවරුන් වෙතය. අනෙක් සමාජිකයන්ට ඇත්තේ ඉතා සුළු කාර්යයකි. 154 උ (1) අනුව අමාත්‍ය මණ්ඩලය හතර දෙනෙකුට සීමා කිරීම ද නුසුදුසු සීමාවක් වන අතර එය හත් දෙනෙකු වීම වඩා යෝග්‍ය යැයි ද අදහස් පළවිය.

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව පළාත් සභාවලට, පොලීසිය හා නීතිය හා පාලනය, ඉඩම්, අධ්‍යාපනය ආදායම් ප්‍රතිපත්තිය ඇතුළු ඉතා පළුල් බලතල රැසක් පවරා දී ඇති බවට ද පුළුල් විශ්වාසයක් පවතී. මේ සම්බන්ධයෙන් සහභාගි වූවන්ගෙන් බොහෝ දෙනෙකු පළ කළේ සර්ව පාක්ෂික කමිටුවේ අන්තර් වාර්තාව අනුව දහතුන්වන සංශෝධනය ක්‍රියාත්මක කිරීමේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය නිසි ව්‍යාවස්ථා ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කරන තුරු ක්‍රියාත්මක කිරීම යෝග්‍ය බව ය. තවද, සුබවාදී බලාපොරොත්තුක් ද විය. එනම් නැගෙනහිර පළාත් සභාවට පොලිස් හා ඉඩම් බලතල පොරොන්දු වී ඇති බැවින් අනෙක් පළාත් සභාවලටත් එම බලතල භාවිත කළ හැකි බව ය.

තවත් ගැටලුවක් වශයෙන් දැක්වුණේ අන්තර් ආණ්ඩු සබඳතා පවත්වා ගැනීමේ විධිමත් (නැත්නම් නොවිධිමත් එහෙත් ප්‍රායෝගික) යාන්ත්‍රණයක් නැති කම ය. බලය පවරා දෙන ව්‍යවස්ථා ක්‍රමයකට සම්බන්ධීකරණයේ, සහයෝගයේ සහ අදහස් විමසීමේ ක්‍රියාමාර්ග තිබිය යුතු ය. දහතුන්වන සංශෝධනයෙන් එවැන්නක් ඇති නොකෙරේ. අවස්ථානුකූල යාන්ත්‍රණයක් වූ ‘මහ ඇමති සමුළුව’ නිල හා දේශපාලන සබඳතා පැවැත්වීමට ප්‍රමාණවත් නොවන බව පැහැදිලි වී ඇත. තල කීපයක් ඇති ක්‍රමයක් මනා ලෙස පරිපාලනය වීමට එවැන්නක් අවශ්‍ය වේ. විශේෂයෙන් ම පළාත් අවශ්‍යතා මධ්‍යම තීරණ ගැනීමේ මණ්ඩලවලදී නියෝජනය වීමේ ක්‍රමයක් වර්ධනය කළ යුතු ව ඇත. විකල්ප වශයෙන් ඉදිරිපත් වූ යෝජනා අතර, පාර්ලිමේන්තුවට ද්විතීයික මණ්ඩලයක් තිබීම, කැබිනට් රැස්වීම්වලට මහ ඇමතිවරුන්ගේ සහභාගිත්වය, මූල්‍ය කරුණු

සම්බන්ධයෙන් නිලධාරි රැස්වීම් ක්‍රමවත් කිරීම, ආදිය විය. මෙයින් වඩා අවධාරණය වූ විකල්පය වූයේ, ව්‍යවස්ථා සංශෝධනයක් නැතිව ක්‍රියාත්මක කළ හැකි, මහ ඇමති වරුන්ට කැබිනට් රැස්වීම්වලට සහභාගිවීමට ඉඩ සැලැස්වීම ය. දැනටමත් සමහර මහ ඇමතිරුන්ට ඒ සඳහා නිරීක්ෂක මට්ටමින් සහභාගිවීමට ආරාධනා ලැබී ඇති බව පැවසිණ. එහෙත් පළාත් වුවමනාවන්ට අනුව තීරණ හැඩ ගැසෙන්නේ නැති හෙයින් එයින් පලක් නොවේ. පුළුල් ලෙස අවධාරණය වූයේ මූල්‍ය කොමිසමට නියෝජනය වීමට හෝ සහභාගිවීමට අවකාශ ලැබීමේ අදහස ය. එමගින් අන්තර් ආයතන සම්බන්ධීකරණයක් හා අදහස් හුවමාරු වීමක් සිදුවේ. මූල්‍ය කොමිසම හා පළාත් අතර විධිමත් ලෙස සම්බන්ධීකරණයක් ඇති කිරීම මගින්, කොමිසමේ නිර්දේශ වඩා නිශ්චිතව ක්‍රියාත්මක කළ හැකිවන අතර එමගින් භාණ්ඩාගාරයේ මුදල් වෙන් කිරීමේ අභිමතය වැළැක්විය හැකි ය.

පළාත් මූල්‍ය පරිපාලනය ප්‍රති සංවිධානය වීමේ අවශ්‍යතාව ද මතු විය. මේ සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සහ අය වැය සකස් කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම වෙන්විය යුතුය යි අදහස් විය. මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේද ගැන ද පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් ඒකාබද්ධ කිරීමේ වාසි ගැන ද සාකච්ඡා විය. මූල්‍ය කරුණු ගැන තීරණ ගැනීමේ ස්වාධීනත්වය කෙරෙහි ඇල්ම සමග සම්බන්ධ කරුණක් වූයේ, මහජන සේවා පැවැත්වීමේ නව ක්‍රම සමග පෞද්ගලික අංශය ප්‍රයෝජනයට ගැනීම අඩුවෙන් සිදුවන බව දැක්වීම ය.

තවත් පොදු කරුණු දෙකක් සඳහන් කිරීම යෝග්‍ය ය. එකක් නම්, මධ්‍යගතකරණයේ දේශපාලන සංස්කෘතියේ පැතිරීමෙන් උපන් එකකි. පළාත් සිවිල් සේවකයන් හා දේශපාලකයන් නම්බුකාරකමින් අඩු බවට ඇති සිතිවිල්ලය. මේ අදහස ඇති කළේ ද ප්‍රචලිත කළේ ද ජාතික මට්ටමේ ඊට සමාන තැනැත්තන් විසිනි. ජාතික මට්ටමේ ආයතනවලට වඩා පළාත් ද්විතීයික තත්ත්වයක් දරන බවට හැඟීමක් පවතී. ඒ මගින් විශ්වාසය හා චිත්ත ධෛර්යය පිළිබඳ අභියෝග මතු විය. පළාත් පරිපාලනයේ උද්යෝගය හා කාර්යක්ෂමතාව කෙරෙහි මේ තත්වය බලපායි. පළාත් ආයතන කෙරෙහි මහජන විශ්වාසය හා ඔවුන්ගේ හැඟීම් ද පලුදු වෙයි. වඩාත් සමීපව සම්බන්ධ අනික් ගැටලුව නම්, සිත් කාවදින අයුරින් ප්‍රකාශ වූවකි. එනම්, පළාත් ගැටලු සහ ආණ්ඩුකරණය ගැන මාධ්‍ය උනන්දුව අඩුවීම ය. මහජන මතය සකස් කිරීමේ වැදගත් උපකරණයක් වූ මාධ්‍යය වෙත නිසි අවධානය යොමු කිරීමේ අසාමාන්‍ය වගකීමක් ඇත්තේ ය. එය ආණ්ඩු කිරීමේ වැදගත් මට්ටමක් (වැඩි ප්‍රජාතන්ත්‍රවාදය මගින් ගැටුම් නිරාකරණය) කෙරෙහි යොමුවිය හැකි වුව ද මාධ්‍යය එය නොතකා හැරීමට තරම් උදාසීන වී ඇත.

වඩාත් සමීපව සම්බන්ධ අනික් ගැටලුව නම්, සිත් කාවදින අයුරින් ප්‍රකාශ වූවකි. එනම්, පළාත් ගැටලු සහ ආණ්ඩුකරණය ගැන මාධ්‍ය උනන්දුව අඩුවීම ය. මහජන මතය සකස් කිරීමේ වැදගත් උපකරණයක් වූ මාධ්‍යය වෙත නිසි අවධානය යොමු කිරීමේ අසාමාන්‍ය වගකීමක් ඇත්තේ ය. එය ආණ්ඩු කිරීමේ වැදගත් මට්ටමක් (වැඩි ප්‍රජාතන්ත්‍රවාදය මගින් ගැටුම් නිරාකරණය) කෙරෙහි යොමුවිය හැකි වුව ද මාධ්‍යය එය නොතකා හැරීමට තරම් උදාසීන වී ඇත.

අවසන් වශයෙන් බස්නාහිර පළාත මුහුණ දුන් අසාමාන්‍ය ගැටලුවක් වන්නේ ප්‍රතිපත්තිමය අභියෝගයක් වූ දිනපතා ප්‍රවාහන සේවා ලබන ජනගහනය යි. දිනපතා අති විශාල සංඛ්‍යාවක් විවිධ වැඩ කටයුතු සඳහා එහා මෙහා යති. නගරය තුළ අධ්‍යාපනය, ව්‍යාපාර ආදිය කරන නමුත් පළාතෙන් පිටත වාසය කරති. ඒ නිසා පළාත් ප්‍රවාහන සේවා ගැටලු නිතරම ඇතිවේ. පළාතේ බදු ගෙවන මිනිසුන් කෙරෙහි යොමු කරනවාට වැඩි අවධානයක් ඔවුන් කෙරෙහි යොමු කළ යුතු ය. මධ්‍යයෙන් ඒ


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

සඳහා යොමු කරන සම්පත් ගැන අවධානය යෙදිය යුතු ය. මේ ගැටලුම විසඳිය හැකිවන්නේ අතිරේක බදු පැනවීමට ඉඩ සැලසීමෙන් හෝ පළාතට වැඩි මුදල් වෙන් කිරීමෙනි.

## 3.5 ධාරිතාව පිළිබඳ ගැටලු : මානව සම්පත් පරිපාලන යෝග්‍යතා

ශ්‍රී ලංකාවේ පොදු පරිපාලනය කෙරෙහි අහිතකර ලෙස බලපාන ගැටලු අතර හැකියාවන් පිළිබඳ ගැටලුව උග්‍ර ලෙස හමු වන්නේ ජාතික මට්ටමටත් වඩා පළාත් මට්ටමෙනි. විශේෂ මානව සම්පත් ගැටලු මතු වන්නේ බඳවා ගැනීම්, අනුයුක්ත නිලධරයන් පාලනය සහ වැටුප් සම්බන්ධයෙනි. සුදුසු නිලධරයන් බඳවා ගැනීම වඩාත් අපහසු වන්නේ කාර්ය මණ්ඩල සැකසීම ගැන තීරණ ගැනීමට අවශ්‍ය මූල්‍ය ස්වාධීනත්වය නැති හෙයිනි. වැටුප් ගෙවීම් නිතර ප්‍රමාද වන විට සුදුසුකම් ලත් නිලධරයන් රඳවා ගැනීම අපහසු ය. මේ හේතුව නිසා අවස්ථානුකූල විසඳුමක් වශයෙන් විශ්‍රාම ගිය නිලධරයන් කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගැනීමට සිදුවේ. එහි ප්‍රතිඵලය වන්නේ ආයතනික හැකියාවන්, තාක්ෂණික විශේෂඥතා සහ අත්දැකීම් දුර්වල වීම ය. විශේෂඥතා ඇති නිළධරයන් මධ්‍යය ආණ්ඩුව විසින් රඳවා ගනු ලැබේ. වාර්තාකරණය අධීක්ෂණය හා අනුයුක්ත නිළධරයන්ගේ විනය පාලනය සම්බන්ධ පටිපාටිය මධ්‍යය ආණ්ඩුව වෙතම පවතී. ඕනෑම මොහොතක එම නිළධරයන් මධ්‍යයට ආපසු කැඳවිය හැකි ය. පොදු කාර්ය සංවිධානය දිගු කාලීනව දුර්වලවීමෙන් කටයුතු අපහසු වනවා පමණක් නොව මානව සම්පත් ගැටලු ද ඇති කරයි. පසු කාලීනව ප්‍රමාණවත් විය හැකි පර්යේෂණ හා සංවර්ධන ශක්‍යතා පළාත්වලට නැති අතර ප්‍රතිපත්ති සෑදීම හා සලසුම්කරණය පිළිබඳ දත්ත හා තොරතුරු උත්පාදනය කිරීම හා පවත්වා ගැනීමට අවශ්‍ය හැකියාව ද නැත. තවත් ගැටලුවක් වන්නේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ය. වාර්ගික හා භාෂාමය විවිධත්වය විශේෂ ලක්ෂණය වූ පළාත්වල පවා එම පළාත් සභාවල වැසියන්ගේ අවශ්‍යතා පරිදි තමන් කැමති භාෂාවෙන් කටයුතු ඉටුකර දීම සඳහා කැපවීමට අවස්ථාව නැත. දේශපාලන හා නිලධාරී වුවමනාව තිබුණත් හැකියාවන් හිඟකම නිසා එය ඉටු කළ නොහැකි ය.

ශ්‍රී ලංකාවේ පොදු පරිපාලනය කෙරෙහි අහිතකර ලෙස බලපාන ගැටලු අතර හැකියාවන් පිළිබඳ ගැටලුව උග්‍ර ලෙස හමු වන්නේ ජාතික මට්ටමටත් වඩා පළාත් මට්ටමෙනි. විශේෂ මානව සම්පත් ගැටලු මතු වන්නේ බඳවා ගැනීම්, අනුයුක්ත නිලධරයන් පාලනය සහ වැටුප් සම්බන්ධයෙනි. සුදුසු නිලධරයන් බඳවා ගැනීම වඩාත් අපහසු වන්නේ කාර්ය මණ්ඩල සැකසීම ගැන තීරණ ගැනීමට අවශ්‍ය මූල්‍ය ස්වාධීනත්වය නැති හෙයිනි.

© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# 3.6. නෛතික ගැටලු : නීතියේ ආධිපත්‍යය යටතේ බලය පැවරීම

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් බලය බෙදීමේ ක්‍රියා පිළිවෙළ යටතේ සහතික කරන ලද පළාත් ස්වපාලනය ආරක්ෂා කිරීමේ සහ අවසාන තීන්දු දීමේ ආයතනය අධිකරණයයි. එහෙත් දහතුන්වන සංශෝධනය නීතිගත කර පසු වූ දශක දෙක තුළ පළාත් ස්වපාලනය, මධ්‍යම ආණ්ඩුවේ වුවමනාවන්ට එරෙහිව ආරක්ෂා කිරීමේ දී විවිධ මිශ්‍ර තීන්දු දී ඇත. වඩාත් උග්‍ර විවේචනය වන්නේ, මධ්‍යම ආණ්ඩුව සහ නිළධර තන්ත්‍රයටත් වඩා, ශ්‍රේෂ්ඨාධිකරණය සිය අර්ථ නිරූපන මගින් මධ්‍යගතකරණය සිදුකරන බව ය. මේ සම්බන්ධ නඩු තීන්දුවක් වන්නේ 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත සංශෝධනය සඳහා ඉදිරිපත් වූ නඩුව ය. යෝජිත සංශෝධනය පළාත් ලැයිස්තුවේ සඳහන් කරුණක් උල්ලංඝනය කරන බව දැක්විණ. ආණ්ඩුව තර්ක කළේ එය සමගාමී ලැයිස්තුවේ සඳහන් කරුණක් වන බව ය. එහෙත් ශ්‍රේෂ්ඨාධිකරණය ඒ තර්ක දෙක ම ප්‍රතික්ෂේප කොට කීවේ එය සංවෘත ලැයිස්තුවේ ද සඳහන් කරුණක් වන බව ය. එයින් පෙන්නුම් කළේ පළාත් ස්වපාලනය ගැන මධ්‍යම ආණ්ඩුවටත් වඩා සතුරු බවක් ශ්‍රේෂ්ඨාධිකරණය දක්වන බව ය. මේ සම්බන්ධ තවත් අවස්ථා කලින් සාකච්ඡා කර ඇත.

පළාත් ව්‍යවස්ථා බලය යටපත් කරන තවත් භාවිතයක් ඇත. ඒ සමහර ආණ්ඩුකාරවරුන්ට පළාත් සභාවෙන් සම්මත කරන ප්‍රඥප්තියකට නීතිපතිගේ අනුමැතිය අවශ්‍ය වීමයි. (සමහරවිට නීතිපිතිගේ උපදෙස් සොයනු ඇත) ආණ්ඩුකාරවරයා අනුමත කිරීමට එසේ ක්‍රියා පටිපාටියක යෙදෙතත් ව්‍යවස්ථාවේ 154 ඒ අනුව එවැන්නත් අවශ්‍ය නැත. එයින් මෙතෙක් කර ඇත්තේ අනුමත කිරීම ප්‍රමාද කිරීමයි. රටේ පොදු අත්දැකීම වන්නේ නීතිපති ආණ්ඩුවට පක්ෂපාත අදහස් දරන බවය. මේ නිසා පළාත් සභාවල ව්‍යවස්ථා දායක බලයක් ස්වාධීනත්වයත් බරපතල ලෙස යටපත් වේ.

ශ්‍රේෂ්ඨාධිකරණයේත්, රාජ්‍ය නීති නිලධරයාත් සම්බන්ධ මෙම අත්දැකීම අනුව එකී ආයතන කෙරෙහි පළාත් වල විශ්වාසය බිඳ වැටී ඇත. පළාත් වලට නීතිමය සේවා ලබා ගැනීමට ඇති හැකියාවේ හිඟකම තවත් බාධාවකි. සාමාන්‍යයෙන් පළාතකට සිටින්නේ එක් නීති නිලධරයෙකි. නීති පරිවර්තනය කිරීම නිරන්තර ගැටලුවකි. මේ තත්ත්වයන් යටතේ බලය පැවරීම සඳහාවූ ව්‍යවස්ථා සැලැස්ම කෙරෙහි සැකය හා මතභේද ඇතිවේ.

පළාත් ව්‍යවස්ථා බලය යටපත් කරන තවත් භාවිතයක් ඇත. ඒ සමහර ආණ්ඩුකාරවරුන්ට පළාත් සභාවෙන් සම්මත කරන ප්‍රඥප්තියකට නීතිපතිගේ අනුමැතිය අවශ්‍ය වීමයි. (සමහරවිට නීතිපිතිගේ උපදෙස් සොයනු ඇත) ආණ්ඩුකාරවරයා අනුමත කිරීමට එසේ ක්‍රියා පටිපාටියක යෙදෙතත් ව්‍යවස්ථාවේ 154 ඒ අනුව එවැන්නත් අවශ්‍ය නැත. එයින් මෙතෙක් කර ඇත්තේ අනුමත කිරීම ප්‍රමාද කිරීමයි. රටේ පොදු අත්දැකීම වන්නේ නීතිපති ආණ්ඩුවට පක්ෂපාත අදහස් දරන බවය. මේ නිසා පළාත් සභාවල ව්‍යවස්ථා දායක බලයක් ස්වාධීනත්වයත් බරපතල ලෙස යටපත් වේ.


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# 3.7 පළාත් සුළුතර කොටස් සහ භාෂා ප්‍රතිපත්තිය: පළාත් සභාවන්හි කාර්යභාරය හා නීතිමය හැකියාව

යම් පළාත් වල සුළුතර කොටස් වලට සම්බන්ධ වාර්ගික ආගමික හා කුල කොටස් වලට අයත් පුද්ගලයන් පළාත් ආයතන වල නියෝජනය වීම ගැන ද යම් අදහස් මතුකර තිබේ. සමහර විට මෙම කණ්ඩායම් වලට ඡන්ද බලයෙන් නියෝජනය වීමක් සිදුවිය නොහැකිය. එහෙයින් පළාතේ තීන්දු ගැනීමේ ක්‍රියාවලියට ඔවුන් සම්බන්ධකර ගැනීමේ ක්‍රමවේදයන් ඇති කිරීම වැදගත්වේ. මෙය විශේෂයෙන් අවශ්‍ය වන්නේ දහතුන්වන සංශෝධනය මේ කරුණ ගැන යොමු නොවන නිසාය. කලින් සඳහනත පරිදි, ද්විභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට ඇති නොහැකියාව නිසාම බොහෝ පලාත් මේ කරුණ ගැන නිහඬතාව දක්වනු ඇත.

# 3.8 පළාත් සිවිල් සමාජය : සහභාගිත්වය, ප්‍රතිචාර දැක්වීම සහ වගකීම් භාරය.

වැඩියෙන් බලතල පැවරීම කෙරෙහි අහිතකර ලෙස බලපාන පුළුල් දේශපාලන සාධකයක් වන්නේ පළාත් වශයෙන් ඒ ගැන සංවේදී වන සිවිල් ජනතාවකගේ හිඟකම ය. තීරණ ගැනීමේ බලය පළාත්වලට තිබිය යුතු ය යන ඉල්ලීම් මුල් කර ගත් ව්‍යාපාරයක් ගොඩ නැගීමට සිවිල් සමාජය ප්‍රමුඛ වේ.

වැඩියෙන් බලතල පැවරීම කෙරෙහි අහිතකර ලෙස බලපාන පුළුල් දේශපාලන සාධකයක් වන්නේ පළාත් වශයෙන් ඒ ගැන සංවේදී වන සිවිල් ජනතාවකගේ හිඟකම ය. තීරණ ගැනීමේ බලය පළාත්වලට තිබිය යුතු ය යන ඉල්ලීම් මුල් කර ගත් ව්‍යාපාරයක් ගොඩ නැගීමට සිවිල් සමාජය ප්‍රමුඛ වේ. ඒ මගින් පුරවැසි සහභාගිත්වය, විවෘත භාවය සහතික කිරීම, වගකීම්භාරය සහ වහා ප්‍රතිචාරදක්වීමේ පොදු ආයතන ගුණය සඳහා එවැනි ව්‍යාපාර අවශ්‍ය වේ. එවැන්නක් නැති විට, මධ්‍යගතකරණයේ සංස්කෘතිය නිදහසේ වැඩෙයි. ඒ සමග පළාත් මට්ටමින් අසාර්ථක පාලනය ගැන මහජන උදාසීනතාව ද වැඩේ.

© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# අවසන් යෝජනාවලිය

13 වැනි ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් වූ ආකාරය ගැන කවරාකාරයේ මතභේද ඇතත් පළාත් සභා ස්ථාපිත කිරීමේ අරමුණ වූයේ ජනවාර්ගික ගැටලුවට විසඳුමක් ලබාදීම සහ ප්‍රාදේශීය සංවර්ධනය සඳහා පළාත් බල ව්‍යුහයක් පිහිටුවීම ය.

මේ අරමුණු දෙකම අපේක්ෂිත පරිදි මල්පල නොදරුයේ ඇයි? මේ සම්බන්ධයෙන් පළාත් සභාවල මහජන නියෝජිතයන්ගේත් නිලධාරීන්ගේත් පොදුවේ හැම පළාත් සභාවකට ම අදාල වන කරුණු මෙන් ම ඒ ඒ පළාත්වලට අනන්‍ය වූ කරුණු ද ඇති බව ය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් කැඳවන ලද විද්වතුන් පළාත් සභාවල මහජන නියෝජිතයන් සහ නිලධාරීන් සමග පළාත් සභා විෂයය සම්බන්ධයෙන් කතිකාවතකට දායක වුව ද ඔවුන්ගේ අදහස් කිසිවක් මෙහි නියෝජනය නොවේ.

පළාත් සභාවල අභියෝග, සඵලතා සහ විකල්ප යෝජනා සකස් කිරීමේ තෙදින වැඩමුළුවකට සහභාගී වූ මහජන නියෝජිතයන් අතරින් සෑම පළාත් සභාවක් ම, නියෝජනය වන සේ පත් කරගත් පස් දෙනාගේ කමිටු එක් ව සකස් කරන ලද අවසන් යෝජනාවලිය මෙහි දැක්වේ.

මේ යෝජනාවලියෙහි පිළිබිඹු වන්නේ වසර 20ක ඉතිහාසයක් හිමි පළාත් සභා පූර්ණ බලතල සහිතව ක්‍රියාත්මක කිරීමෙහි දී මග නොහැර යා නොහැකි, යා නොයුතු යථාර්ථයයි.

ඒ ඒ පළාත් සභාවලට අනන්‍ය වූ තත්ත්වයන් ගැඹුරින් සාකච්ඡාවට ලක් කරන ලදි. ඒ අනුව අවසන් ලියැවිල්ල සකස් කෙරිණ. අවසන් ලියැවිල්ලෙහි සියලු පළාත් සභාවලට පොදු වූ නිර්දේශ ඉදිරිපත් කර ඇත. ඊට පදනම් වූ පළාත්වල නිර්දේශ ද ඇමුණුම් වශයෙන් මෙහි එකතු කර තිබේ.

මෙයින් අතිගරු ජනාධිපතිතුමා, මධ්‍යම රජයේ අමාත්‍යවරුන් සහ පරිපාලන නිලධාරීන් අතර ගැඹුරු කතිකාවතක් ඇතිවීම අපගේ අපේක්ෂාවයි.

එමෙන් ම ජනමාධ්‍ය, සිවිල් සංවිධාන යනාදී විවිධ ස්ථර ඔස්සේ මේ පිළිබඳ කතිකාවත පෝෂණය විය යුතු ය.

© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# විසි වසරක පළාත් සභා අත්දැකීම් ආශ්‍රිත ජාතික නිර්දේශ

## ව්‍යවස්ථාමය ගැටලු

| ගැටලුව | විකල්පය | ඉටුකළ යුතු අය |
|---|---|---|
| 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පැවරුණු බලතල ක්‍රියාත්මක නොවීම. | එම බලය නැවත ලබාදීම | මධ්‍යම ආණ්ඩුව |
| 1. සමගාමී ලැයිස්තුව | ව්‍යවස්ථාමය සංශෝධනයක් කරන තුරු අවබෝධතා ගිවිසුමකින් නිශ්චිතව බලය බෙදා ගැනීම. | මධ්‍යම ආණ්ඩුව සහ පළාත් සභා |
| 2. ද්විත්වකරණය | පළාත් සභා විෂයයන්ට මධ්‍යම රජය විසින් පිහිටුවා ඇති අමාත්‍යාංශ අහෝසි කළ යුතුය. | මධ්‍යම ආණ්ඩුව සමග සියලු අමාත්‍යාංශ |
| | ප්‍රධාන ඇමතිවරයා කැබිනට් මණ්ඩල සාමාජිකයකු බවට නීත්‍යානුකූලව පත් කිරීම. | මධ්‍යම ආණ්ඩුව |
| 3. ප්‍රඥප්ති සකස් කිරීමේදී නීතිපතිගේ නිර්දේශ අවශ්‍ය වීම | පළාත් නීති දෙපාර්තමේන්තුවක් පිහිටුවීම. 13 සංශෝධනයේ සමගාමී ලැයිස්තුවේ විෂයයන් ගැන පූර්ණ බලතල පවරා දීම ඇතුළුව පළාතට අවශ්‍ය ඇමතිවරුන් සහ නිලධරයන් වැඩි ප්‍රමාණයක් පත්කර ගැනීම. | මධ්‍යම ආණ්ඩුව |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

| | | |
|---|---|---|
| 4. පළාත් සභාවේ ධුරධාරී තනතුරු ගැන ව්‍යවස්ථාපිත එකඟතාවක් නොතිබීම (උදා : විපක්ෂනායක, නියෝජ්‍ය සභාපති, පක්ෂනායක) | අදාළ පළාත් සභා පනතේ සංශෝධනයක් මගින් ඊට අදාළ තනතුරු ව්‍යවස්ථාපිත බවට පත්කිරීම. | මධ්‍යම ආණ්ඩුව |
| 4. අ. පළාත් සභාවේ සභාපති තනතුර හා නියෝජ්‍ය සභාපති තනතුරු දෙක | එම තනතුරු වෙනුවට පළාත් සභාවේ කථානායක හා පළාත් සභා නියෝජ්‍ය කථානායක ලෙස ව්‍යවස්ථාගත කිරීම. | මධ්‍යම ආණ්ඩුව පළාත් සභා |

## පරිපාලන

| ගැටලුව | විකල්පය | ඉටුකළ යුතු අය |
|---|---|---|
| 1. පළාත් රාජ්‍ය සේවයේ තනතුරු සහ බඳවා ගැනීම සඳහා මධ්‍යම රජයේ අනුමැතිය ලබා ගැනීමට සිදුවීම. | සම්මත නිර්ණායක පද්ධතියක් යටතේ ඒ ඒ පළාත් සභාවලට අවශ්‍ය කාර්ය මණ්ඩල හඳුනාගෙන අදාළ සේවක සංඛ්‍යාව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් බඳවා ගැනීම.<br>පළාත් කළමනාකරණ සේවා අධ්‍යක්ෂවරයකු යටතට පත් කිරීම.<br>දීප ව්‍යාප්ත සේවාවේ නිලධරයන් මාරු කිරීම හා පළාත තුළ ස්ථානගත කිරීමේ බලය පැවරීම. | මධ්‍යම ආණ්ඩුව |
| 2. ප්‍රාදේශීය පරිපාලනය (ප්‍රාදේශීය ලේකම් කාර්යාල) පළාත් සභාවෙන් ඉවත් කිරීම. | නැවත පළාත් සභාවලට පැවරීම. | මධ්‍යම ආණ්ඩුව සහ රාජ්‍ය පරිපාලන ආමාත්‍යාංශය ඇතුළු සියලු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු |

© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

| ගැටලුව | විකල්පය | ඉටුකළ යුතු අය |
|---|---|---|
| 3. පළාත් සභා විෂයයන් සම්බන්ධයෙන් පළාත් සභාවේ අනුමැතිය හෝ එකඟතාවෙයකින් තොරව ජාතික ප්‍රතිපත්ති චක්‍රලේඛ නිකුත් කිරීම. | පළාත් සභාවට පැවරුණු විෂයයන් ගැන මධ්‍යම ආණ්ඩුව සෘජුව මැදිහත් නොවිය යුතුය. එසේම විවිධ ආයතන වලටද එවැනි බලයක් නොතිබිය යුතුය. | මධ්‍යම ආණ්ඩුව සහ සියලු අමාත්‍යාංශ |
| 4. පළාත් සභාවලට පැවරුණු විෂයයන් රේඛීය අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මගින්ද ඉටුකිරීම හා ඒ සඳහා රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තුමේන්තු පිහිටුවා තිබීම.<br>උදා : සමාජ සේවා කටයුතු, ළමා රක්ෂක කටයුතු, සමුපකාර කටයුතු, කුඩා කර්මාන්ත කටයුතු, ජාතික පාසල් වශයෙන් වර්ග කිරීම. | පළාත් සභා නිලතලවලට අදාළ සියලුම රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු අහෝසිකොට එම කාර්යයන් පළාත් සභා මගින් ඉටුකර ගැනීම. | මධ්‍යම ආණ්ඩුව |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# මූල්‍ය ගැටලු

| ගැටලුව | විකල්පය | ඉටුකළ යුතු අය |
|---|---|---|
| 1. භාණ්ඩ හා සේවා සැපයීම සම්බන්ධයෙන් යම් බලයක් හා වගකීම් පළාත් සභාවලට දී ඇතත් වියදම් කිරීමේ ශක්‍යතාව නැතිවීම. | බදු අය කිරීමේ සහ ආදායම් උත්පාදනය කිරීමේ අවස්ථාව ඇති කිරීම සහ වෙනත් ආකාර වලින් මුදල් සපයා ගැනීමට අවස්ථා සැලසීම. | මධ්‍යම ආණ්ඩුව |
| 2. පළාත් සභාවලට ලැබිය යුතු වාර්ෂික මුදල් ප්‍රමාණය මහා භාණ්ඩාගාරයට නිර්දේශ කිරීම පමණක් මුදල් කොමිසමට තිබීම. | රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පළාත් සභා සඳහා සම්මත නිර්ණායක මත පදනම්ව මුදල් වෙන් කිරීම කළ හැකි, එමෙන්ම පළාත් සභා නියෝජනයක් සහිත. ජාතික මුදල් කොමිසමක නිර්දේශ මත පමණක් මහා භාණ්ඩාගාරය මගින් මුදල් වෙන් කිරීම හා ඊට පරිබාහිරව මුදල් වෙන් නොකිරීම. | මධ්‍යම ආණ්ඩුව සහ මහා භාණ්ඩාගාරය |
| 3. පළාත් සභාවලට අදාළ විෂයයන් සඳහා රේඛීය අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු වලට මුදල් වෙන් කිරීම. උදා : සමාජ සේවා, පරිවාස හා ළමාරක්ෂක සේවා, කෘෂිකර්ම හා මාර්ග) | පළාත් සභා විෂයයන්ට නියමිත මූල්‍ය වෙන් කිරීම මධ්‍යම ආණ්ඩුව යටතේ කිසිදු අමාත්‍යාංශයකට හෝ දෙපාර්තමේන්තුවකට හෝ වෙන් නොකිරීම. | මහා භාණ්ඩාගාරය |

© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

| ගැටලුව | විකල්පය | ඉටුකළ යුතු අය |
|---|---|---|
| 4. පළාත් සභාවලට වෙන් වන මුදල් මහා භාණ්ඩාගාරය විසින් ම විටින් විට කපා හැරීම. (උදා : 2007 වසරේදී 65%ක් පළාත් සභාවලින් අඩුකර තිබුණු අතර මධ්‍යම ආණ්ඩුවේ අමාත්‍යාංශ වලින් අඩුකර තිබුනේ 20% පමණි.) | රජයට මුහුණ දීමට සිදුවන මූල්‍ය අර්බුද වලදී මධ්‍යම ආණ්ඩුවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් අඩු කරන ප්‍රතිශතයට සමාන ප්‍රමාණයකින් පමණක් පළාත් සභා වලින්ද අඩු කිරීම. | මහා භාණ්ඩාගාරය |
| 5. බදු පැනවීමේදී පළාත් සභාවලට සීමාවක් පනවා තිබීම. | පළාත් සභාවලට එම බලය පූර්ණ ලෙස පැවරීම. | මධ්‍යම ආණ්ඩුව |
| 6. විදේශ මූල්‍ය ඍජුව පළාත් සභා වලට නොලැබීම හා රේඛීය අමාත්‍යාංශ මගින් ව්‍යාපෘති කාර්යාල පවත්වාගෙන යමින් එම ව්‍යාපෘති පාලනය කිරීම. | විදේශ සම්පත් දෙපාර්තමේන්තු නිර්ණායකයන්ට යටත්ව (එනම් ජාතික ආරක්ෂාව හා දේශපාලන පැවැත්මට බලපෑම් ඇති නොවන පරිදි) ලැබෙන විදේශ ව්‍යාපෘති පළාත් සභාවේ ප්‍රධාන ලේකම් යටතේ පූර්ණ බලය සහිතව ක්‍රියාත්මක කිරීම. | මධ්‍යම ආණ්ඩුව සහ අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# පළාත් මට්ටමේ අවසන් යෝජනා

© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# පළාත් සභා අභිමතය

ඓතිහාසික කෝට්ටේ යුගයෙහි 'තනිය වල්ලභ' නම් වූ රජෙක් මාදම්පේ ප්‍රදේශයෙහි රජකම් කළේ ය. තම පළාතට ආවේණික වූ භෞතික සම්පත් හඳුනා ගනිමින් මානව හා ජෛව සම්පත වැඩි දියුණු කිරීමෙන් ඔහු 'තනිය වල්ලභ දෙවියන්' හැටියට පූජනීයත්වයට පත්විය.

අද ද ඔහු 'තනියවල්ලභ රජ්ජුරුවෝ' හැටියට මාදම්පා රුක් දෙවොලෙහි පිදුම් ලබත්. බලතල විමධ්‍යගත කිරීම නොහොත් බල හවුල්කාරිත්වය පිළිබඳ එබඳු අතීත උරුමයක් හිමි ශ්‍රී ලංකාව 1987 දී චංචලභාවයට පත් වූයේ රාජාණ්ඩු ක්‍රමය දුරු'ර ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයකට අවනත ව ශතක දෙකකට ආසන්න වූ කාලයක් ඉකුත්ව තිබිය දීය. ලේ වැගිරීම් මැද වුව ද පිහිටුවනු ලැබූ පළාත් සභා පාලනය දශක දෙකක ආයුකාලය සපුරමින් සිටියදීත් 'ලබා දුන් බලය ආපසු ගැනීමේ' නොහොත් ' බලය හරිහැටි නොදුන්' වියවුලට ගොදුරු ව සිටී.

'බලපංගුකාරිත්වයේ කොටස්-කරුවන් බවට පත් නොවූ දෙමළ ජනතාව ජීවත් වන භූමියෙහි හටගත් කැරැල්ල ලෙයින් යකඩින් මර්දනය කරන්නට යෑමෙහි ප්‍රතිපල හැටියට සැත්තෑ දහසකට අධික වූ දෙමළ හා සිංහල වැසියන් ඝාතනයට ලක් ව ඇති අතර දොළොස් ලක්ෂයක් දන අවතැන් කර ඇත. එසේ හෙයින් ඕනෑ ම ජාතියකට තම භාෂාමය සහ සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගැනීමේත් ආර්ථික අභිවෘද්ධිය සලසා ගැනීමේත් අවස්ථා සලසන බලපංගුකාරිත්වය පිළිබඳ ලේ වැකි විරෝධය තව දුරටත් වලංගු නොවේ.

සර්ව පාක්ෂික සමුළුවෙහි අතුරු යෝජනාවක් වූ 13 වැනි සංශෝධනයෙන් පැවරුණ බලය පූර්ණ ලෙස ලබා දීම, වත්මන් ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් මෙන්ම පළාත් සභා පිහිටුවීමට දායක වූ එ.ජා.පය ඇතුළු පක්ෂ ගණනාවක් විසින් අනුමත කරන ලද්දේ 2007 වසරේ දී ය. නැගෙනහිර පළාත් සභා මැතිවරණය පවත්වන ලද්දේ ඒ පිළිබඳ දැඩි සමාජ උනන්දුවක් පැවති අවස්ථාවකය.

පළාත් සභාවල දශක දෙකක අත්දැකීම් පිළිබඳ අප විසින් කථෝපකථනයක යෙදුණේ මේ අතරතුරය. පළාත් සභා ශක්තිමත් කිරීමේ දී අනුගමනය කළ යුතු වැඩපිළිවෙල කුමක් ද යන්න පිළිබඳ සහභාගී ප්‍රවේශයක් (Participatory Approach) පිළිබඳ අත්හදා බැලීමක් වූයේ පළාත් සභා හවුල්කර ගනිමින් දෙවැනි අදියර හැටියට ක්‍රියාත්මක වූ තෙදින වැඩමුළුවයි.

පළාත් සභාවේ මහජන නියෝජිතයන් සහ නිලධාරීන්ගේ අදහස් අනුව පළාත් සභාවල වත්මන් තත්වය, එය මුහුණ දී ඇති අභියෝග සපලතා සහ විකල්ප යෝජනාත් වගකීමුත් පිළිබඳ පැහැදිලි චිත්‍රයක් මෙයින් හඳුනාගත හැකි විය. මෙහි දක්වෙනුයේ ඒ ඒ පළාත් සභාවල නියෝජිතයන්ගේ අදහස්වල සාරයයි.

ව්‍යවස්ථාපිත බලතල නොදීම හේතුවෙන් ඇති වී තිබෙන අර්බුදය මෙහි සංලක්ෂිත ය. පළාත් පාලනයෙහි දී අතිශයින් වැදගත් වන ආයතන සහ සංස්ථාවල පාලනය ද වරින් වර මධ්‍යම ආණ්ඩුව යටතට ගැනීම, මූල්‍ය බලය මධ්‍යම ආණ්ඩුව විසින් සංකේන්ද්‍රනය කර ගැනීම, පළාත් වල භෞතික අභෞතික අනන්‍යතාවලට ගරු නොකිරීම හා මධ්‍යගත කරණයට ලක් වූ ආකල්ප අනුව ප්‍රාදේශීය පාලනය දිගේලි කරන්නට යත්න දැරීම යනාදී වශයෙන් සංකීර්ණ ගැටලු සමුදායක් මෙහි දී හඳුනාගත හැකිවේ.


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# බස්නාහිර පළාත් සභා නිර්දේශ

| ගැටලුව | පවත්නා තත්ත්වය | විකල්පය | වගකීම |
| --- | --- | --- | --- |
| 1. 13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බලය ක්‍රියාත්මක කිරීමේ දී ආණ්ඩුවේ මැදිහත්වීම | බලසීමා අභිබවා පළාත් සභා කටයුතු කෙරෙහි මධ්‍යම රජය මැදිහත් වීම. නිශ්චිතව බලතල වෙන්කිරීම හා සීමා හඳුනාගැනීම | පළාත් රාජ්‍ය සේවා කොමිසමට අවශ්‍ය කටයුතු කිරීමට අවකාශ ලබාදීම | පාර්ලිමේන්තුව |
| 2. මධ්‍යම ආණ්ඩුවේ දේශපාලන අධිකාරිය පළාත් සභා ක්‍රමය ශක්තිමත් කිරීමට කැමැත්තක් නොදක්වීම | පළාත් සභා ක්‍රමය පිළිබඳ හා එය ශක්තිමත් කිරීමට අවබෝධයක් නොතිබීම. | ආකල්පමය වෙනසක් ඇති කිරීම | දේශපාලන පක්ෂ<br>සිවිල් සංවිධාන<br>මාධ්‍ය ආයතන |
| 3. ද්විත්වකරණය | පළාත් සභා ලැයිස්තුව හා සමගාමී ලැයිස්තුව එකම විෂයයන් ක්‍රියාත්මක කිරීම<br>උදා: ඉඩම්, අධ්‍යාපන | සමගාමී ලැයිස්තුව අවලංගු කර බලපංගුකාරීත්වයක් හඳුන්වා දීම. | පාර්ලිමේන්තුව<br>අතිගරු ජනාධිපති තුමා |
| 4. මූල්‍ය බලතල ප්‍රමාණවත් ලෙස ලබා නොදීම<br>උදා: මුදල් කොමිසම | පළාත් භාණ්ඩාගාරය හා මුදල් කොමිසම මධ්‍යම රජයේ භාණ්ඩාගාර පාලනයට නතුවීම.<br>විධිමත් නිර්ණායක විධිමත් යාන්ත්‍රණයක් හා මූල්‍ය සම්පත් නොතිබීම.<br>මධ්‍යම රජයේ කටයුතු සඳහා වැඩි මුදල් ප්‍රතිශතයක් ලබා දීම | පළාත් සභා අනන්‍යතාව මත හඳුනාගත් නිර්නායක මත ප්‍රතිශත හඳුනාගෙන සම්පත් බෙදාහැරීම<br>පළාත් සභාව තුළ බලය තවදුරටත් විමධ්‍යගත කිරීම | මධ්‍යම රජයේ මුදල් අමාත්‍යවරයා |
| 5. පළාත් සංවර්ධනය සඳහා ප්‍රමාණවත් මුදල් නොලැබීම. | පළාත් සංවර්ධනය සඳහා ලැබෙන ප්‍රතිපාදන අපේක්ෂිත පරිදි නොලැබීම. | විධිමත් නිර්ණායක තුළින් තුලිත සංවර්ධන ප්‍රතිපත්තීන්ට අනුව මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම | මුදල් ඇමතිතුමා. |

| | | | |
|---|---|---|---|
| 6. ප්‍රාදේශීය පරිපාලනයට අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල පළාත් සභාවෙන් ඉවත් කිරීම | - | ප්‍රාදේශීය පරිපාලනය පළාත් සභාවට පැවරීම. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය |
| 7. ජාතික හා පළාත් වශයෙන් ස්ථිර ප්‍රතිපත්තියක් නොතිබීම | - | සෑම විෂයයක් සම්බන්ධ ව ජාතික හා පළාත් මට්ටමින් ප්‍රතිපත්ති සැකසීම | මධ්‍යම රජයේ අමාත්‍ය මණ්ඩලය |
| 8. පළාත් සභා දෙවන පන්තියේ ලා සැලකීම හා ජනමාධ්‍ය විසින් නොසලකා හැරීම | - | පළාත් සභා පිළිබඳ දනට පවත්නා ආකල්ප වෙනස් කිරීමේ වැඩපිළිවෙලක් ඇති කිරීම. | පාර්ලිමේන්තුව<br>ප්‍රවෘත්ති අමාත්‍යාංශය |
| 9. කාර්ය මණ්ඩල අවශ්‍ය තාව පරිදි පළාත් සභාවට බඳවා ගැනීමට නොහැකි වීම<br>උදා: හෙදි | - | පළාතට අදාළ සියලු කාර්ය මණ්ඩල පළාත් රාජ්‍ය සේවා කොමිසම යටතේ බඳවා ගැනීමට විධිවිධාන සැලසීම හා අදාළ පුහුණුවීම් මධ්‍යම රජය මගින් සිදු කිරීම. | මධ්‍යම රජයේ අමාත්‍ය මණ්ඩලය. |
| 10. මුදල් කොමිසමේ කටයුතු වල දී පළාත් නියෝජනයක් නොමැති වීම | පළාත් නියෝජනය නොමැති වීම | පළාත් සභා නියෝජනයක් ඇති කිරීම. | පාර්ලිමේන්තුව |
| 11. බදු අයකිරීමේ සීමා පැවතීම | - | බදු පැණවීමේ හැකියාව වර්ධනය කිරීම | මධ්‍යම රජය |
| 12. පළාත් සභා නීති, ගැටලු පිළිබඳ විසඳුම් සෙවීමට නිවැරදි යාන්ත්‍රණයක් නොමැති වීම | - | පළාත් සභා සඳහා වූ නීතිපති දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කිරීම / නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවක් ඇති කිරීම. | පාර්ලිමේන්තුව |
| 13. කේන්ද්‍රය වටා එක්වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධය එක් වීම තුළින් ගැටුම් ඇතිවීම | - | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 76 වැනි වගන්තිය ඉවත් කිරීම සහ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඕ 2 වගන්තිය සංශෝධනය කිරීම | පාර්ලිමේන්තුව |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

තුන්වැනි පියවර

# මධ්‍යම පළාත් සභා නිර්දේශ

| ගැටලුව | පවත්නා තත්ත්වය | විකල්පය | වගකීම |
|---|---|---|---|
| 1. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ දෙපාර්තමේන්තු විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ | පළාත් සභාවේ එකඟතාවයකින් තොරව සිදු කරයි | 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බලගැන්වීම සහ එකඟතාවය මත චක්‍රලේඛ නිකුත් කිරීම | මුදල් ඇමතිතුමා හා භාණ්ඩාගාරයේ ලේකම්, අදාළ අමාත්‍යාංශය |
| 2. සමගාමී ලැයිස්තුව | ගැටලු ඇත. මධ්‍යම රජය පළාත් සභාව නොවිමසා කටයුතු කරයි. | සමගාමී ලැයිස්තුව අහෝසි කිරීම / අවම කිරීම | පාර්ලිමේන්තුව |
| 3. මුදල් කොමිසම බලතල ඉක්මවා කටයුතු කිරීම<br>4. වර්ෂයට වෙන් කර ඇති මුදල් වර්ෂය තුළ ලබා නොදීම<br>5. ප්‍රතිපාදන වර්ෂය මැද දී කපා හැරීම | මෙම තත්ත්වයන් දිගින් දිගටම සිදුවෙමින් පවතී | 1. විධිමත් පදනමක් යටතේ පළාත් සභා සඳහා මුදල් බෙදා හැරීම<br>2.ඇස්තමේන්තුගත මුදල් සාමූහික ප්‍රදානයක් ලෙස ලබා දීම<br>3. සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබා දෙන ප්‍රතිපාදන ඊළඟ මුදල් වර්ෂයේ මාර්තු 31 දක්වා දීර්ඝ කිරීම | මුදල් ඇමති<br>භාණ්ඩාගාර ලේකම්<br>මුදල් කොමිසන් සභාව |
| 6. ජන අනුපාතය අනුව පළාතට මුදල් ලබා නොදීම | මුදල් ලබා දීම ජන අනුපාතය නොසලකා සිදු කරයි | පළාතට ආවේනික සංවර්ධන ප්‍රමුඛතා පදනම් කරගෙන මුදල් වෙන් කිරීම | මුදල් කොමිසම<br>භාණ්ඩාගාරය |
| 7. පළාත් සභා විෂයයන් අභිබවා මධ්‍යම රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ක්‍රියාත්මක කිරීම | සිදු වෙමින් පවතී | 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව බලතල නිසි ලෙස ක්‍රියාත්මක කිරීම | ජනාධිපති අමාත්‍ය මණ්ඩලය |
| 8. පළාත් සභාවේ ප්‍රඥප්තීන් සම්මත කරගැනීමේ දී නීතිපතිගේ අනුමැතිය ලබා ගැනීම | නීතිපතිගේ නිර්දේශය / එකඟතාව ලබා ගනී | පළාත් නීති සම්පාදක මණ්ඩලයක් පත් කිරීම<br>( ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයෙකුගේ නායකත්වයෙන් යුතු) | භාණ්ඩාගාරයේ අනුමැතිය/ මුදල් |

© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

| | | | |
|---|---|---|---|
| 9. පුරප්පාඩු පිරවීම උසස් කිරීම, මාරු කිරීම, | බාධා පවතී | පළාත් රාජ්‍ය පරිපාලන ව්‍යුහයක් ස්ථාපිත කිරිම | ජනාධිපති<br>අමාත්‍ය මණ්ඩලය<br>රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| දීප ව්‍යාප්ත සේවාවන්ගේ සේවා ගැටලු | වර්තමානයේ ගැටලු සිදු වෙමින් පවතී | දීප ව්‍යාප්ත සේවාවන්ගේ පරිපාලන කටයුතු පළාත් සභාව තුළින් ම සිදු කිරීම | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව |
| 10. සමහර නිලධාරින් මධ්‍යම රජයට හා පළාත් සභාවට වගකීම | ගැටලු ඇත | - | - |
| 11. පළාත් සංවර්ධනය සඳහා කැපවූ දේශපාලනඥයින් හා නිලධාරීන් දිර්ගකාලීන ව නොසිටීම | දුනට පවතී | 1. පළාත් සභා සේවකයන් සඳහා මධ්‍යම රජයේ වරප්‍රසාද ලබා දීම<br>2. පළාත් සභාව සඳහා කෙටිකාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන සැළසුම් සකස් කර සංවර්ධනය කිරීම | මධ්‍යම රජය හා පළාත් සභාව |
| 12. නව ව්‍යවස්ථා සංශෝධන අනුව පළාත් අමාත්‍යවරු වැඩි කිරීම | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අනුව වැඩි කළ නොහැක | සමගාමී ලැයිස්තුව සංශෝධනය / අඩු කිරීම හා 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අදාළ බලතල ලබා දීමේදී පැවරුණු වගකීම් ඉටු කිරීම.<br>අමාත්‍ය මණ්ඩලය වැඩි කිරීම | පාර්ලිමේන්තුව<br>මධ්‍යම රජය |
| 13. පළාත් සභා විෂයන්ට අදාළ විදේශ ආධාර ව්‍යාපෘති මධ්‍යම රජයෙන් ක්‍රියාත්මක කිරීම | දුනට සිදු වෙමින් පවතී | පළාත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වන ප්‍රධාන ලේකම් මගින් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම | අමාත්‍ය මණ්ඩලය<br>භාණ්ඩාගාරය<br>ක්‍රම සම්පාදන අමාත්‍යංශය. |
| 14. පළාත් සභා මන්ත්‍රී වරප්‍රසාද | දුනට ඇත්තේ භාෂණයේ වරප්‍රසාද පමණි | විශේෂයෙන් පනත යටතේ පිහිටුවා අති කමිටු වල ක්‍රියාකාරිත්වය සංවර්ධනයට හා අනෙකුත් වරප්‍රසාද අපේක්ෂා කිරීමට පළාත් සභා මන්ත්‍රිරප්‍රසාද පනතක් නීති ගත කිරීම | පාර්ලිමේන්තුව |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# උතුරු මැද පළාත් සභා නිර්දේශ

| ගැටලුව | පවත්නා තත්ත්වය | විකල්පය | වගකීම |
|---|---|---|---|
| 1. කළමනාකරණ දෙපාර්තමේන්තු චක්‍රලේඛ | පුරප්පාඩු පිරවීමේ බාධා | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය දීම | ජනාධිපතිතුමා |
| 2. සමගාමී ලැයිස්තුව | නිශ්චිත නොවීම/ දීර්ඝ කිරීම | විෂයයන් අවම කිරීම | පාර්ලිමේන්තුව |
| 3. මුදල් කොමිසම බලය ඉක්මවා ක්‍රියා කිරීම | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙන් සීමා දී ඇතත් පැහැදිලි නිර්නායක නොවීම | ජාතික මුදල් කොමිසම | ජනාධිපතිතුමා |
| 4. මුදල් බෙදීමේ ගැටලු | පැහැදිලි නිර්ණායක නොවීම<br>නිසිකලට නොලැබීම<br>මුළු මුදල නොලැබීම<br>අතිරේක ප්‍රතිපාදන ගැටලු ( විශේෂ අවස්ථා)<br>පළාත් සභා නිලධාරීන්ට පහසුකම් හා ප්‍රතිලාභ ගැටලුව | ජාතික මුදල් කොමිසම<br>භාණ්ඩාගාරය | මධ්‍යම රජය |
| 5. චක්‍රලේඛ ( මධ්‍යම රජය) | පළාත් සභා සීමා ඉක්මවා යාම | පළාත් සභා කටයුතු පළාත් සභාවට දීම | ජනාධිපතිතුමා<br>පළාත් සභා අමාත්‍යාංශය |
| 6. පළාත් සභා කටයුතු මධ්‍යම රජයෙන් කිරීම | විවිධ අමාත්‍යාංශ මගින් කිරීම<br>මග නැගුම<br>රජරට සංවර්ධනය<br>ගම නැගුම | පළාත් සභා විෂයයන් පළාත් සභාවට පැවරීම | මුදල් අමාත්‍යාංශය<br>පළාත් සභා අමාත්‍යංශය |
| 7. පවරන ලද බලය ආපසු ගැනීම | ප්‍රාදේශීය ලේකම් කාර්යාල<br>ගොවිජන සේවා<br>ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම | ආපසු පැවරීම<br>පළාත් සභාව හවුල් කර ගැනීම | ජනාධිපතිතුමා<br>රාජ්‍ය පරිපාලන හා පළාත් සභා අමාත්‍යංශය |

© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

| | | | |
|---|---|---|---|
| 8. විදේශාධාර ව්‍යාපෘති මධ්‍යම රජයෙන් ක්‍රියාත්මක කිරීම | පළාත් සභාවේ අවශ්‍යතා , අධීක්ෂණ නොගැලපීම | පළාත් සභාව මගින් ක්‍රියාත්මක කිරීම | මුදල් අමාත්‍යාංශය, සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය |
| 9. ප්‍රඥප්ති සකස් කර ගැනීමේ ගැටලුව | ප්‍රඥප්ති සංඛ්‍යාව අඩු වීම<br>නීතිපති හරහා ප්‍රමුඛතා නොලැබීම | පළාත් නීතිපති<br>පරිවර්තකයින් | ජනාධිපතිතුමා |
| 10. පළාත් සංවර්ධනය සඳහා කැපවූ දේශපාලඥයින් , නිලධාරින් දිගු කාලීන ව නොමැති වීම | වරප්‍රසාද, පහසුකම්, පිළිගැනීම අඩු නිසා මධ්‍යම රජයට යාම | පහසුකම් සංවර්ධනය | මධ්‍යම රජය |
| 11. නිලධාරීන්ගේ ද්විත්ව වගකීම<br>(මධ්‍යම හා පළාත් සභාවට ) | පරිපාලන ගැටලුව<br>(අධ්‍යාපන, සෞඛ්‍ය) | පළාත් සභාවට සෘජුව වගකීම් පැවරීම | රේඛීය අමාත්‍යංශය |
| 12. නව ව්‍යවස්ථා සංශෝධන අනුව පළාත් අමාත්‍යංශයන් වැඩි නොවීම | | උපරිමය 7ක් කිරීම | , |
| 13. කැබිනට් මණ්ඩලයේ නිත්‍ය සාමාජික මණ්ඩල නම් කිරීම | පළාත් සභාවෙන් ඇති නියෝජනය ප්‍රමාණවත් නොවීම | ප්‍රධාන අමාත්‍යවරයා කැබිනට් මණ්ඩලයේ නිත්‍ය සාමාජිකයෙක් කිරීම | ජනාධිපති තුමා. |
| 14. භෞතික සම්පත් හිඟය | ඇති වත්කම් පැරණි ඒවා නිසා නඩත්තු වියදම් ඉහළ යාම<br>ප්‍රමාණවත් සම්පත් නැතිකම | වාර්ෂික අනුපාතිකව සම්පත් ලබා දීම<br>ප්‍රතිපාදන ලබා දීම<br>( වත්කම් නඩත්තුව) | මුදල් කොමිසම<br>භාණ්ඩාගාරය |
| 15. විගණන විමසුම් හා විමර්ශන | ආණ්ඩුකාරතුමාගේ බලය ඉක්මවා මධ්‍යම රජයේ චක්‍රලේඛ මත විගණන සිදුවීම | පළාත් ගිණුම් කාරක සභාව බලවත් කිරීම | ජනාධිපතිතුමා |
| 16.ප්‍රාදේශීය සංවර්ධන සැලැස්මට නිසි ප්‍රමුඛත්වය නොලැබීම | පළාත් සභාවේ සැළසුම් ඉක්මවා යන මධ්‍යම රජයේ සැළසුම් | පැවරුණු විෂයයන් තුළ කටයුතු කිරීමට අවශ්‍ය අරමුදල් පළාත් සභාවට දීම | මධ්‍යම රජය |
| 17. ජාතික ප්‍රතිපත්තිය සැළසුම්කරණයට අවකාශ පළාත් සභාවට ලබා දීම | පළාත් සභාවල හඬ ජාතික තලයේ පාර්ලිමේන්තුව තුළ නියෝජනය නොවේ | ප්‍රධාන අමාත්‍යවරයාට පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට අවකාශ සැලසීම | ජනාධිපතිතුමා |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

තුන්වැනි පියවර

# සබරගමුව පළාත් සභා නිර්දේශ

| ගැටලුව | පවත්නා තත්ත්වය | විකල්පය | වගකීම |
|---|---|---|---|
| 1. **සමගාමී ලැයිස්තුව හා සම්බන්ධ ගැටලු** | ගැටලු සහගතයි<br>උදා<br>පරිසර,සංචාරක,විදුලි | පැහැදිලිව නිර්වචනය කිරීම<br>සමගාමී ලැයිස්තුව අහෝසි කිරීම | පළාත් සභාව |
| පළාත් සභාවට පැවරුණු විෂයයන් සම්බන්ධයෙන් මධ්‍යම රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු අනවශ්‍ය ලෙස මැදිහත් වීම තුළින් පළාත් සභාව අකර්මන්‍ය කිරීමට උත්සාහ දැරීම. | බලතල පරිහරණයේදී ගැටලු පැන නැගීම. | අත්‍යවශ්‍ය මැදිහත්වීම් වැළැක්වීමට පියවර ගැනීම | මධ්‍යම රජය |
| 2. **මූල්‍ය ගැටලු**<br>i ) පැවරූ ආදායම් ප්‍රභව ප්‍රමාණවත් නොවීම | මෙම තත්ත්වය පවතී. තිබෙන ආදායම් ප්‍රභවය මත අය කර ගැනීමේ බාධා | නිෂ්පාදන සහ අපනයන බදු මගින් පළාත් වලට යම් ආදායමක් ලබා දීමට කටයුතු කිරීම. | මුදල් අමාත්‍යාංශය |
| ii) රජයේ ප්‍රදාන මත යැපීමට සිදුවීම | මෙම තත්ත්වය පවතී | ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කිරීම. | පළාත් සභාව |
| iii) ප්‍රදාන ලබාදීමේ නිර්ණායකවල අඩුපාඩු | මෙම තත්ත්වය පවතී | මුදල් පිළිබඳ තීරණ ගැනීමේ අයිතිය ලබාදීම. | මුදල් කොමිසන් සභාව පළාත් සභාව |
| iv) එකඟවූ ප්‍රදාන සඳහා නියමිත වේලාවට සහ සම්පූර්ණ වශයෙන් මුදල් ලබා නොදීම | මෙම තත්ත්වය පවතී | නිසි පරිදි මුදල් ලබා දීම. | භාණ්ඩාගාරය |
| v) නිලධාරීන් සම්බන්ධ ව වැටුප් හා දීමනා රජයේ චක්‍රලේඛ අනුව ක්‍රියාත්මක කළයුතු වූවත් ඒ සඳහා අතිරේක ප්‍රධාන නොලැබීම. | මෙම තත්ත්වය පවතී | අතිරේක ප්‍රතිපාදන ලබාදීම | මුදල් අමාත්‍යාංශය |
| vi) රජයේ සහ පළාත් සභා සේවකයන්ට පහසුකම් හා ප්‍රතිලාභ ලබාදීමේ දී පවතින විෂමතා. | මෙම තත්ත්වය පවතී<br>උදා ආපදා ණය, සෞඛ්‍ය, වැටුප් | සමාන අවස්ථා සහ ප්‍රතිලාභ ලබාදීම | මුදල් කොමිසම හා මධ්‍යම රජය |

| | | | |
|---|---|---|---|
| vii) වර්තමානයේ දී ප්‍රමාණවත් අරමුදල් නොලැබීම | ප්‍රමාණවත් අරමුදල් නොලැබේ. | ප්‍රමාණවත් පරිදි අරමුදල් ලබා දිය යුතුය. | අදාළ අමාත්‍යාංශ පළාත් සභාව |
| viii) මධ්‍යම රජය විසින් පළාත් සභාව සඳහා අරමුදල් සැපයීම අවම කර ගැනීම | පළාත් ආදායම නැවත පළාත් සභාවට නොලැබීම | පළාත් ආදායම පළාත තුළ නිසි කළමණාකාරිත්වයක් තුළ බෙදා හැරීම | මධ්‍යම රජය |
| ix) මුදල් කොමිසම බලතල ඉක්මවා කටයුතු කිරීම | මුදල් වෙන් කිරීමේ පැහැදිලි නිර්ණායක නොමැත | පැහැදිලි නිර්ණායක තීරණය කිරීම. | පළාත් සභාව සහ මධ්‍යම රජය |
| x) ජන අනුපාතය අනුව පළාතට මුදල් ලබා නොදීම | පළාත් සභා කටයුතු අනවශ්‍ය ලෙස පාලනය කිරීම | මූල්‍ය ස්වාධීනත්වය ලබා දීම | රජය<br>ජාතික මුදල් කොමිසම |
| xi) වර්ෂයට වෙන් කර ඇති මුදල් අදාළ වර්ෂයේ දී ම ලබා නොදීම | සංවර්ධන සැළසුම් අඩාල වීම | මුදල් කලට වේලාවට ලබා දීම | භාණ්ඩාගාර ලේකම් මුදල් ඇමතිතුමා |
| xii) වර්ෂයට වෙන් කර ඇති ප්‍රතිපාදන අතර මැද දී කපා හැරීම | එම තත්ත්වය පවතී | සැළසුම් ගත පරිදි මුදල් ලබා දීම | මුදල් කොමිෂන් සභාව මහා භාණ්ඩාගාරය |
| 3. **මානව සම්පත් පිළිබඳ ගැටලු** | | | |
| පුරප්පාඩු පිරවීමේදී ඇති වන බාධා | දීප ව්‍යාප්ත සේවා පුරප්පාඩු පිරවීමේදී පළාත් සභා නොසලකා හැරීම | පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය. |
| තනතුරු හා පුරප්පාඩු සම්පූර්ණ නොවීම හා ඒ සම්බන්ධ අනවශ්‍ය මැදිහත් වීම (දීප ව්‍යාප්ත සේවා නිලයන්) | ගැටලු සහගතය | බලතල පළාත් මට්ටමට පැවරීම | මධ්‍යම රජය |
| 4 ප්‍රාදේශීය පරිපාලන කටයුතු පිළිබඳව ඇති ආයතන මධ්‍යම රජයට පවරා ගැනීම | පළාත් සභා රාජකාරි ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් නොසලකා හැරීම | නැවත ප්‍රාදේශීය ලේකම් කාර්යාල<br>පළාත් සභා යටතට පත් කිරීම | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය. |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

| | | | |
|---|---|---|---|
| 5. පළාත් සභා විෂයයන්ට අදාල විදේශ ආධාර ව්‍යාපෘති මධ්‍යම රජයෙන් ක්‍රියාත්මක කිරීම | ප්‍රගතිය නොමැතිවීම,ප්‍රමාදය, මුදල් අපතේ යාම, තත්ත්ව පාලනයක් නොමැතිවීම | විදේශාධාර ව්‍යාපෘති පළාත් සභා මගින් ක්‍රියාත්මක කිරීම | අදාළ අමාත්‍යාංශ |
| 6. ගංගාධාර ආශ්‍රිතව වැලි, ඛනිජ, හා වන සම්පත් පිළිබඳ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පළාත් සභා අතරත් මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභා අතරත් බලතල ක්‍රියාත්මක කිරීමේ ගැටලු ඇතිවීම | පරිසර ගැටලු උද්ගත වී තිබීම | පළාත් සභා ප්‍රඥප්ති සකස් කර නොගැනීම | පළාත් සභාව |
| 7. සමහර නිලධාරීන් මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව යන ආයතන දෙකටම වගකීම. | මෙම තත්ත්වය පවතී. | මෙම නිලධාරින් පත් කිරීමේ බලය පළාත් සභාවට දිය යුතුය | අදාළ අමාත්‍යාංශ<br>පළාත් සභාව |
| 8. පළාත් සභා අමාත්‍යාංශයක් පිහිටුවා තිබීම | තිබීම අවශ්‍ය වුවත් භූමිකාව පිළිබඳ ගැටලු ඇත. | සම්බන්ධීකරණ කාර්යය පමණක් ඉටුකළ යුතුයි. | පළාත් සභා අමාත්‍යාංශය |
| 9. රටේ මූලික නීතිය ක්‍රියාත්මක කරවා ගැනීමට ඇති අභියෝග | නීති ක්‍රියාත්මක කිරීමේ බලතල නොමැත | නීති ක්‍රියාත්මක කිරීමේ බලතල පළාත් සභාවට පැවරීම | මධ්‍යම රජය |
| 10. ප්‍රාදේශීය සංවර්ධන සැලැස්මට නිසි ප්‍රමුඛත්වයක් නොලැබීම. | නිසි ප්‍රමුඛත්වයක් නොලැබේ | ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබාදීම | මධ්‍යම රජය හා පළාත් සභාව |
| 11. ඉහත අභියෝග නිසා බලය බෙදාහැරීමේ සංකල්පය ජනතාව අතර අප්‍රසාදය ලක්වීම | මහජනතාව අතර අප්‍රසාදය පවතී | නිසි පරිදි බලය බෙදා දීම | රජය හා පළාත් සභාව |
| 12. 13 ව්‍යවස්ථා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ලබාදුන් බලය නැවත ආපසු ලබා ගැනීමෙන් ගැටලු ඇති වී තිබේ. එමෙන්ම පොදු සේවාවන් හි වැදගත් අංශ මධ්‍යම රජය විසින් පවරාගෙන ඇති අතර සංවර්ධන ව්‍යායාමයේ අවසාන ප්‍රතිඵලය | ගැටලු සහගත වේ. මේ තත්ත්වය යටතේ ජනතාවට නිසි ප්‍රතිඵල නොලැබේ. | 13 ව්‍යවස්ථා සංශෝධනයෙන් ලබාදී ඇති බලය නැවත පළාත් සභාව වෙත ලබාදීම | මධ්‍යම රජය |

© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

| | | | |
|---|---|---|---|
| සම්බන්ධයෙන් වගකියන්නේ කවුරුන්දැයි නිශ්චිතව පැහැදිලි කර නොමැත.<br>උදාහරණ:<br>i ''මග නැගුම'' හා ''ගම නැගුම'' යනාදී ව්‍යාපෘතීන් විදේශාධාර ලබන අනෙකුත් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වීම සිදු වන්නේ ඉහළ සිට පහළට කෙරෙන සැළසුම් ඔස්සේය. | එකඟ විය නොහැක | | |
| ii . ජාතික පාසල් හා ජාතික රෝහල්වල පාලනය මධ්‍යම රජයට පවරා ගැනීමෙන් ඇති වී තිබෙන තත්ත්වය | ආයතන අතර විෂමතාවයක් ඇත. | විෂමතාව නැති කිරීම | මධ්‍යම රජය |
| iii. පළාත් සභාව යටතේ පැවති රාජ්‍ය පාලනය හා ගොවිජන සේවා විෂය මධ්‍යම රජයට පවරා ගැනීම | මධ්‍යම රජය යටතේ පාලනය වේ. | එම බලතල නැවත ලබාදීම | මධ්‍යම රජය<br>පළාත් සභා |
| 13. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ අමාත්‍යාංශ විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ | 1.අත්‍යවශ්‍ය තනතුරු පවා ඇතිකර ගැනීමට අනුමැතිය නොලැබීම<br>2.අනුමත කරන තනතුරු වලට කොන්දේසි පැනවීම | බඳවා ගැනීමේ බලය පළාත් සභාවට ලබාදීම | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව<br>පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# දකුණු පළාත් සභා නිර්දේශ

| **ගැටලුව** | **විකල්පය** |
|---|---|
| **දේශපාලන අධිකාරිය හා පළාත් හා පළාත් පරිපාලනය**<br>පළාත් සංවර්ධනය පිළිබඳ දැක්මක් (නිවැරදි) නොමැති වීම | පළාතට උචිත දැක්මක් උදෙසා අනුගත වීම. |
| පළාත් සංවර්ධනය සඳහා දිගුකාලීනව කැප වූ දේශපාලනඥයින් හා නිලධාරීන්ගේ ඌණතාව | නියමිත බලතල ලබා දී පළාත් සභාවට නිසි වටිනාකමක් ලබාදීම. පළාත් රාජ්‍ය සේවා කමිටුවක් පත් කිරීම |
| නිසි භාෂා ප්‍රතිපත්තියක් නොමැතිවීම | නිලධාරීන් පුහුණු කිරීම<br>ද්විභාෂා ප්‍රතිපත්තිය ශක්තිමත් කිරීම<br>බඳවා ගැනීමේ දී භාෂා නිපුණතාවට ප්‍රමුඛතාව ලබාදීම |
| ඇතැම් නිලධාරීන් බල අධිකාරී දෙකට ම වගකිවයුතු වීම | පළාත් සභාවන්ට පැවරුණු වගකීම් දරන නිලධාරීන් පළාත් සභාවට වගකීම<br>යැපුම් මානසිකත්වයෙන් මිදීම |
| ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ දී මන්ත්‍රීවරුන්ගේ දායකත්වය අඩුවීම (බලධාරීන්ගේ පුද්ගලික න්‍යාය පත්‍ර ක්‍රියාත්මක කිරීම) | උපදේශක කාරක සභා ශක්තිමත් කිරීම<br>නියෝජ්‍ය අමාත්‍යධූර ඇති කිරීම<br>අධීක්ෂණ මන්ත්‍රීධූර ඇති කිරීම |

**බලතල ලබාගැනීම**

| ගැටලුව | විකල්පය |
|---|---|
| 13 වන ව්‍යවස්ථාවේ හිමි බලතල ලබා නොදීම<br>දුන් බලතල ලබා ගැනීම | බලය බෙදීම නිශ්චිතව ප්‍රකාශයට පත් කිරීම (සමගාමී ලැයිස්තුව අහෝසි කිරීම)<br>ලබා දිය යුතු සියලු බලතල ලබාදීම<br>(උදා: ප්‍රාදේශීය ලේකම්) |
| විදේශ ප්‍රතිපාදන පළාත් සභාවට ඍජුව ම ලබාගත නොහැකි වීම | ප්‍රාදේශීය සංවර්ධනයට අදාලව ලැබෙන විදෙස් ආධාර / ණය පිළිබඳව ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම<br>මේ සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය මැදිහත් වීම |

## මූල්‍ය කටයුතු

| ගැටලුව | විකල්පය |
|---|---|
| මූල්‍යමය බාධා / ප්‍රශ්න | පළාත් නිශ්චිත අරමුදල් පිළිබඳව තීන්දු ගැනීමේ බලය පළාත් සභාවට පැවරීම<br><br>පළාත් වලට ලබාදිය යුතු මුදල ක්‍රමවත් නිර්ණායක මත සකසා එය ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම (උදා: ඉන්දියාව)<br><br>පළාතට ගැළපෙන නව බදු පැනවීමට පළාත් සභාවට බලය දීම<br><br>මධ්‍යම රජයෙන් බදු තීන්දු කළ ද අය කිරීමේ බලය පළාත් සභාවට පැවරීම<br><br>බදු ක්‍රමය සරල කිරිම<br><br>ප්‍රාදේශීය සභාවන්ට ඍජුව ආදායම් ලබාදීම |

## ජනතා අභිලාෂ ඉටු කිරීම

| ගැටලුව | විකල්පය |
|---|---|
| පළාත් සභා බල ප්‍රදේශවල සුළු ජන කොටස්වල අභිලාෂ නිසි පරිදි ඉටු නොවීම | මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීම<br><br>පක්ෂ නායකයින්ගේ ආකල්ප සංවර්ධනය කිරීම<br><br>සිවිල් සමාජ ශක්තිමත් කර එය බලමුළු ගැන්වීම |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# ඌව පළාත් සභා නිර්දේශ

| පවත්නා තත්ත්වය | විකල්පය | වගකීම |
|---|---|---|
| 1. රාජ්‍ය සේවය හා පළාත් රාජ්‍ය සේවය | සම තත්ත්වයට ගෙන ඒම | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හා රජයේ කැබිනට් මණ්ඩලය |
| 2. එක ම කාරණය රජය හා පළාත් සභා විසින් ඉටු කිරීම | රජය පළාත් සභාවට පවරා ඇති කාර්යයන් වලින් ඉවත් වීම. (රෝහල් මාර්ග, සමූපකාර කෘෂිකර්මාන්ත කළමනාකරණ සේවා) | අතිගරු ජනාධිපතිතුමා හා කැබිනට් මණ්ඩලය |
| 3. පළාත් සභා අය කරන බදු පළාත් පාලන ආයතන වලට ලබා දීම (ඌව පළාත් සභාවේ සතුටුදායකයි) | ප්‍රමාදයකින් තොර ව ලබා දිය යුතුය. | පළාත් මුදල් අමාත්‍යාංශය |
| 4. 13 වැනි සංශෝධනය මගින් ලබාගත් බලතල රජය ආපසු ලබා ගැනීම | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය නොකිරීමට වග බලාගැනීම. | අතිගරු ජනාධිපති තුමා, පාර්ලිමේන්තුව,<br>කැබිනට් මණ්ඩලය,<br>රාජ්‍ය නිලධාරීන් |
| 5. ගරු ආණ්ඩුකාරතුමන්ගේ භූමිකාව ගැටලු සහගතයි. | ජනතා පරමාධිපත්‍ය සහ ආණ්ඩුකාරවරයාගේ බලතල වත්මන් තත්ත්වයට ගැලපෙන සේ අර්ථ නිරූපනය කිරීම. | අතිගරු ජනාධිපති තුමා |
| 6. භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | භාෂා ප්‍රතිපත්තිය සහ ප්‍රඥප්තිය සකස් කිරීම සඳහා නිලධාරීන් හා මූල්‍ය ප්‍රතිපාදන සැලසීම (ආදිවාසීන් ඇතුළු සෙසු ජන කොටස් ද) | ප්‍රඥප්තිය සකස් කිරීම පළාත් සභාව.<br>රජය භාණ්ඩාගාරයෙන් මූල්‍ය පහසුකම් ලබා දීම.<br>කාර්ය මණ්ඩල බඳවා ගැනීමට රජයේ අනුමැතිය ලබා දීම |
| 7. පළාත් සභාවට පැවරුණු නීතිය හා සාමය පිළිබඳ විෂය ශක්තිමත් නොවීම | 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පවරා ඇති බලතල අනුව<br>පොලිස් කොමිසම<br>පළාත් නීතිපති<br>පළාත් විභාග කොමසාරිස්වරුන් පත්කිරීම | අතිගරු ජනාධිපති තුමා<br>කැබිනට් මණ්ඩලය |
| 8. සංවර්ධනය සඳහා විදේශ ආධාර සෘජුව ලබාගැනීමට නොහැකිවීම (ජාතික ආරක්ෂාවට හානි නොවන අන්දමින්) | පළාත් සභාවට විදේශ ආධාර ලබා ගැනීමට විධිමත් බල පැවරීමක් කිරීම. | අතිගරු ජනාධිපති තුමා, කැබිනට් මණ්ඩලය |
| 9. පළාතේ විශේෂ ව්‍යාපෘති වලින්, ව්‍යාපාර වලින් හා නිෂ්පාදනයන්ගෙන් විධිමත් ලෙස බදු අයකරගැනීමට හැකියාවක් නොමැතිකම. | පළාත තුළ එවැනි අවස්ථාවන්ගෙන් රජය අයකරන බදු මුදලින් සම්මත කරගන්නා ප්‍රතිශතයක් පළාත් සභාවට අය කරගැනීමට ඉඩකඩ සළසා දීම. | රජය |
| 10. පළාත් සභා මහාමාත්‍ය සමුළුවලින් | විධිමත් ව්‍යුහයක් ස්ථාපිත කිරීම | අතිගරු ජනාධිපති |

| | | |
|---|---|---|
| නිර්දේශ කරන කරුණු ක්‍රියාත්මක කිරීමට බල ව්‍යුහයක් ගොඩනැගීම | | තුමා ඇතුළු කැබිනට් මණ්ඩලය |
| 11. පළාත් සභා විෂයන් සැලසුම් කිරීම හා සංශෝධනය සහ නිර්ණායක ගොඩනැගීමේ අයිතිය නොමැතිවීම | පූර්ණ අයිතිය ලබා දීම | අතිගරු ජනාධිපති තුමා සහ කැබිනට් මණ්ඩලය |
| 12. ප්‍රධාන අමාත්‍ය වැටුප් වෙනස හා වරප්‍රසාද | කැබිනට් අමාත්‍ය වැටුපට සමකිරීම | අතිගරු ජනාධිපති තුමා |
| 13. පළාත් සභා සභාපති හා නියෝජ්‍ය සභාපති නිල නාමය | පළාත් කථානායක හා පළාත් නියෝජ්‍ය කථානායක ලෙස නම් කිරීම | අතිගරු ජනාධිපති තුමා |
| 14. 154 ඊ වගන්තිය යටතේ අමාත්‍යවරුන් 5 දෙනෙකු පත් කිරීමේ සීමාව පුළුල් විය යුතුය. | වර්තමානයට නොගැලපේ<br>අමාත්‍ය ධූර 7 දක්වා ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම. | ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය |
| 15. විශේෂඥ දැනුම මධ්‍යම රජය සතුවීම පළාත් සභාව ශක්තිමත් කිරීමට බාධාවකි | රජය විසින් පළාත් සභාවට විශේෂඥ දැනුම ලබා දීමට කටයුතු කිරීම | කැබිනට් මණ්ඩලය |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# වයඹ පළාත් සභා නිර්දේශ

| ගැටලුව | පවත්නා තත්ත්වය | විකල්පය | වගකීම |
|---|---|---|---|
| 1. බලය විමධ්‍යගත කිරීමට දක්වන අකමැත්ත හා මැලිකම | 1. පවත්නා මැතිවරණ ක්‍රමය<br>2. මධ්‍යම රජයේ නිලධාරීන්ගේ හා දේශපාලඥයින්ගේ පැවැත්ම සඳහා බලය කේන්ද්‍රගත කිරීමේ ආකල්පය<br>3. පළාත් සභාවල සිටින දේශපාලකයින්ගේ හා නිලධාරීන්ගේ මධ්‍යගත ආකල්පය<br>4. පළාත් සභාව ආකර්ෂණීය ස්ථානයක් නොවීම | 1. පළාත් සභා ලැයිස්තුවේ විෂයයන් පළාත් සභා විසින් ම ක්‍රියාත්මක කිරීමට එකඟතා ගිවිසුමක් ඇති කර ගැනීම (MOU)<br>2. ද්විත්වකරණය ඉවත් කිරීම<br>3. සමගාමී ලැයිස්තුව අවබෝධතා ගිවිසුමක් මගින් නිශ්චිතව බෙදා වෙන් කිරීම<br>4. පළාත් සභාවට පැවරුණු විෂයන් සඳහා ප්‍රඥප්ති සකස් කිරීම<br>5. පළාත් සභා අමාත්‍යාංශය අවලංගු කොට ජනාධිපතිතුමා යටතට පත් කිරීම<br>6. කාලානුරූපව අමාත්‍යාංශ වැඩි කිරීම | අතිගරු ජනාධිපතිතුමා<br>රජය<br>පළාත් සභා |
| 2. පළාත් සභා වලට මුදල් වෙන් කිරීමේ බලතල පළාත් සභා වලට නොතිබීම | 1. නිශ්චිත නිර්ණායක පදනම් කර ගෙන මුදල් වෙන් නොකිරීම<br>2. මුදල් කොමිසම මධ්‍යම රජයට ගැති වීම<br>3. පළාත් සභා විෂයන්ට අදාල මුදල් රජයේ අමාත්‍යාංශවලට වෙන් කිරීම<br>4. විදේශාධාර පළාත් සභාවලට කෙළින්ම නොලැබීම<br>5. මුදල් නියමිත කාලයට නොලැබීම හා නියමිත ප්‍රමාණය වර්ෂය අවසානයට පෙර නොලැබීම<br>උදා- 40% | 1. මැන බැලිය හැකි පැහැදිලි හා නිශ්චිත නිර්ණායකයන් අනුව මුදල් වෙන් කිරීම<br>උදා- ජන අනුපාතය මාර්ගවල දුර භූමි ප්‍රමාණය<br>ශිෂ්‍යයන් සංඛ්‍යාව<br>රෝගීන් ප්‍රමාණය<br>2. මුදල් කොමිසමට පළාත් සභා නියෝජනයක් ඇති කිරීම<br>3. ජාතික මුදල් කොමිසමක් ස්ථාපිත කිරීම (පළාත් සභාවල නියෝජනයක් ඇති කිරීම ) | 1. රජය<br>2. භාණ්ඩාගාරය<br>3. මුදල් කොමිෂම |

| | | | |
|---|---|---|---|
| 3. පළාත් සභා සේවක කළමනාකරණයට බාධා පැවතීම | 1. පත්වීම් හා බඳවා ගැනීම් වලදී රාජ්‍යය මැදිහත් වීම<br>2. වෘත්තීය සමිතිවල බලපෑම | 1. පළාත් විෂයන්ට අදාලව තනතුරුවලට අදාල තීරණ ගැනීමේ බලතල පළාත් සභාවට පැවරීම<br>2. තනතුරු සංඛ්‍යාව තීරණය කිරීමේදී නිශ්චිත නිර්ණායකයන් ඇති කර ගැනීම<br>උදා- මහජන සෞඛ්‍ය පරීක්ෂක 7500-1 | 1. රජය<br>2.කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව<br>3. පළාත් සභාව |
| 4. ජාතික ප්‍රතිපත්ති විධිමත්ව සකස් ව නොතිබීම | 1. ජාතික ප්‍රතිපත්තිය අමාත්‍යංශ මගින් තම අභිමතය පරිදි තීරණය කිරීම<br>2. ජාතික ප්‍රතිපත්තිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අනුමත කර නොතිබීම | 1. ජාතික ප්‍රතිපත්තිය පළාත් සභාවල ද එකඟතාව මත තීරණය කිරීම (පාර්ලිමේන්තු පනතක අනුමැතිය මත) | 1. රජය<br>2. පාර්ලිමේන්තුව<br>3. පළාත් සභාව |
| 5. අන්තර් පළාත් සේවා හා සම්පත් පරිහරණය පිළිබඳ විධිමත් ක්‍රමයක් නොතිබීම<br>උදා- ප්‍රවාහනය<br>ගංගා (වැලි)<br>වාරිමාර්ග | 1. පළාත් සභා මගින් විවිධ තීරණ මත කටයුතු කිරීම<br>2. ප්‍රවාහනය සම්බන්ධයෙන් ජාතික ප්‍රවාහන කොමිසම මගින් බලපෑම් ඇතිවීම | 1. අන්තර් පළාත් සභා එකඟත්වය මත කටයුතු කිරීම<br>2. අන්තර් පළාත් සභා ප්‍රවාහන ප්‍රඥප්තියක් මත කටයුතු කිරීම | 1. පළාත් සභා |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# පළාත් සභා සාර්ථක කර ගැනීම

# කාල රේඛාව



## 1988 සැප්තැම්බර් 2 සහ 8:

හිටපු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතා විසින් නිකුත් කළ නිවේදනයක් මගින් උතුරු සහ නැගෙනහිර පළාත් එක් පරිපාලන ඒකකයක් ලෙස තෝරා පත්කරගනු ලැබූ එක් සභාවක් මගින් පාලනය කරනු ලැබීමට ඉඩකඩ සැලසිණි. පළාත් දෙක ඒකාබද්ධ කෙරිණි.

ඒකාබද්ධිත පළමු උතුරු නැගෙනහිර පළාත් සභාවේ 16 මසක පාලනය දේශපාලන පැවැත්ම සඳහා වූ සටනක සහ මතභේදාත්මක තත්ත්වයක ගිලී ගියේ ය. පළාතේ පාලක ඊළාම් ජනතා විප්ලවකාරී විමුක්ති පෙරමුණ (EPRLF) සහ ඊළාම් ජාතික ප්‍රජාතන්ත්‍රවාදී විමුක්ති පෙරමුණ (ENDLF) සහ ඔවුන්ගේ ආරක්ෂකයන් වූ ඉන්දීය සාම සාධක හමුදාව විසින් ජනතාව හිරිහැරයකට පත් කරනු ලැබූ බව කියැවිණි.

## 1990 මාර්තු 1 වන දා



ඒකාබද්ධිත උතුරු නැගෙනහිර එවකට ප්‍රධාන අමාත්‍යවරයා වූ වර්ධරාජා පෙරුමාල් විසින් උතුරු නැගෙනහිර පළාත් සභාවේ විශේෂ රැස්වීමක් කැඳවා සිය පක්ෂයේ එනම් EPRLF හි ඉල්ලීම් 19ක් ඉටු කිරීම සඳහා ප්‍රේමදාස රජය වෙත අවසාන දින නිවේදනයක් නිකුත් කරයි. මීට හේතු වූයේ පළාත් සභා ක්‍රමය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක නොකිරීම ය. ඉඩම් සහ පොලිස් බලතල පරිධිය (පළාත) වෙත ලබා නොදුනි. (ලබාදුන් පොලිස් සහ ඉඩම් බලතල නැවතත් සමගාමී ලැයිස්තුව මගින් මධ්‍යම රජය වෙත ගැට ගසනු ලැබිණි.)

සිත්ගන්නා සුළු කරුණක් වූයේ ඔහු මෙම මතභේදාත්මක නිවේදනය කරන විට ත්‍රිකුණාමලය පළාත් සභා ගොඩනැගිල්ල මුදුනේ සිංහ ධජය ලෙළදීමයි.



## 1993/1994

හිටපු ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය 1993/94 කාලයේ බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය ධූරය උසුලන කාලයේ දී පොලිස් බලතල පළාත් සභාවලට පැවරිය යුතු බව දැඩි ලෙස කියා සිටි නමුත් අදාළ ගැසට් නිවේදනය අත්සන් කිරීමෙන් වැළකීමයි.

© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives



## 2006 ජූලි 26

නැගෙනහිර ජනතාවගේ අයිතීන් ආරක්‍ෂා කිරීම සඳහා වූ සංවිධානය නම් වූ ප්‍රජා කණ්ඩායම ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්‍ෂ මහතා ඔහුගේ නිල නිවස වන කොළඹ අරලියගහ මන්දිරයේ දී හමු වී උතුරු නැගෙනහිර පළාත් වෙන් කොට වෙනම පළාත් සභා දෙකක් යටතේ පාලනය කරනු ලැබිය යුතු බව ඉල්ලා සිටින ලිපියක් භාරදෙන ලදි.


The Island
LTTE bomber kills 97 unarmed sailors, injures 112
UNP agrees to join cabinet
N-E merger invalid - SC
Government to study the judgment carefully

## 2006 ඔක්තෝබර් 16

උතුරු නැගෙනහිර පළාත් ඒකාබද්ධ කිරීම නීත්‍යානුකූල නොවන්නක් සහ සහ අවලංගු වූවක් බව ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කරයි. ජනතා විමුක්ති පෙරමුණු සාමාජිකයන් වන පෙත්සම්කරුවන් තිදෙනාට, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(a)(2) වගන්තිය යටතේ නැගෙනහිර පළාත් සභාවක් තොරා පත්කර ගැනීමට අයිතිය ලබාදෙන ලදි. මෙම තීන්දුව අග්‍රවිනිශ්චයකාර සරත් එන්. සිල්වා මහතා විසින් දෙනු ලැබූයේ විනිසුරු සී. එන්. ජයසිංහ විනිසුරු, එන්. කේ. උඩලාගම විනිසුරු රාජා ප්‍රනාන්දු සහ විනිසුරු එන්. ජී. අමරතුංග යන අයගේ එකඟතාවය සහිතව ය. ජනතා විමුක්ති පෙරමුණු පාර්ලිමේන්තු මන්ත්‍රිවරු නැගෙනහිර සේරුවිල නියෝජනය කළ ජයන්ත වීරසේකර සහ නැගෙනහිර පළාතේ එල්. කේ. වසන්ත සහ ඒ. එස්. මොහොමඩ් බුහාරි යන අය පළාත් දෙක වෙන් කිරීමෙන් පසු නැගෙනහිරට වෙනම පළාත් සභාවක් ඉල්ලා කලින් පෙත්සම් ගොනුකොට තිබිණි.




## 2006 වර්ෂයේ දෙසැම්බර් 26

සුනාමි ව්‍යසනයෙන් වැඩිම අනතුරු හා අලාභහානි සිදුවූයේ නැගෙනහිර පළාතටයි.


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives



## 2007 ජූලි 11

ශ්‍රී ලාංකික හමුදාවන් දෙමළ කොටි සටන්කරුවන් ඔවුන්ගේ නැගෙනහිර අවසාන බල කඳවුරු ප්‍රදේශයෙන් පළවා හරින අතර නැගෙනහිර නිදහස් කරගනු ලැබ ඇති බව රජය නිවේදනය කරයි.

## 2008

"සන්නද්ධ බෙදුම්වාදී කණ්ඩායම් තවමත් ගැවසෙමින් සිටින අතර" පළාත් සභාවලට බලතල ලබාදීමට ජනතා විමුක්ති පෙරමුණ විරුද්ධ වෙයි. එමෙන් ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන සංශෝධනය පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීමේ රජයේ උත්සාහයට ද ඔවුන් විරුද්ධ වෙති.

## 2008 මාර්තු 13

මාර්තු 13 වැනි දා නිකුත් වූ ගැසට් නිවේදනයට අනුව නැගෙනහිර පළාත් සභා ඡන්දය සඳහා නාම යෝජනා පත්‍ර 2008 මාර්තු 23 වන දා සිට අප්‍රේල් 03 වන දා දක්වා භාරගනු ලැබීමට නියමිතව ඇත.



## 2008 මැයි 10

නැගෙනහිර පළමු වරට පැවත්වුණු නැගෙනහිර පළාත් සභා මැතිවරණයන් සඳහා ආසන 37ක් වෙනුවෙන් පක්ෂ 18ක් සහ ස්වාධීන කණ්ඩායම් 73ක් නියෝජනය කරමින් අපේක්ෂකයන් 1300කට වැඩි සංඛ්‍යාවක් තරග කරති. ප්‍රධාන සටන පවතින්නේ පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානය (UPFA) සහ ටී.එම්.වී.පී. ඇතුළු එහි සහායක පක්ෂ සහ විරුද්ධ පාක්ෂික එක්සත් ජාතික පක්ෂය හා එහි සහායකයන් වන ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය වශයෙන් වන දෙපිළ අතර ය.

## 2008 මැයි 11

ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ නායකත්වයෙන් යුතු පාලක පක්ෂය නැගෙනහිර මැතිවරණය ජයග්‍රහණය කරයි. රාජපක්ෂ මහතාගේ එක්සත් ජනතා නිදහස් සංධානය (UPFA) ආසන 20ක් දිනාගන්නා අතර විරුද්ධ පාක්ෂික එක්සත් ජාතික පක්ෂය (UNP) ආසන 15ක් දිනාගනී.



## 2008 මැයි 12

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය ප්‍රකාර රජය විසින් පොලිස් බලතල ඇතුළු සියලු බලතල නැගෙනහිර වෙත බෙදාහැරිය යුතු බව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා වන මෛත්‍රීපාල සිරිසේන ඇමතිවරයා කියා සිටී.

© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# නැගෙනහිර පළාත් සභා නිර්දේශ

| ගැටලුව | පවත්නා තත්ත්වය | විකල්පය | වගකීම |
|---|---|---|---|
| 01.අයකරන බදු බෙදා හැරීම සම්බන්ධයෙන් මුදල් කොමිසමට හෝ පළාත් සභාවට බලයක් නොමැති වීම | මහජන නියෝජිතයන් තවම නිසි පරිදි ස්ථාපිතව නැත.<br><br>සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළව බදු අයකිරීමක් සිදු නොවේ. | පූර්ණ බලය පළාත් සභාවලට ලැබිය යුතුය | මධ්‍යම රජය, පළාත් සභාව, මූල්‍ය කොමිසම |
| 02.දශක දෙකක් පළාත් සභා ක්‍රියාත්මක වුවත් බලය බෙදා හැරීම සම්බන්ධයෙන් දේශපාලන අධිෂ්ඨානයක් මධ්‍යම රජයේ නායකත්වයට නොතිබීම | ඊට අදාළව මධ්‍යම රජයේ පමණක් නොව අනෙකුත් ආයතනවල කැප වීම ද ප්‍රමාණවත් නැත.<br><br>නැගෙනහිර පළාතේ ආරක්ෂක තත්ත්වය බොහෝ තීරණ වලට බලපා ඇත. | මහජන නියෝජිතයන් හරහා රජයට බලපෑම් කළ යුතුය.<br><br>මධ්‍යම රජය එවැනි කටයුතු වලදී වඩාත් නම්‍යශීලී විය යුතුය.<br><br>පූර්ණ පළාත් සභාවක් පත් කිරීම හා අනතුරුව මධ්‍යම රජයේ නායකත්වය සමග සාකච්ඡා කිරීම. | මධ්‍යම රජය, පළාත් සභාව, රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයා |
| 03.පළාත් සභාවන් තුළ සිටින කුඩා ජන කොට්ඨාසවල අභිලාෂයන් නිසි ලෙස ආමන්ත්‍රණය කිරීමට නොහැකි වීම. | එවැනි අවශ්‍යතා පූරණය කිරීමට තරම් බලයක් නැති හේතුවෙන් නිසි ලෙස කටයුතු ඉටු නොවේ. | පූර්ණ බලතල පළාත් සභාවලට ලැබීම. | මධ්‍යම රජය |
| 04.ඉහළ සිට පහළට සැළසුම් කිරීමේ අඛණ්ඩ ක්‍රියාවලිය උදා: අයවැය සම්පාදනය හා මග නැගුම, ගම නැගුම වැනි වෙනත් විදේශ ආධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තව දුරටත් සිදු වන්නේ ඉහළ සිට පහළටය. | පළාත් සභාව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් යෝජනා ලබා ගැනේ.<br><br>ස්වාධීන ක්‍රියාමාර්ග අවම වේ. බොහෝ විට මධ්‍යම රජයේ සැළසුම් ක්‍රියාත්මක වේ.<br><br>අඛණ්ඩ ප්‍රතිපත්ති මාලාවක් ක්‍රියාත්මක නොවේ. | පළාත් සභාවට පූර්ණ බලතල ලබා දිය යුතුය. | පළාත් සභාව |
| 05.ස්වකීය ජීවනෝපායන් පිළිබඳ තීරණවල දී පුරවැසි ජනයාගේ හඬට ඉඩක් නොමැති වීම. | ප්‍රජාවගේ අදහස් සඳහා පූර්ණ ඉඩක් නැත.<br><br>නිසි යාන්ත්‍රණයක් හෝ ආකල්පයක් නැත. | පළාත් සභාව හා ප්‍රාදේශීය සභාව නිසි අවබෝධයකින් කටයුතු කිරීම.<br>පුරවැසි නියෝජනය ලබා ගත හැකි නිවැරදි යාන්ත්‍රණයක් පළාත් සභාවලට ලැබිය යුතුය | පළාත් සභාව |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

| | | | |
|---|---|---|---|
| 06.පළාත් සභා යටතේ පැවති රාජ්‍ය පරිපාලන සහ ගොවිජන සේවා විෂය ධාරාව නැවත පළාත් සභාවට අන්තර්ග්‍රහණය කිරීම. | බොහෝ පරිපාලනමය තීරණ දැනට මධ්‍යම රජය විසින් ගනු ලබයි. | දිස්ත්‍රික් ලේකම්වරයා පළාත් සභා යටතට පත් කළ යුතුය.<br><br>පළාත් සභාවලට නිතැතින්ම බලය ලබා දිය යුතුය. | මධ්‍යම රජය |
| 07.රාජ්‍ය සේවා පත්වීම්, මාරුකිරීම්, සහ උසස්වීම් සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුව සහ පළාත් සභා අතර ප්‍රතිවිරෝධතා ඇතිවීම. | දැනට මධ්‍යම රජය මගින් සිදුවේ. සමහර නිර්දේශ පළාත් සභාව මගින් යොමු කරනු ලැබේ. | රජය සතු වගකීම නිශ්චිතව විධිමත්ව හඳුනාගෙන ඒ වගකීම හැර අනෙකුත් වගකීම් හා බලතල පළාත් සභා වලට ලබා දිය යුතුය. | මධ්‍යම රජය |
| 08.ජාතික පාසල් සහ ජාතික රෝහල් වල පාලනය යළි පළාත් සභා විෂයයට ඇතුළු කිරීම. | ප්‍රධාන වගකීම මධ්‍යම රජය සතුව ඇත. | සියළු බලතල පළාත් සභා වලට ලබා දීම යෝග්‍ය වේ. ඊට අනුයුක්ත මධ්‍යම රජයේ සේවකයන් මාරු කිරීම මධ්‍යම රජය විසින් සිදු කළ යුතුය. | මධ්‍යම රජය |
| 09.මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුව සහ පළාත් සභා අතර ඇති ගැටලු නිරාකරණය | මාර්ග සංවර්ධනය පිළිබඳ දෙපාර්තමේන්තුවක් පමණක් ඇත. | පළාත් සභාවලට විධිමත් බලතල ලැබිය යුතුය. | පළාත් සභාව |
| 10.පළාත් සභාව තුළ තම නියෝජිතයන් නොමැති භූගෝලීය ජනවර්ග සහ කුල විවිධත්වය ඇති කණ්ඩායම් වල ආර්ථික හා සමාජීය අභිවෘද්ධියට අදාළ පියවර ගැනීම | මෙතෙක් අදාළ ජනතාව නියෝජනය කිරීමට සමත් මහජන නියෝජිතයන් නොසිටින බැවින් කටයුතු නිසි ලෙස සිදු නොවීය. | නව පළාත් සභා නියෝජිතයන් මගින් නිසි ක්‍රමවේදයක් හඳුනාගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. | පළාත් සභාව |
| 11.පළාතට අනන්‍ය වූ ආර්ථික සහ සංස්කෘතික සම්පත් පිළිබඳ දත්ත රැස් කරන, පර්යේෂණය කරන සහ නිසි ව්‍යාපෘති ඔස්සේ ප්‍රතිලාභ මට්ටමට ගලා යන ආයතන ව්‍යුහයක් ගොඩනැගීම. | එක් එක් අංශ වෙන ම ක්‍රියාත්මක වේ. මධ්‍යම රජයේ කාර්යයන් නිරතුරුව සිදුවේ.<br><br>දත්ත එක් රැස් කිරීම හැර ඊට වඩා පුළුල් ක්‍රියාදාමයක් නැත. | පළාත් සභාවේ මානව සම්පත් සංවර්ධනය කළ යුතුය.<br><br>එක් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් පළාත් සභාවට අදාළව බිහි කළ යුතුය.<br><br>ප්‍රධාන ලේකම්වරයා කේන්ද්‍ර කරගත් වැඩි ප්‍රතිපාදනයක් සහිත කාර්යාලයක් වීම සුදුසුය. | පළාත් සභාව |
| 12.මධ්‍යම ආණ්ඩුවේ රාජ්‍ය නිළධාරින්ට සාපේක්ෂව පළාත් රාජ්‍ය නිළධාරින් අවතක්සේරුවට ලක් කිරීම. | මධ්‍යම රජයේ නිළධාරීන් තුළ අධිතක්සේරුවක් ඇත. | පළාත් නිළධාරීන්ට සමාන අවස්ථා හා වරප්‍රසාද ලබා දීම.<br><br>නිසි පුහුණුවක් හා වරප්‍රසාද පළාතේ නිළධාරීන්ට ලබා දිය යුතුය.<br><br>අත්දැකීම්වලින් සපිරි නිළධාරීන් පළාත් සභාවට පත් කළ යුතුය | මධ්‍යම රජය සහ පළාත් සභාව |

| | | | |
|---|---|---|---|
| 13.එකම කාර්යය මධ්‍යම ආණ්ඩුව සහ පළාත් සභා දෙකෙන්ම ඉටු කිරීම. | එහෙත් බොහෝ විට එකම කාර්යය නිසි සම්බන්ධීකරණයකින් තොරව සිදු කරයි.<br><br>සමහර අංශවල ගැටලුකාරීත්වයක් නැත. මධ්‍යම රජය හා එක්ව කටයුතු ක්‍රියාත්මක වේ. | බලතල පිළිබඳ පැහැදිලි නිර්වචන අවශ්‍ය වේ.<br><br>ඒ අනුව දෙපාර්ශ්වය අතර බලතල හා කාර්යයන් පිළිබඳ මධ්‍යම රජය සමග පූර්ණ අවබෝධයකින් කටයුතු කළ යුතුය. | මධ්‍යම රජය හා පළාත් ආණ්ඩුව |
| 14. පළාත් සභා ව්‍යුහය තුළ ද ඇතැම් විෂයයන් ද්විත්වකරණයට භාජනය වීම. | නිරන්තර සාකච්ඡා පැවැත්වෙන බැවින් ඊට අවකාශ අඩුය. | පළාත් සභාව තුළදීම සාකච්ඡා කිරීම හා ඊට නිසි කාලයක් වෙන් කිරීම.<br><br>විෂය ක්ෂේත්‍රය හා යෝජිත සැළසුම් පිළිබඳ නිසි දැනුවත් කිරීම. | ප්‍රධාන ලේකම් ඇතුළු අමාත්‍යාංශ ලේකම්වරු. |
| 15. බලය බෙදා හැරීමේ නීති ක්‍රියාත්මක කිරීමට මධ්‍යම රජයේ නිළධාරි පිරිස් එරෙහි වීම. | මධ්‍යම රජයේ නිළධාරීන්ගෙන් විරෝධතා මතුවේ. | බලතල බෙදීම පිළිබඳ නිසි දැනුම හා ආකල්ප වර්ධනය කළ යුතුය.<br><br>නිවැරදි දේශපාලන මගපෙන්වීමක් අවශ්‍ය වේ.<br><br>ඒ පිළිබඳ ජාතික මට්ටමේ කතිකාවක් ඇරඹිය යුතු ය. | මධ්‍යම හා පළාත් ආණ්ඩු, දිස්ත්‍රික් ලේකම්, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සම්පාදකයන්. |
| 16. පළාතේ යටිතල පහසුකම් දියුණු කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම. | අදාළ ප්‍රධාන කාර්යයන් මධ්‍යම රජය මගින් සිදුවේ.<br>නිසක ප්‍රතිපාදන නොලැබේ.<br><br>රාජ්‍ය නොවන සංවිධානවල සාධනීය මැදිහත්වීම කෙරෙහිද අවධානය යොමු වී නැත. | මුදල් කොමිසමේ කාර්යක්ෂමතාවය වර්ධනය කළ යුතුය.<br><br>මූල්‍යමය දායකත්වය සපයන ප්‍රදානක ආයතනවලට මග පෙන්වීම සඳහා නිසි යාන්ත්‍රණයක් සකස් කළ යුතුයි. | මධ්‍යම රජය, පළාත් සභා මූල්‍ය කොමිසම |
| 17. ප්‍රතිපත්ති, සැළසුම් සහ අයවැය සැකසීම වෙන ම ඒකක ලෙස පවත්වා ගෙන යාම.<br><br>පුනරාවර්තන සහ ප්‍රාග්ධන වෙන්ව ගෙන යාම. | වෙන් වෙන්ව සිදුවේ. එහෙත් තීරණ ගැනීමේ බලයක් නැත. | අදාළ බලතල පළාත් සභාව සතු විය යුතුය.<br><br>වාර්ෂිකව ඇගයීමට ලක්වන ඒකාබද්ධ යාන්ත්‍රණයක් පළාත් සභාව තුළ ස්ථාපිත කිරීම. | මධ්‍යම රජය, පළාත් සභාව, අදාළ අමාත්‍යවරයා |
| 18. පළාතේ සේවා සැපයීමේ දී පුද්ගලික අංශ නිෂ්පාදන කෙරෙහි අවධානය යොමු නොකිරීම. | දැනට ඒ සඳහා නිසි ක්‍රම වේදයක් නැත. | නිසි කළමනාකරණයක් ඔස්සේ ඊට අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය. | පළාත් සභාව |
| 19. මුදල් කොමිසමේ කටයුතු සම්බන්ධීකරණය සඳහා එක් පළාත් සභාවකින් නියෝජිතයකු බැගින් පත් කළ යුතුය. | එවැනි නියෝජනයක් නැත. | වත්මන් තත්ත්වය විධිමත් කිරීම ප්‍රමාණවත්ය.<br><br>පළාත් සභාවල අවශ්‍යතා මූල්‍ය කොමිසම විසින් සම්පාදනය කිරීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කළ යුතුය. | ප්‍රධාන ලේකම්<br>මූල්‍ය කොමිසම<br>පළාත් සභාව<br>අදාළ අමාත්‍යවරයා |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# පළාත් සභා මූලික යෝජනා

## දෙවැනි පියවර

පළාත් සභා ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් මූලික සාකච්ඡාවක් ඒ ඒ පළාත් වල නියෝජිතයන් සමඟ වෙන වෙන ම පවත්වන ලදි. ඉනික්බිති පළාත් සභාවල මහ ඇමති ඇතුළු මහජන නියෝජිතයන් සහ ප්‍රධාන ලේකම් ඇතුළු සියලු නිලධාරීන්ගේ ද සහභාගිත්වයෙන් තෙදින වැඩමුළුව බැගින් සියලු පළාත් සභා සඳහා පැවැත්විණි.

එම වැඩමුළුවල දී පළාත් සභා ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ඇති වී තිබෙන ගැටලු, පවත්නා තත්වය, විකල්පය සහ වගකීම පිළිබඳ ව මතු වූ කරුණු සාරංශ ගත කිරීමක් මෙතැන් සිට දැක්වේ.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි හෝ එහි සම්පත් දායකයන්ගේ අදහස් කිසිවක් මෙහි නියෝජනය නො වන අතර සහභාගිත්ව ක්‍රමවේදය ඔස්සේ, ස්වාධීන ව මතු කර ගත් අදහස් පමණක් මෙහි නියෝජනය වන බව සැලකුව මනා ය.

© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

දෙ වැනි පියවර

# බස්නාහිර පළාත් සභා මූලික යෝජනා

## කණ්ඩායම් අංක 1

| ගැටලුව | පවත්නා තත්ත්වය | විකල්පය | වගකීම |
|---|---|---|---|
| 1. සමගාමී ලැයිස්තුව | ක්‍රියාත්මක ව පවතී | ඉවත් කිරීම | ජනාධිපතිතුමාගේ මැදිහත්වීම මගින් පාර්ලිමේන්තුව |
| 2. පැවරුණු බලතල සඳහා මධ්‍යම රජයේ මැදිහත්වීම | ගොවිජන සේවා හා සමූපකාර ආදී නොයෙකුත් අංශ සඳහා රේඛීය අමාත්‍යාංශය ඍජුව මැදිහත් වේ. එම මැදිහත්වීම පළාත් සභාවට පෙර මෙන් ම පවතී. | රේඛීය අමාත්‍යාංශයේ මැදිහත්වීම ඉවත් කිරීම | ජනාධිපතිතුමාගේ මැදිහත්වීම තුළින් |
| 3. භූගෝලීය පිහිටීම අනුව ඇතිවන බලපෑම | දෛනික සංක්‍රමණික ජන සංඛ්‍යාව ඉහළ යාම | i. විශේෂ බදු හා ගාස්තු පැනවීම<br>ii. අතිරේක ප්‍රතිපාදන රජයෙන් සැපයීම | ජනාධිපතිතුමාගේ මැදිහත්වීම තුළින් |
| 4. පළාත් සංවර්ධනය සඳහා ප්‍රමාණවත් මුදල් නොලැබීම. | පළාත් සංවර්ධනය සඳහා ලැබෙන ප්‍රතිපාදන අපේක්ෂිත හා එකඟවන ප්‍රතිපාදන වලින් 35% ක පමණ ප්‍රතිශතයකි. | i. විධිමත් නිර්ණායක තුළින් ජාතික ප්‍රතිපත්තියකට අනුව ප්‍රතිශතයකට අනුව මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමට අවශ්‍ය විධිවිධාන සැලසීම<br>ii. සමස්ත සැලසුම්වල ඌනතාවක් ලෙස අවශ්‍ය මුදලින් අනුරූපී ප්‍රතිශතයක් ලබා දීම. | ජනාධිපතිතුමාගේ මැදිහත්වීම තුළින් |
| 5. මුදල් කොමිසමේ කටයුතුවල දී පළාත් නියෝජනයක් නොමැති වීම | පළාත් නියෝජනයක් නොමැතිවීම | පළාත් සභා නියෝජනයක් ඇති කිරීම. | ජනාධිපතිතුමා |
| 6. ප්‍රාදේශීය පරිපාලනය චක්‍රලේඛයක් මගින් යළි මධ්‍යම රජයට පවරා ගැනීම | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් පවත්වාගෙන යෑම | ව්‍යවස්ථානුකූල බලතල පළාත් සභාවට පැවරීම | ජනාධිපතිතුමා |
| 7. ප්‍රතිපත්ති සම්පාදනයේ දී මධ්‍යම රජය හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය සඳහා යාන්ත්‍රණයක් නොමැතිවීම | සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් නොමැතිවීම | සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ඇතිකිරීම | ජනාධිපතිතුමා |

© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives 

| | | | |
|---|---|---|---|
| 8. පළාත් සභාවේ සංවර්ධන යෝජනා සම්බන්ධයෙන් ප්‍රතිපාදන ඌණතාව මධ්‍යම රජයෙන් සම්පූර්ණ නොකිරීම | සිව්වැනි කරුණ හා සම්බන්ධයි. | | |
| 9. පුරප්පාඩු පිරවීමේ දී ඇති වන ගැටලු | පළාත් සභාවට පැවරුණු විෂයයන් සඳහා ද රේඛීය අමාත්‍යාංශ බලතල පවත්වාගෙන යෑම | i. පළාත් සභාවට පැවරුණු විෂයයන් සම්බන්ධ ව තනතුරු ඇති කිරීමේ හා පුරප්පාඩු පිරවීමේ බලතල පළාත් සභාවට පැවරීම.<br>ii. පළාත් සභාවට බඳවා ගන්නා නිළධාරීන්ගේ වෘත්තීය පුහුණුව රජය මගින් කිරීම | ජනාධිපතිතුමා |
| 10. විදේශ ආධාර ලබන ව්‍යාපෘති මධ්‍යම රජයෙන් ක්‍රියාත්මක කරති. | සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම මධ්‍යම රජය මගිනි. | රජයේ සම්බන්ධීකරණයට යටත් ව මෙහෙයවීමේ හා ක්‍රියාත්මක කිරීමේ බලය පළාත් සභාවට පැවරීම. | ජනාධිපතිතුමා |
| 11. අයකරන බදු බෙදා හැරීමේ සම්බන්ධයෙන් මුදල් කොමිසමට හා පළාත් සභාවලට බලයක් නොමැති වීම. | - | - | - |
| 12. ඉහළ සිට පහළට සැලසුම් කිරීමේ අඛණ්ඩ ක්‍රියාවලිය. | - | - | - |
| 13. පොදු සේවාවන්හි වැදගත් අංශ මධ්‍යම රජයට පවරාගෙන ඇති අතර සංවර්ධන ව්‍යායාමයේ අවසාන ප්‍රතිපලය සම්බන්ධයෙන් වගකීම පැහැදිලි නැත. | - | - | - |
| 14. පළාත් සංවර්ධනය සඳහා කැපවූ නිලධාරීන් සහ දේශපාලඥයන් දීර්ඝ කාලීන ව නොසිටීම. | සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම මධ්‍යම රජය මගිනි. | ඉහත සඳහන් කළ යෝජනා ක්‍රියාත්මක වුව හොත් මෙම තත්වය ස්වයංක්‍රීය ව මගහැරේ. | |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

දෙ වැනි පියවර

# බස්නාහිර පළාත් සභා මූලික යෝජනා

## කණ්ඩායම් අංක 2

| | පවත්නා තත්ත්වය | විකල්පය | වගකීම |
|---|---|---|---|
| 1. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ඇති පරිපාලන හා මූල්‍ය බාධක | මධ්‍යම රජය හා පළාත් අමාත්‍යාංශ නිකුත් කරන උපදෙස් හා චක්‍රලේඛවල පරස්පර බව.<br>1 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම.<br>ගුරු උපදේශකවරු පත්කිරීම.<br>මෙම චක්‍රලේඛ නිසා<br>ප්‍රඥප්ති ක්‍රියාත්මක කිරීමට අපහසු වීම. | පළාත් සභා නීති රීති උල්ලංඝනය කිරීම, චක්‍රලේඛ සඳහා උපදේශක කාරක සභා, පළාත් සභාවේ අනුමැතිය ලබාගැනීම. | ප්‍රධාන ලේකම් හා අමාත්‍යාංශය<br>පළාත් සභාව |
| 2. මූල්‍ය ප්‍රතිපාදන මධ්‍යම රජය මගින් ලබා දීමේ දී පැහැදිලි ප්‍රතිපත්තියක් නොමැතිවීම | වාර්ෂිකව එකඟ වන මුදල් නොලැබීම. (2007-35% ප්‍රතිපාදන ලැබී ඇත.) | ජන අනුපාතය, භූමි ප්‍රමාණය වැනි නිර්නායකයන් අනුව මුදල් ප්‍රතිශතයක් වෙන් කිරීම. | මුදල් අමාත්‍යාංශය / මුදල් කොමිසම් සභාව |
| 3. නව සංවර්ධන අභියෝගයන්ට සරිලන ප්‍රතිපත්ති සහ සැලසුම් ක්‍රමානුකූල ව ඉදිරිපත් නොවීම | වාර්ෂික සැලසුම් නිශ්චිත කාල සීමාවක් සකස් නොකිරීම. දීර්ඝ කාලීන නිශ්චිත සැලසුම් ක්‍රම වේද නොතිබීම. | සැලසුම් උපදේශක මණ්ඩලයක් පිහිටුවීම.<br>පර්යේෂණ අංශයක් ස්ථාපිත කිරීම.<br>හඳුනාගත් ව්‍යාපෘති සඳහා ස්ථිරවම ප්‍රතිපාදන ලබා දීම | පළාත් සභා අමාත්‍යාංශ<br>බස්නාහිර පළාත් සභාව |
| 4. ප්‍රාදේශීය පරිපාලන ව්‍යුහය තුළ පළාත් සභා බලතල ක්‍රියාත්මක නොවීම | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් පළාත් සභා කාර්යයන් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් සහයෝගයක් නොලැබීම | පළාත් ප්‍රාදේශීය පාලන ව්‍යුහයක් ප්‍රාදේශීය වශයෙන් ඇති කිරීම. | පළාත් සභාව / මුදල් අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 5. නිලධාරීන් පළාත් සභාව තුළ රඳවා ගැනීමේ අපහසුතාව | පළාත් සභාව තුළ සේවය කරන නිළධාරීන් තෘප්තිමත් නොවීම. | උසස්වීම්, තනතුරු නාම සහ විදේශ ශිෂ්‍යත්ව හා මධ්‍යම රජයේ නිලධාරීන්ට හිමි වරප්‍රසාද ලබා දීම. | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ |
| 6. සමගාමී ලැයිස්තුවේ විෂයයන් පිළිබඳ පවතින අර්බුද | විෂයයන් බෙදී යාම පැහැදිලි නොවීම. | සමගාමී ලැයිස්තුවේ විෂයයන් පළාත් සභා / මධ්‍යම රජයේ ලැයිස්තුවට ඇතුළත් කිරීම. | පළාත් සභාව<br>මධ්‍යම රජය |
| 7. පළාත් සභා විෂයය ලැයිස්තුව සඳහා ද මධ්‍යම රජයේ ඇමතිවරු පත්කිරීම | පළාත් සභා විෂයයන් මධ්‍යම රජයෙන් ද ක්‍රියාත්මක කිරීම. | එම විෂයයන් පළාත් සභා මගින් පමණක් ක්‍රියාත්මක කිරීම. | මධ්‍යම රජය<br>පළාත් සභාව |
| 8. ජාතික පුවත්පත් විසින් - දෙවැනි කොට සැලකීමක් සිදුවේ. රැස්වීම් වාර්තා නිවැරදිව නිසි වෙලාවට පළ නොකෙරේ | පළාත් සභා වැඩසටහන්වලට නිසි ප්‍රතිචාරයක් නොලැබීම. | පළාත් සභාවට අනන්‍ය වන මාධ්‍ය අංශයක් ඇති කිරීම. | පළාත් සභාව |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

### දෙ වැනි පියවර

# බස්නාහිර පළාත් සභා මූලික යෝජනා

## කණ්ඩායම් අංක 3

| ගැටලුව | පවත්නා තත්ත්වය | විකල්පය | වගකීම |
|---|---|---|---|
| 1. බල සීමා නිශ්චිත ව හඳුනා නොගැනීම | තිබෙන බලතල ක්‍රියාත්මක නොකිරීම. සමහර විෂයයන් සම්බන්ධ ප්‍රඥප්ති සකස් කිරීම. | විධිමත් නීතිමය රාමු හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම. | පළාත් සභා / ප්‍රධාන ලේකම් / පළාත් අවසාන ලේකම්වරු හා අනෙකුත් නිලධාරීන් |
| 2. ද්විත්වකරණය | පළාත් සභා ලැයිස්තුව හා සමගාමී ලැයිස්තුව එක ම විෂයයන් ක්‍රියාත්මක කිරීම. උදා:- ඉඩම්, අධ්‍යාපන, පොලිස් බලතල, පරිවාස, සමූපකාර, සමාජ සේවා | සමගාමී ලැයිස්තු අවලංගු කර එම විෂයයන් පළාත් සභාව යටතට පැවරීම. | පාර්ලිමේන්තුව/ අතිගරු ජනාධිපති තුමා |
| 3. පළාත් සභාව හා මධ්‍යම ආණ්ඩුව ප්‍රතිපත්තිමය වශයෙන් වෙනස් මත දරන විට සමගාමී ලැයිස්තුව ක්‍රියාත්මක කිරීමට ඇති අපහසුව | විරුද්ධ මතවාද දුරීම හා පළාත් සභා ක්‍රමය ශක්තිමත් කිරීමට සහයෝගය නොදැක්වීම. | සමගාමී ලැයිස්තුව අවලංගු කිරීම. | පාර්ලිමේන්තුව/ අතිගරු ජනාධිපති තුමා |
| 4. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බලය ක්‍රියාත්මක කිරීමේ දී ආණ්ඩුවේ මැදිහත් වීම. | බල සීමා අභිබවා පළාත් සභා කටයුතු කෙරෙහි මධ්‍යම රජය මැදිහත් වීම. | නිශ්චිත ව බලතල වෙන්කිරීම හා සීමා හඳුනා ගැනීම. | මධ්‍යම රජය |
| 5. මූල්‍ය බලතල ප්‍රමාණවත් ලෙස ලබා නොදීම<br>උදා: මුදල් කොමිසම | භාණ්ඩාගාරය හා මුදල් කොමිසම පාලනයට යටත්වීම.<br>විධිමත් නිර්ණායක,විධිමත් යාන්ත්‍රණයක් හා මූල්‍ය සම්පත් නොතිබීම.<br>මධ්‍යම රජයේ කටයුතු සඳහා වැඩි මුදල් ප්‍රතිශතයක් යෙදවීම. | පළාත් සභා අනන්‍යතාව මත හඳුනාගත් නිර්ණායක මත ප්‍රතිශත හඳුනාගෙන සම්පත් බෙදා හැරීම.<br>පළාත් සභාව තුළ බලය තව දුරටත් විමධ්‍යගත කිරීම. | මධ්‍යම රජය / පළාත් සභාව |
| 6. සම්පත් බෙදාහැරීමේ යාන්ත්‍රණයක් නොතිබීම (තිරස් හා සිරස් අතට සම්පත් බෙදාහැරීමට අදාළ ව) | යාන්ත්‍රණයක් හඳුනාගෙන නොතිබීම. | පළාත් ආණ්ඩුවේ නියෝජනයක් ලබා දීම හා අවශ්‍යතා හඳුනා ගැනීම සහ සම්පත් බෙදා හැරීමට පළාත් සභා කමිටුවක් ස්ථාපනය කිරීම. | මධ්‍යම රජය / පළාත් සභාව |

| | | | |
|---|---|---|---|
| 7. පළාත් සභාවල සේවය කරන දීපව්‍යාප්ත සේවා නිලධාරීන් සම්බන්ධ ව විනය පාලනය මධ්‍යම ආණ්ඩුව මගින් සිදු කිරීම. | විනය පාලනය මහ ආණ්ඩුව, රාජ්‍ය සේවා කොමිසන් සභාව ක්‍රියාත්මක කිරීම. | ස්ථාවර පළාත් රාජ්‍ය සේවා ක්‍රමයක් ස්ථාපිත කිරීම. | මධ්‍යම රජය / පළාත් සභාව |
| 8. මධ්‍යම ආණ්ඩුවේ දේශපාලන අධිකාරිය පළාත් සභා ක්‍රමය ශක්තිමත් කිරීමට කැමැත්තක් නොදැක්වීම. | පළාත් සභා ක්‍රමය පිළිබඳව හා එය ශක්තිමත් කිරීමට අවබෝධයක් නොතිබීම. | දේශපාලන අධිකාරිත්වය හා මධ්‍යම රජයේ නිලධාරීන්ගේ ආකල්ප වෙනස් කිරීමට දැනුවත්භාවය ලබා දීම. | මධ්‍යම රජය / පළාත් සභාව |
| 9. ඉහළ ජන ඝනත්වය | සෞඛ්‍ය, ආර්ථික සමාජීය හා දේශපාලන ගැටලු පැන නැගීම | සැලසුම් ප්‍රතිපත්ති සකස් කිරීමේ දී මේ සඳහා වැඩි සැලකිල්ලක් දැක්වීම. | පළාත් සභාව |
| 10. පළාත් නීති (ප්‍රඥප්ති) රජයේ නිලධාරීන් විසින් පිළිගැනීමට ඇති අකැමැත්ත. | සහයෝගය සහ කැපකිරීම ප්‍රමාණවත් අයුරින් ලබා නොදීම. | ආකල්පමය වෙනසක් ඇති කිරීම, ස්ථාවර පළාත් රාජ්‍ය සේවා ඇති කිරීම හා රාජ්‍ය සේවකයන්ට සමාන අවස්ථා ලබා දීම. | මධ්‍යම රජය / පළාත් සභාව |
| 11. පළාත් සභා අමාත්‍යාංශ වැඩි කිරීම | අමාත්‍යාංශ වෙන් කිරීමේ ස්ථාවර ක්‍රමයක් නොතිබීම, අවශ්‍යතාව මත හා පාලනයේ පහසුව මත අමාත්‍යාංශ වෙන්වීමක් සිදු නොවීම. | විධිමත් ක්‍රමවේද හඳුනා ගැනීම, පළාත් සභා පනත යටතේ සිදු විය යුතුය. විෂයය ප්‍රමාණය හා එකිනෙකට සම්බන්ධ විෂයයන් එක් අමාත්‍යාංශයකට පැවරෙන ආකාරයට. | මධ්‍යම රජය / පළාත් සභාව |
| 12. පළාතට අනන්‍ය වූ ආර්ථික සහ සංස්කෘතික සම්පත් පිළිබඳ දත්ත රැස්කරන / පර්යේෂණ කරන සහ නිසි ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන ව්‍යුහයක් නැතිකම | ආයතනික ව්‍යුහයක් නොතිබීම. | සුදුසු ආයතනික ව්‍යුහයක් ඇති කිරීම. | පළාත් සභාව |
| 13. භාෂා ප්‍රතිපත්තිය ප්‍රායෝගික තලයට ගෙන ඒමට නොහැකි වීම. | භාෂා ප්‍රතිපත්ති විධිමත් ව ක්‍රියාත්මක නොවීම. | ශක්තිමත් නීතිමය ප්‍රතිපාදන සැකසීම හා අදාල පහසුකම් ලබා දීම. | මධ්‍යම රජය |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

| | | | |
|---|---|---|---|
| 14. පළාත් සභාව තුළ තම නියෝජිතයන් නොමැති භූගෝලීය, ජනවර්ග සහ කුල විවිධත්වය ඇති කණ්ඩායම්වල ආර්ථික හා සමාජීය අභිවෘද්ධිය. | කුල, ජන වර්ග, ආගම් අනුව පුළුල් නියෝජනයක් සිදු නොවීම. | සුදුසු නියෝජනයක් ලබා දීම. | මධ්‍යම රජය / පළාත් සභාව |

© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# බස්නාහිර පළාත් සභා මූලික යෝජනා

## කණ්ඩායම් අංක 4

| ගැටලුව | විකල්පය | වගකීම |
|---|---|---|
| 1. බල ව්‍යුහය තුළ මධ්‍යය, කේන්ද්‍රයට වඩා සමීප ව තිබීම. | - නීතිමය වශයෙන් පැහැදිලි ලැයිස්තු දෙකක් යටතේ විධිවිධාන ඇතිකිරීම හා එය හඳුනා ගනිමින් ක්‍රියා කිරීම | පාර්ලිමේන්තුව |
| 2. සැබෑ ලෙස බලය බෙදීමට ඇති අකැමැත්ත | සැබෑ ලෙස බලය බෙදා දීම | පාර්ලිමේන්තුව |
| 3. ප්‍රාදේශීය පරිපාලනයට අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පළාත් සභාවෙන් ඉවත් වීම | ප්‍රාදේශීය පරිපාලනය පළාත් සභාවට පැවරීම | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
| 4. ජාතික පාසල් තුළ ප්‍රාථමික අංශ ඇතුළත් කිරීමෙන් පළාත් සභා පරිපාලනයෙන් ඉවත් ව තිබීම | සමස්ත පාසල් පද්ධතිය පළාත් සභාවට පැවරීම | පාර්ලිමේන්තුව |
| 5. මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමේ දී මුදල් කොමිසම අනවශ්‍ය ලෙස මැදිහත්වීම, ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොකිරීම. | මුදල් කොමිසම සඳහා පළාත් මට්ටමින් නියෝජිතයන් පත් කිරීම හා ජාතික ඇයවැයෙන් නිශ්චිත ප්‍රතිශතයක් වෙන් කිරීම. | මුදල් අමාත්‍යාංශය |
| 6. රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහයෝගයෙන් කටයුතු නොකිරීම. | පළාත් සභා විමධ්‍යගත විෂයයන්ට අදාල මධ්‍යම රජය යටතේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඇති නොකිරීම. | විධායකය හා අමාත්‍ය මණ්ඩලය |
| 7. එකම කාර්යයක් සිදු කිරීමට මධ්‍යම හා පළාත් වශයෙන් කණ්ඩායම් දෙකක් තිබීම. | | |
| 8. පළාත් සභා දෙවන පංතියෙහි ලා සැලකීම හා ජනමාධ්‍ය විසින් නොසලකා හැරීම | පළාත් සභා පිළිබඳ දූනට පවත්නා ආකල්ප වෙනස් කිරීමේ වැඩපිළිවෙළක් ඇති කිරීම. | පළාත් සභාව |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

| | | |
|---|---|---|
| 9. කාර්ය මණ්ඩල අනුමත කිරීමේ දී අදියර කිහිපයකට සිදුවීම වීම නිසා අවශ්‍යතාව ඇතත් බඳවාගැනීම් කළ නොහැකි ය. සෞඛ්‍ය සේවයේ බඳවාගැනීම් මධ්‍යම ආණ්ඩුව හරහා සිදුවේ. සියලු පළාත්වලට ඒ ගැටලුව පවතී. මධ්‍යම රජයට ඒ ගැටලුව නොමැත. පොලිස් බලතල පවරා නොදීම ද ගැටලුවකි. | පළාතට අදාල සියලු කාර්ය මණ්ඩල පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව යටතේ බඳවා ගැනීමට විධිවිධාන සැලසීම. | මධ්‍යම රජයේ අමාත්‍ය මණ්ඩලය |
| 10. අධිකරණයෙන් පළාත් සභාවට දී ඇති බලය<br>- පළාත් සභා පනත ශ්‍රේෂ්ඨාධිකරණයට ගිය මොහොතේ ඒ ගැන පළ වූ මතය ද ප්‍රශ්නකාරී ය. 13 වැනි සංශෝධනය අනුව ව්‍යවස්ථාදායක බලය බෙදී ඇතත් එය ප්‍රායෝගිකව නොපෙනේ. බරපතළ අවාසිදායක තත්ත්වයකි. | නිශ්චිත බලතල පැවරීමක් සහිතව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. | පාර්ලිමේන්තුව |
| 11. ජාතික පාසැල් හා ජාතික රෝහල් මධ්‍යම රජයේ පාලනයට ගැනීම | පළාත් සභා යටතට බලතල පැවරෙන පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම | පාර්ලිමේන්තුව |
| 12. විශේෂඥ දැනුම ඇති මානව සම්පත් මධ්‍යම රජය සතුකරගෙන සිටීම. | - | - |
| 13. ජාතික හා පළාත් සම්බන්ධයෙන් ස්ථාවර ප්‍රතිපත්තියක් නොතිබීමෙන් විවිධ පක්ෂ බලයට පත්වීමේ දී අමාත්‍යවරුන් අනුව ප්‍රතිපත්ති වෙනස් වේ. | සෑම විෂයයක් සම්බන්ධ ව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම. | පාර්ලිමේන්තුව |
| 14. නිලධාරි හිඟය | - | - |
| 15. කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පටිපාටියේ දුර්වලතා. | - | - |

දෙ වැනි පියවර

# උතුරු මැද පළාත් සභා මූලික යෝජනා

## කණ්ඩායම් අංක 1

| | ගැටලුව | පවත්නා තත්ත්වය | විකල්පය | වගකීම |
|---|---|---|---|---|
| 1. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ දෙපාර්තමේන්තු විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ | A: තනතුරු අනුමත කරගැනීමේ දී හා පුරප්පාඩු පිරවීමේ දී ඇතිවන බාධාවන්<br>B: තනතුරු අහෝසි කිරීම | පළාත් රාජ්‍ය සේවා කොමිසමට අවශ්‍ය කටයුතු කිරීමට අවකාශ ලබාදීම | අතිගරු ජනාධිපතිතුමා |
| 2. | සමගාමී ලැයිස්තුව | A: සමගාමී ලැයිස්තුවට අයත් විෂයයන් ක්‍රියාත්මක කිරීමේදී පිළිගත් යාන්ත්‍රණයක් නොමැති වීම.<br>B: පළාත් සභා ලැයිස්තුවේ ඇති විෂයය සමගාමී ලැයිස්තුවේ ද තිබීම. | A: සාමගාමී ලැයිස්තුව අහෝසි කිරීම | පාර්ලිමේන්තුව |
| 3. | මුදල් කොමිසම බලතල ඉක්මවා කටයුතු කිරීම | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිශ්චිතව සඳහන් සීමා තිබියදී එය ඉක්මවා මුදල් කොමිෂන් සභාව කටයුතු කිරීම. (උදා: පළාත් සභාවේ දෙපාර්තමේන්තු හා තනතුරු අහෝසි කිරීම) | ආ.ක්‍ර.ව්‍ය.ස. නිශ්චිතව සඳහන් බලතල නො ඉක්මවා කටයුතු කිරීම. | අතිගරු ජනාධිපතිතුමා |
| 4. | ජන අනුපාතය අනුව පළාතට මුදල් ලබා නොදීම | මුදල් කොමිසම නිබඳව ව්‍යවස්ථාවේ සඳහන් නිර්නායකයන්ට අදාළ ප්‍රතිපත්ති යාවත් කාලීන නොකිරීම.<br>- ජාතික පාසල් හා පළාත් සභා පාසල්වල සිටින ළමුන් කතුව ගෙන මුදල් වෙන් නොකිරීම.<br>- මධ්‍යම රජයේ හා පළාත් සභාවේ රෝහල්වල රොගීන් ගණන සැලකිල්ලට ගෙන මුදල් වෙන් කිරීම | පළාත් සභා විෂයයන්ට අදාළ සියලු ප්‍රතිපාදන ලබාදීම | මහ භාණ්ඩාගාරය, මුදල් කොමිෂම, මුදල් ඇමතිතුමා. |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

| | | | |
|---|---|---|---|
| 5. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හා අනෙකුත් අමාත්‍යාංශ විසින් නිකුත් කරන චක්‍රලේඛ | පළාත් සභාව තුළ ආයතන අධ්‍යක්ෂකවරුන් වනුයේ ආණ්ඩුකාර තුමාය. එහෙත් එම බලතල සඳහන් අනුෂාංගික පනත අභිබවා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවටත් පළාත් ප්‍රධාන ලේකම්වෙත චක්‍ර ලේඛ නිකුත් කිරීම | ගරු ආණ්ඩුකාර තුමාට පළාත්. රා.සේ.කා සහ ප්‍රධාන ලේකම්ට අදාළ බලතල ක්‍රියාත්මක කිරීමට ඉඩදීම | අතිගරු ජනාධිපතිතුමා<br>පළාත් සභා අමාත්‍යාංශය |
| 6. වර්ෂයට වෙන් කර ඇති මුදල් වර්ෂය තුළදී ලබා නොදීම | වාර්ෂික මුදල් ප්‍රකාශයට ඇතුළත් කිරීමට එකඟ වූ ප්‍රතිපාදන වලට සමාන වටිනාකම් ලබා නොදීම (විශේෂයෙන් සංවර්ධන වැඩ සටහන් වලදී) | එකඟවූ පරිදි අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීම | මුදල් කො.ස. මහා භාණ්ඩාගාරය පළාත් සභා අමාත්‍යාංශය. |
| 7. වර්ෂයට වෙන්කර ඇති ප්‍රතිපාදන අතර මැද දී කපා හැරීම | 2007 වර්ෂයේදී 13% කින් ප්‍රතිපාදන කපා හැරීම. එවැනි තත්ත්වයන් තුළදී සංශෝධන ප්‍රඥප්තිය ඉදිරිපත් කිරීමේදී සම්මත නොවුණහොත් පළාත් සභාව මහත් අවදානකමට පත්වීම | වර්ෂයට අදාළ ප්‍රතිපාදන සියල්ල ලබාදීම හා ඒ පිළිබඳ වර්ෂ මුලදී සනාත කිරීම. | ප.ස.අමාත්‍යාංශය, මු.කො.ස හා මහා භාණ්ඩාගාරය. |
| 8. පළාත් සභා විෂයයන් අභිබවා මධ්‍යම රජයේ අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු විසින් ක්‍රියාත්මක කිරීම | පළාත් සභා විෂයයන්ට අදාළව මධ්‍යම රජයෙන් අමාත්‍යාංශ පිහිටුවා තිබීම හා මධ්‍යම රජයේ අමාත්‍යංශ විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම. (මඟනැගුම, ගම නැගුම, කෝප්සිටි ආදී) | පළාත් සභා විෂයයන්ට අදාළ සියලු මූල්‍ය ප්‍රතිපාදන පළාත් සභාව වෙත ලබා දීම. | මුදල් අමාත්‍යාංශ, මහා භාණ්ඩාගාරය පළාත් සභා අමාත්‍යාංශය. |
| 9. පුරප්පාඩු පිරවීමේදී ඇති වන බාධා | A: පළාත් සභාව කාර්ය මණ්ඩල අවශ්‍ය හා තීරණය කර බඳවා ගැනීමට පළාත් සභාවට නොහැකි වීම.<br>B: තනතුරු අනුමත කළ ද අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා නොදීම.<br>C: පළාත් සභාව විසින් අයදුම් කර නොමැති කාර්ය මණ්ඩලයක් මධ්‍යම රජය විසින් බඳවා ගෙන පළාත් සභාවට අනුයුක්ත | බඳවා ගැනීමේ බලතල ප.රා.සේ.කා. වෙත ලබා දීම. | පළාත් සභා අමාත්‍යාංශ, මුදල් කොමිෂම, මහ භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය. |

| | | | |
|---|---|---|---|
| | කිරීම. මේ නිසා පළාත් සභාව විසින් විභාග පවත්වා බඳවා ගැනීමට ඇති උපාධිධාරීන්ට අවස්ථාවක් නොලැබීම. මේ නිසා පළාත් සභාව මහත් අපහසුතාවකට පත්වීම. | | |
| 10. ප්‍රාදේශීය පරිපාලන කටයුතු පිළිබඳව ඇති ආයතන මධ්‍යම රජයට පවරා ගැනීම | ප්‍රාදේශීය පරිපාලනයේ දී පළාත් සභා විෂයයන් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය ලේකම් හා එම කාර්ය මණ්ඩලය මධ්‍යම රජයට පවරා ගැනිම. | ප්‍රා.ලේ.කා හා එම කාර්ය මණ්ඩලය පළාත් සභාව යටතට පැවරීම. | අතිගරු ජනාධිපති තුමා, රාජ්‍ය පරිපාලන අමාත්‍ය, පළාත් සභා අමාත්‍ය. |
| 11. පළාත් සභා විෂයයන්ට අදාල විදේශ ආධාර ව්‍යාපෘති මධ්‍යම රජයෙන් ක්‍රියාත්මක කිරිම | i පළාත් සභා අමාත්‍යාංශය විසින් ප්‍රාදේශිය සභා මාර්ග ඉදි කිරීම.<br>ii ජාතිය ගොඩනැගීම අමාත්‍යාංශ විසින් (NEAP) යළි පුබුදමු වැඩ සටහන් යටතේ පළාත් සභා විෂයයන්ට අදාළ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.<br>iii අධ්‍යාපන අමාත්‍යාංශ<br>iv වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය විසින් PECEව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.<br>කෘෂිකර්ම හා ගොවිජන සේවා අමාත්‍යාංශය IFAD ව්‍යාපෘතිය ක්‍රියත්මක කිරිම.<br>v අධ්‍යාපන හා සෞඛ්‍ය අමාත්‍යාංශ වලින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. | පළාත් සභා පනතේ 22වන වගන්තිය ප්‍රකාරව විදේශ ආධාර ව්‍යාපෘති පළාත් සභා මගින් ක්‍රියාත්මක කිරීම. | සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය. මුදල් අමාත්‍යාංශය, විදේශ කටයුතු දෙපාර්තමේන්තුව, විදේශ ව්‍යාපෘති අමාත්‍යාංශය. |
| 12. පළාත් සභාවේ ප්‍රඥප්තීන් සම්මත කරගැනීමේ දී නීතිපතිගේ අනුමැතිය අවශ්‍ය වීම බාධාවකි. | පළාත් සභා ප්‍රඥප්තීන් නීතිපති වෙත ඉදිරිපත් කළයුතු බවට සඳහන්ව නැතත් සම්ප්‍රදාය අනුව නීතිපති විමසීමේ දී පරස්පර නිර්දේශ ලබා දීම. (නි.දෘ: ඉඩම් ප්‍රඥප්තීන්) | පළාත් සභා සඳහා සම්පාදිත නීති කෙටුම්පත් මණ්ඩලයක් පත් කිරිම හා ඒ මඟින් ප්‍රඥප්ති නිර්දේශ ලබා ගැනීම.<br>පළාත් සභා ප්‍රඥප්ති සම්පාදනය සඳහා විධිමත් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම. | අතිගරු ජනාධිපති තුමා, |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

| | | | |
|---|---|---|---|
| 13. ගංගාධාර ආශ්‍රිතව වැලි, ඛනිජ, හා වන සම්පත් පිළිබඳ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පළාත් සභා අතරත් මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභා අතරත් බලතල ක්‍රියාත්මක කිරීමේ ගැටලු ඇතිවීම | අන්‍යාකාරයෙන් පළාත් සභා බලතල ක්‍රියාත්මක කිරීම (උදා: ගංගා දෝනි අධිකාරිය පනත ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීමේ සම්පත් දෙපාර්තමේන්තුව විසින් කරන ලද 05/2001 චක්‍රලේඛය. | 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සක්‍රිය ආකෘතීන් වල ආකාරයෙන් බල ගැන්වීම | පාර්ලිමේන්තුව සහ අතිගරු ජනාධිපති තුමා. |

# උතුරු මැද පළාත් සභා මූලික යෝජනා

## කණ්ඩායම් අංක 2

| ගැටලුව | පවත්නා තත්ත්වය | විකල්පය | වගකීම |
|---|---|---|---|
| 1. 13 වැනි ව්‍යවස්ථා සංශෝධනයට අනුව පළාත් බලතල නිසි ලෙස නොපැවරීම පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නිසි ලෙස නොසැලසීම හා රජයේ මැදිහත්වීම | එම තත්ත්වයම පවතී | රජයට බලපෑම් කිරීම අධිකරණයට යාම | පළාත් සභාව පුරවැසියන් |
| 2. මානව සම්පත් නිසි ලෙස ලබා ගැනීමට ඇති බාධා හා නොහැකියා | විවිධ චක්‍රලේඛ මඟින් සීමා පැනවීම මූල්‍ය සීමා | රජයට බලපෑම් කිරීම අධිකරණයට යාම | පළාත් සභාව පුරවැසියන් |
| 3. පළාත සංවර්ධනය සඳහා ම කැපවූ නිලධාරීන් සහ දේශපාලඥයන් දීර්ඝ කාලීනව රැඳී නොසිටීම. | වරප්‍රසාද හා පහසුකම් පිළිගැනීම අඩුකම | පහසුකම් හා වරප්‍රසාද පිළිගැනීමට අවශ්‍ය කටයුතු සැලසීම | මධ්‍යම රජය |
| 4. සමහර නිලධාරීන් මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාවට වගකීම. | මෙම තත්ත්වය පවතී. ඒ මත පරිපාලනමය ගැටලු ඇති වේ. උදා - අධ්‍යාපන සෞඛ්‍ය | මධ්‍යම රජය වෙත ඇති අදාළ බලතල පළාත් සභාව වෙත පැවරීම | අදාළ රේඛීය අමාත්‍යාංශ |
| 5. නීතිමය කටයුතු සඳහා දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තකයන් නොමැතිවීම. | සියලුම ලිපි කටයුතු සිංහල භාෂාවෙන් පමණක් සිදු වේ | අදාළ නිලධාරීන් පත් කිරීමට ඇති බාධා ඉවත් කිරීම මු.රෙ. 71 අනුමැතිය ආණ්ඩුකාරතුමා වෙත පැවරීම | මධ්‍යම රජය |
| 6. පළාත් සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන පළාත් සභාව තුළ තම නියෝජනයක් නොමැති ජන කොට්ඨාස, තුළ | බරපතල ගැටලුවක් නොවේ | පළාත් පාලන ආයතන මඟින් සුදුසු නියෝජනයක් ලබාදීම | පළාත් බද දේශපාලන නායකත්වය |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

| | | | |
|---|---|---|---|
| කණ්ඩායම් සහ භූගෝලීය වශයෙන් සීමා වූ ජන කොටස්වල අභිලාෂ ඉටු නොවීම. | | | |
| 7. නව ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාත් සභා අමාත්‍යාංශය වැඩි කිරීම | අවශ්‍ය නොවේ | - | - |
| 8. පාර්ලිමේන්තු සෘජු නියෝජන ඇති කිරීම. | අවශ්‍ය නොවේ | - | - |
| 9. කැබිනට් මණ්ඩලයේ නිත්‍ය සාමාජික මණ්ඩලය නම් කිරීම. | පවත්නා නියෝජනය ප්‍රමාණවත් නැත. | සියලුම කැබිනට් රැස්වීම් සඳහා ප්‍රධාන අමාත්‍යවරයාගේ නියෝජනය | ගරු ජනාධිපතිතුමා |

# උතුරු මැද පළාත් සභා මූලික යෝජනා

## කණ්ඩායම් අංක 3

| ගැටලුව | පවත්නා තත්ත්වය | විකල්පය | වගකීම |
|---|---|---|---|
| 1. නීතිමය වශයෙන් පැවරූ බලතල පළාත් සභාවට ලබාදීමට මධ්‍යම රජයේ අකමැත්ත සහ එම බලතල පළාත් සභා විසින් ලබා ගැනීමට කටයුතු නොකිරීම. | - යම් යම් විෂයයන් ක්‍රියාත්මක කිරීමේ බලතල<br>- සුරාබදු, පොලිස් බලතල<br>- ලබා ගැනීමට උත්සාහ කර ඇත.<br>මහ ඇමති සමුළුව | - අන්‍යෝන්‍ය අවබෝධය<br>- සර්ව පාක්ෂික සමුළු වාර්තාව බලගැන්වීම | රජය සහ පළාත් සභාව |
| 2. මූල්‍ය ගැටලු<br>i ) පැවරූ ආදායම් ප්‍රභව ප්‍රමාණවත් නොවීම | පළාත් අවශ්‍යතාවයෙන් 10% ත් වඩා අඩු මට්ටමක පැවතීම | - නව මූලාශ්‍ර හඳුන්වාදීම<br>- තිබෙන මූලාශ්‍ර විධිමත් කිරීම (රජය සහ පළාත් සභාව) | රජය සහ පළාත් සභාව<br>මධ්‍යම රජය<br>පළාත් සභාව |
| ii) රජයේ ප්‍රදාන මත යැපීමට සිදුවීම | 90% ප්‍රදාන මත යැපීම | | මධ්‍යම රජය<br>පළාත් සභාව |
| iii) ප්‍රදාන ලබාදීමේ නිර්නායකවල අඩුපාඩු. | නිර්නායක නැතිකම (PSDG)<br>යල් පැන ගිය නිර්නායක(CBG) වසර 20ක් පැරණියි. | පළාත්වල අවශ්‍යතාවන්ට අනුකූලව නිර්ණායක ගොඩ නැගීම | පළාත් සභාව<br>මුදල් කොමිසම |
| iv) එකඟවූ ප්‍රදාන සඳහා නියමිත වෙලාවට සහ සම්පූර්ණ වශයෙන් මුදල් ලබා නොදීම | චක්‍රලේඛ මගින් සීමා පැනවීම.<br>පුනරාවර්තන 95% පමණ<br>මූලධන 50% පමණ<br>නියමිත වේලාවට මුදල් නොලැබීම.<br>බැදීම් පියවා ගැනීමට අපහසු වීම.<br>අතරමැද කපාහැරීම් හා සීමා පැනවීම.<br>නියමිත වේලාවට සහ සම්පූර්ණ මුදල් ලබා නොදීම. | සම්පූර්ණ ලෙස ලබාදිය හැකි ප්‍රදාන පමණක් පැහැදිලිව ලබාදීම | මධ්‍යම රජය |
| v) නිලධාරීන් සම්බන්ධව වැටුප් හා දීමනා රජයේ චක්‍රලේඛ අනුව ක්‍රියාත්මක කළයුතු වුවත් ඒ සඳහා අතිරේක ප්‍රධාන නොලැබීම. | මුදල් වර්ෂය තුළ නව බඳවා ගැනීම්, දීමනා වැඩිවීම් සඳහා අතිරේක පදාන රජයෙන් ලබා නොදීම | වර්ෂය තුළ වන වෙනස් වීම් සඳහා අතිරේක ප්‍රදාන ලබාදීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම | මුදල් කොමිසම හා මධ්‍යම රජය |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

| | | | |
|---|---|---|---|
| vi) රජයේ සහ පළාත් සභා සේවකයන්ට පහසුකම් හා ප්‍රතිලාභ ලබාදීමේ දී පවතින විෂමතා. | ණය ලබා දීමේදී රජයේ සේවකයනට ඇති පහසුකම් පළාත් රාජ්‍ය සේවා නිලධාරීන්ට නොමැතිවීම<br>විදේශ ශිෂ්‍යත්ව ලබාදීමේ විෂමතා<br>ගුවන් ගමන් වියදම් දැරීමේ විෂමතා | සියලුම සේවකයන්ට සමාන අයිතිවාසිකම් ලැබෙන පරිදි අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම | මධ්‍යම රජය |
| 3. මානව සම්පත්<br>i) හිගකම (ප්‍රවීණයෝ)<br>ii) බඳවාගැනීම , ස්ථාන මාරු සහ විනය කටයුතු සම්බන්ධ ගැටලු. | 50% පමණ ඇබෑර්තු පැවතීම.<br>බඳවා ගැනීම් සීමා පනවා තිබීම<br>අනුමැතිය ලබාගත යුතු වීම<br>වැටුප් ලබා ගැනීමේ ගැටලු<br>විනය තීරණ ප්‍රමාද වීම | පළාත් මට්ටමෙන් රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම | මධ්‍යම රජය හා පළාත් සභාව |
| 4. භෞතික සම්පත් හිගකම | ගොඩනැගිලි , වාහන, උපකරණ හිගකම සහ තිබෙන වත්කම් ඉතා පැරණි වීම , එම නිසා නඩත්තු වියදම් වැඩිවීම | 1. වාර්ෂිකව යම් අනුපාතයකට අනුව සම්පත් ලබාදීම<br>2. වත්කම් නඩත්තු සඳහා වාර්ෂික දායකත්වයක් ලබාදීම | මධ්‍යම රජය |
| 5. ව්‍යවස්ථාමය කටයුතු සම්බන්ධයෙන් අර්ථකථන ලබාදීමේ දී රජයට වාසිදායක ලෙස අර්ථකථන ලබා දීම. | කෑගල්ල රෝහල රජයට පවරා ගැනීමේ දී ඒ සම්බන්ධව නීතිපති ලබාදුන් මතය | පළාත් සභාවට වගකියන නීති නිලධාරී තනතුරක් ඇති කිරීම | මධ්‍යම රජය<br>පළාත් සභාව |
| 6. සමගාමී ලැයිස්තුවේ විෂයන් ක්‍රියාත්මක කිරීමේ බාධා | 1. පවත්නා නීතිමය ක්‍රියාවලියේ අපහැදිලි බව හා දීර්ඝ බව<br>2. පළාත් සභාව විසින් එම විෂයන් සම්බන්ධව කටයුතු කිරීමට උත්සාහ කළ විට රජයේ පනත් ඉදිරියට ගෙන එම උත්සාහයන් ව්‍යාර්ථ කිරීම. | සමගාමී ලැයිස්තු ඉවත් කිරීම | මධ්‍යම රජය<br>පළාත් සභාව |

| | | | |
|---|---|---|---|
| 7. පළාත් සභා කටයුතු සම්බන්ධයෙන් මධ්‍යම රජයේ ප්‍රතිපත්තිමය තීරණවලට දායක වීමේ දුර්වලතා / නොමැතිවීම. | පළාත් සභා අමාත්‍යවරයාගේ දායකත්වය පමණි. | පළාත් ප්‍රධාන අමාත්‍යවරයා අමාත්‍ය මණ්ඩලයේ නිශ්චිත සාමාජිකත්වයට නියම කිරීම | පළාත් සභාව<br>මධ්‍යම රජය |
| 8. පළාත් සභා නීති (ප්‍රඥප්ති සම්බන්ධ රජයේ නිලධාරීන් විසින් පිළිගැනීමට තිබෙන මැලිකම. | 1. ප්‍රඥප්ති පිළිනොගැනීම<br>2. රජයේ රෙගුලාසි සහ විධිවිධාන බලවත් බව පිළිගැනීම | අදාල නිලධාරීන් දැනුවත් කිරීම හා ආකල්පමය වෙනසක් ඇති කිරීම | මධ්‍යම රජය<br>පළාත් සභාව |
| 9. ජාතික ප්‍රතිපත්ති මත පළාත් සභා විෂයයන් පවරාගැනීම. | 1. වැව් දසදහස<br>2. ජාතික පාසල් | 1. ජාතික ප්‍රතිපත්තිය යන පදනම ඉවත් කිරීම<br>2. ජාතික ප්‍රතිපත්තියට අදාල නිශ්චිත නිර්නායක පැනවීම | මධ්‍යම රජය හා පළාත් සභාව |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# උතුරු මැද පළාත් සභා මූලික යෝජනා

## කණ්ඩායම් අංක 4

| ගැටලුව | පවත්නා තත්ත්වය | විකල්පය | වගකීම |
|---|---|---|---|
| 1. න්‍යායාත්මකව පැවරී ඇති බලය ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රායෝගිකව බලපා ඇති ගැටලු | ප්‍රඥප්ති සකස් කළ යුතු වීම හා ඒ සඳහා නීතිපත් එකඟත්වය ලබා ගැනීමේ ප්‍රමාදය.<br>සමහර ප්‍රඥප්ති සඳහා රජයට වාසිවන අයුරින් තීන්දු ලබාදීම | - පළාත් සභාවට වගකියන නීතිපතිවරයෙක් ඇති කිරීමට ව්‍යවස්ථා සංශෝධනය<br>- සමගාමී ලැයිස්තුවේ සඳහන් විෂය නැවත බෙදා හැරීම<br>- මධ්‍යම රජයේ අමාත්‍යාංශ හා දෙපා. අවශ්‍ය පරිදි කුඩා කිරීම හා අහෝසි කිරීම | මධ්‍යම රජය<br><br>මධ්‍යම රජය |
| 2. විධායක ජනාධිපති ක්‍රමය තුළින් පළාත් සභා ක්‍රමය ක්‍රියාත්මක වීමේදී සීමා පැනවීම. | - පොලිස් කොමිසම සඳහා ජනාධිපතිවරයාගේ නියෝජිතයන් පත් කිරීම පමා කිරීම<br>- පළාත් සභා පනතේ 15(2) වගන්තිය අනුව ජනාධිපතිවරයාට ආණ්ඩුකාරවරුන් මගින් යම් යම් විධායක බලයක් ක්‍රියාත්මක කිරීමට හැකිවීම<br>- උදා- උතුරු මැද පළාත් සුරා බදු ප්‍රඥප්තිය ක්‍රියාත්මක විම වැළැක්වීම. උතුරුමැද පළාත් සභාව විසුරුවා හැරීම | ආණ්ඩුකාරවරයාගේ විධායක බලය තව දුරටත් විග්‍රහකර ව්‍යවස්ථාගත කිරීම හා විධායක බලය ආණ්ඩුකාරවරුන්ගේ නාමයෙන් ප්‍රකාශිත විය යුතු බවට නීතිගත කිරීම<br><br>කොමිසන් වලට සාමාජිකයන් පත් කිරීමේ කාල නිර්ණයන් නියම කිරීම | මධ්‍යම රජය |

| | | | |
|---|---|---|---|
| 3. බෙදාහැර ඇති බලය මධ්‍යම රජය නැවත ග්‍රහණය කරගැනීම | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, /ජාතික පාසල් මහ රෝහල | පවරා දුන් බලතල ආපසු ගැනීමේ දී පළාත් සභාවේ 2/3 ක අනුමැතියක් අවශ්‍ය බවට නීතිගත කිරීම | මධ්‍යම රජය |
| 4. පවරන ලද මූල්‍ය බලතල ක්‍රියාත්මක කිරීමේ අපහසුව | මහා භාණ්ඩාගාරයේ චක්‍ර ලේඛ මගින් කරන සීමා කිරීම්<br>උදා- විවිධ අරමුදල් ඇති කිරීමේ සීමා<br>ණය ලබා ගැනීමේ සීමා | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වගන්තියේ සඳහන් ''රාජ්‍ය මූල්‍ය පාලන පාර්ලිමේන්තුව සතුවේ'' යන වගන්තිය සංශෝධනය කිරීම<br>පළාත් මූල්‍ය පාලන විධි විධාන ව්‍යවස්ථා ගත කිරීම | මධ්‍යම රජය |
| 5. පළාත් සංවර්ධන අවශ්‍යතා වලට සරිලන ප්‍රතිපාදන නොලැබීම | - මුදල් කොමිසම විසින් භාණ්ඩාගාරය නිශ්චය කරදෙන සීමා පදනම් කරගෙන ප්‍රතිපාදන පළාත් අතර බෙදාහැරීම<br>- නිර්ණායකවල අඩුපාඩු නිසා ඉල්ලන ප්‍රතිපාදන නොලැබීම<br>උදා- 2007 උපමාන පාදක අවශ්‍යතාව රු මිලියන 426.2 ය නමුත් ලැබුනේ රු මිලියන 238.0<br>- වරින්වර මධ්‍යම රජය විසින් ගන්නා ප්‍රතිපත්තිමය තීරණ වලට අදාළ<br>උදා- නව බඳවා ගැනීම්, වැටුප් ආදියට අවශ්‍ය ප්‍රතිපාදන නොලැබේ. | - මුදල් කොමිසමේ කාර්යභාර්ය පුළුල් කිරීම හා මධ්‍යම රජය හා පළාත් අතර ආදායම් බෙදීම් තීරණය කරන බලතල ව්‍යවස්ථාවෙන් ලබාදීම | මධ්‍යම රජය<br>මධ්‍යම රජය<br>මධ්‍යම රජය |
| 6. වර්ෂය තුළ ප්‍රමාණවත් අග්‍රිම නොලැබීම | උපමාන පාදක ප්‍රතිපාදන වලින් නිදහස් කරන ලද්දේ 34% ප්‍රමාණයකි PSDG 49% කි. | අනුමත කරන ලද ප්‍රතිපාදන වෙනුවෙන් සියලුම අග්‍රිම ලබා දිය යුතු බවට නියමයන් පැනවීම හා මූල්‍ය ප්‍රශ්න තිබේ නම් ඊළඟ | මහා භාණ්ඩාගාරය |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

| | | | |
|---|---|---|---|
| | | වර්ගයේ එම මුදල් ලබාදීමේ වැඩ පිළිවෙලක් යෙදීම<br>- මධ්‍යම රජය හා පළාත් සභා අතර සමාන අනුපාතයකින් අග්‍රිම නියම කිරීම | |
| 7. පවරන ලද විෂයයන්ට අදාල කටයුතු මධ්‍යම රජය විසින් ඉටු කිරීම | 2007 වර්ෂයේ රු මිලියන 386.7ක්ද වාරිමාර්ග රු. මිලියන 71.6ක්ද කෘෂිකර්ම රු මිලියන 3.7 ක්ද වැඩ මධ්‍යම රජය දිස්ත්‍රික් ලේකම්වරුන් මගින් ඉටුකර ඇත. | පළාත් සභාව මගින් ක්‍රියාත්මක කළ යුතු බවට නීති පැනවීම | මහා භාණ්ඩාගාරය |
| 8. කාර්ය මණ්ඩල හිඟකම හා නව තනතුරු ඇති කිරීමේ බාධා | - පුරප්පාඩු පිරවීමට හා නව තනතුරු ඇති කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අවසරය අවශ්‍යවීම මධ්‍යම රජය හා පළාත් සභාවට ප්‍රමුඛතා දෙයාකාර වීම | පළාත් රාජ්‍ය සේවයේ බලතල පුළුල් කිරීම | මධ්‍යම රජය |
| 9. විගණන විමසුම් හා විමර්ශනය | - ආණ්ඩුකාරවරයා විසින් පනවන චක්‍රලේඛ වලට වඩා භාණ්ඩාගාර චක්‍රලේඛ බලවත් බවට වන විගණන මතය.<br>- මධ්‍යම රජය විසින් පළාත් සභා නිලධාරීන් අසීරුතාවයට පත් වන පරිදි කෙරෙන විමර්ෂණයන් | පළාත් නීතිපතිවරයෙකු හා ඔම්බුඩ්ස්මන්වරයෙකු (දුක්ගන්නාරාළ) පත් කිරීම | මධ්‍යම රජය |
| 10. මූල්‍ය බලතල ප්‍රාදේශීය මට්ටමට විමධ්‍යගත කිරීමේ ගැටලුව | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පරිපාලනය 1992 ට පෙර පළාත් සභා අධීක්ෂණයට ලක්වූවත් පසුව මධ්‍යම රජයේ | ප්‍රාදේශීය ලේකම් කාර්යාල ප්‍රධාන ලේකම්ගේ සෘජු අධීක්ෂණයට ලක් වීම | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| | ගිණුම් අධිකරණයට ලක්විය.<br>- පළාත් පාලන ආයතන වල ස්වාධීන පැවැත්ම නිසා මූල්‍ය බලතල ප්‍රාදේශීය සභා මගින් ක්‍රියාත්මක කිරීමේ අපහසුව | | |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

# උතුරු මැද පළාත් සභා මූලික යෝජනා

## කණ්ඩායම් අංක 5

| ගැටලුව | පවත්නා තත්ත්වය | විකල්පය | වගකීම |
|---|---|---|---|
| 1. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යථාර්ථයක් නොවීම. | ව්‍යවස්ථාව තුළ පවත්නා පරස්පරතා හේතු කොට පැනනැගී ඇති නෛතික බාධා<br>උදා- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 76 වන වගන්තිය තව දුරටත් බලාත්මක වීම හේතුකොට 13 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා 154 (උ) වගන්තියට පටහැනි වීම<br><br>13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභාව වෙත පැවරී ඇති කාර්ය හා කර්තව්‍යයන් ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවීම හා ඒ සඳහා සුදුසු වාතාවරණයක් නොසැලසීම | ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ පරස්පරයන් ඉවත් කිරීම හා සුදුසු සංශෝධන කඩිනමින් හඳුන්වා දීම<br>සමගාමී ලැයිස්තුවේ විෂයයන් පැහැදිලිව හඳුනා ගනිමින් මධ්‍යම රජය හා පළාත් සභා අතර නැවත විෂයයන් බෙදා හැරීම | ව්‍යවස්ථාදායකය<br>විධායකය<br>අධිකරණය |
| 2. ''ජාතික ප්‍රතිපත්තිය'' හා බලය මධ්‍යගත කිරීම. | ජාතික ප්‍රතිපත්තීන්ට මුවාවෙන් පළාත් සභාවට ව්‍යවස්ථාවෙන් පවරා ඇති කාර්ය හා කර්තව්‍යයන් රජයට පවරා ගැනීම<br>උදා- ජාතික පාසල් ශික්ෂණ රෝහල්, ගොවිජන සේවා | ''ජාතික ප්‍රතිපත්තිය'' පැහැදිලිව අර්ථ දැක්වීම හා ජාතික ප්‍රතිපත්තිය අර්ථ දැක්වීමේ දී පළාත් සභා වල සක්‍රීය දායකත්වය හා එකඟත්වය ලබා ගැනීම | ව්‍යවස්ථාදායකය<br>විධායකය<br>අධිකරණය |
| 3. තනතුරු හා පුරප්පාඩු සම්පූර්ණ නොවීම හා ඒ | දීප ව්‍යාප්ත සේවාවල පත්වීම් නිලධාරීන් | පළාත් සභාවල පවත්නා දීප ව්‍යාප්ත | දී. ව්‍යා සේවා වල පත්වීම් බලධාරීන් හා |

| | | | |
|---|---|---|---|
| සම්බන්ධ අනවශ්‍ය මැදිහත් වීම (දීප ව්‍යාප්ත සේවා නිලයන්) | මධ්‍යම රජය හා සම්බන්ධ වීම හේතුකොට පළාත් සභාවේ අවශ්‍යතා සඳහා ප්‍රමුඛතාවක් ලබා නොදීම<br>උදා- දී. සේවාවල නව පත්වීම් වලදී මධ්‍යම රජයේ පුරප්පාඩු වලට වැඩි හා විශේෂ සැලකිල්ලක් ලබාදීම | සේවා පුරප්පාඩු පිරවීමට අදාළ පත්වීම් බලධාරීන් අපමාදව කටයුතු කිරීම<br>පළාත් සභාවලට අත්‍යවශ්‍ය දී.ව්‍ය.සේවා වල හා ප.රා.සේ. තනතුරු කළමනාකරණ සේවා දෙ. විසින් කඩිනමින් අනුමත කිරීම සඳහා පියවර ගැනීම | කළ. සේවා දෙපාර්තමේනතුව |
| 4. මූල්‍ය සම්පත් ප්‍රමාණවත් පරිදි කලට වේලාවට ලබා නොදීම හා සීමා කිරීම මගින් (7% කින් අඩු කිරීම) මූල්‍ය අර්බුදකාරී තත්ත්වයක් ඇති කිරීම. | පළාත් සභා සඳහා වාර්ෂිකව වෙන් කර දෙනු ලබන ප්‍රතිපාදන වලින් සම්ප්‍රදායක් ලෙස යම් ප්‍රතිපාදන කපා හැරීමක් සිදු කිරීම හා ඉන් අනතුරුව අක් මුදල් ලබාදීම ප්‍රමාද කිරීම හා අඩුකිරීම<br>උදා- 2007 වර්ෂයේ ලබා දී ඇති අක් මුදල පොරොන්දු ප්‍රතිපාදනයෙන් (මූලධන) 48.9% කි<br>2008 වර්ෂයේ පොරොන්දු ප්‍රතිපාදයෙන් (මූල ධන) 7%ක් කපා හැරීමට උපදෙස් දී ඇත. | මුදල් කොමිසම නිර්දේශ කරන ප්‍රතිපාදන කපා හැරීමකින් තොරව පළත් සභාව වෙත ලබා දීම<br>අනුමත ප්‍රතිපාදන වෙනුවෙන් අක්මුදල් පළාත් සභාව වෙතට නොපමාව හා කලට වේලාවට ලබාදීම | මුදල් කොමිසම හා මහා භාණ්ඩාගාරය |
| 5. මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශිත ප්‍රතිපාදන පළාතට ලැබීමේ අවිනිශ්චිතතාව නිසා සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම. | මුදල් කොමිසම පළාත් සභාවට නිර්දේශ කරන මුදල පවා මධ්‍යම රජයේ ඇස්තමේන්තුවල අඩුවෙන් සැලසීම<br>උදා 2007 (පුනරාවර්ථන.) මි.6356 (නිර්දේශිත)<br>5315 (ඇස්තමේන්තු)<br>5200 (ලැබුණු අක්මුදල) | මුදල් කොමිසම නිර්දේශ කරන ලද ප්‍රතිපාදන නිශ්චිත වශයෙන් ම ලැබෙන බවට හා භාණ්ඩාගාරය විසින් තහවුරු කිරීම | මුදල් කොමිසම හා මහා භාණ්ඩාගාරය |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

| | | | |
|---|---|---|---|
| 6. පළාත් සභාවට පැවරුණු විෂයයන් සම්බන්ධයෙන් මධ්‍යයම රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු අනවශ්‍ය ලෙස මැදිහත් වීම තුළින් පළාත් සභාව අකර්මන්‍ය කිරීමට උත්සාහ දැරීම. | පළාත් සභාවල පැවරුණ විෂයන්ට අදාළ කටයුතු වලට මධ්‍යම රජයේ අමා. වලින් අසීමිත ලෙස මුදල් ප්‍රතිපාදන සලසමින් පළාත් සභා තුළ පළාත් සභාවන්ට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. උදා- i මගනැගුම යටතේ පළාත් සභා මාර්ග ii වාරි පුබුදුව යටතේ වාරිමාර්ග iii වැව් දසදහස යටතේ පළාත් වාරි මාර්ග | පළාත් සභාව වෙත පැවරුන විෂයයන්ට අදාලව පළාත් සභා මට්ටමේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්ට ඍජුවම මුදල් ප්‍රතිපාදන හා අක් මුදල් මුදා හැරීම | විධායකය හා අදාළ අමාත්‍යාංශ |
| 7. ශක්තිමත් සිවිල් සමාජයක් ප්‍රාදේශීයව නොසිටීම. | සිවිල් ප්‍රජාව තම අයිතීන් පිළිබඳව අනවබෝධයෙන් කටයුතු කිරීම හා ප්‍රජා අයිතීන් වෙනුවෙන් කටයුතු නොකිරීම | ප්‍රජාව දැනුවත් කර සිවිල් සමාජය ශක්තිමත් කිරීම උද - පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම | පළාත් සභා මධ්‍යම රජය |
| 8. පළාත තුළ ඇති විවිධ සම්පත් පළාතේ යහපතට යොදවා ගත නොහැකි අයුරින් මධ්‍යම රජය විසින් පනවා ඇති නීති ඉවත් කිරීම. | පළාත තුළ ඇති සම්පත් වලින් බදු ලබා ගැනීම. මධ්‍යම රජය වෙත පවරා ගැනීම උදා- වන සම්පත්, ඛනිජ සම්පත් (පොස්පේට්) | පළාත් සභාවට ව්‍යවස්ථානුකූලව පැවරී ඇති විෂයයන්ට පටහැනි වන පරිදි නිකුත් කර ඇති සියලුම චක්‍රලේඛ අවලංගු කිරීම | මධ්‍යම රජය හා අදාළ අමාත්‍යාංශ |
| 9. බලය බෙදා හැරීමේ නීති ක්‍රියාත්මක කිරීමට මධ්‍යම රජයේ නිලධාරින් එරෙහි වීම. | බලය රැක ගැනීම සඳහා ඇති අපේක්ෂාව හා බලය බැහැර කිරීමට ඇති අකමැත්ත උදා- සුරාබදු ආදායම් සම්බන්ධ කටයුතු සු.බ. කො. කාර්ය මණ්ඩලය විසින් කිරීම. මෝටර් රථ ලියාපදිංචිය හා රියැදුරු බලපත්‍ර ආදායම් මධ්‍යම රජයේ දෙපා. විසින් ක්‍රියාත්මක කිරීම | අදාළ නිලධාරීන් දැනුවත් කිරීම හා සුදුසු විනයානුකූල ක්‍රියා මාර්ග ගැනීම | මධ්‍යම රජයට අදාළ නිලධාරීන් |

# උතුරු මැද පළාත් සභා මූලික යෝජනා

## කණ්ඩායම් අංක 6

| ගැටලුව | පවත්නා තත්ත්වය | විකල්පය | වගකීම |
|---|---|---|---|
| 1. මධ්‍යම රජය විසින් පළාත් සභාව සඳහා අරමුදල් සැපයීම අවම කරගැනීම | දූනට පළාත් සභාවට අවශ්‍ය අරමුදල් 90% පමණ රජයෙන් ලබාදීම | පළාත් සභාවට ආදායම් වැඩිකර ගැනීම සඳහා නීතිමය තත්ත්වයන් ගොඩ නැගීම | පළාත් සභාව සහ මධ්‍යම රජය |
| 2. වර්තමානයේදී ප්‍රමාණවත් අරමුදල් නොලැබීම. | භාණ්ඩාගාරයේ මුදල් හිග වීම නිසා නොලැබීම | නියමිත කාල රාමුව තුළ මුදල් නිකුත් කිරීම | මුදල් කොමිසන් සභාව මහා භාණ්ඩාගාරය |
| 3. රටේ මූලික නීතිය ක්‍රියාත්මක කරවා ගැනීමට ඇති අභියෝග | ව්‍යවස්ථාවෙන් පැහැදිලිව බලය වෙන් කර ඇතත් ක්‍රියාත්මක කිරීමට මැලිවීම | නියමිත පරිදි බලය ක්‍රියාත්මක කිරීමට අවස්ථා ලබාදීම/ ලබාගැනීම | මධ්‍ය රජය හා පළාත් සභාව |
| 4. ප්‍රාදේශීය සංවර්ධන සැලැස්මට නිසි ප්‍රමුඛත්වයක් නොලැබීම. | ප්‍රාදේශීය සංවර්ධන සැළසුම් වලට ප්‍රමුඛතාවයක් නොදක්වීම නිසා මූල්‍ය පහසුකම් නොලැබීම | ප්‍රාදේශීය සැලසුම් සඳහා ප්‍රමුඛතාවන් ලබාදීම කටයුතු කළ යුතුවේ. | මධ්‍යම රජය |
| 5. පළාත් සභාව සතු කාර්යභාරයන් (පළාත් සභාවේ එකගතාවයෙන් තොරව) මධ්‍යම රජය විසින් ඉටු කිරීමට කටයුතු කිරීම. | හිතාමතාම පළාත් සභාව නොසලකා හැර පැවරුන විෂයයන්ද මධ්‍යම රජයෙන් කිරීම | පැවරුන විෂයයන් තුළ තම කටයුතු කිරීමට අවශ්‍ය අරමුදල් පළාත් සභාවට ලබාදිය යුතු වේ. | මධ්‍යම රජය |
| 6. ඉහත අභියෝග නිසා බලය බෙදාහැරීමේ සංකල්පය ජනතාව අතර අප්‍රසායදය ලක්වීම | අප්‍රදාසාදයට ලක්ව ඇත | රජය සහ පළාත් සභාව එකට එකතු වී ව්‍යවස්ථාවෙන් පැවරුන විෂයන් සඳහා පළාත් සභාවට කටයුතු කිරීමට ඉඩ දීම හා අරමුදල් සපයා දීම | රජය හා පළාත් සභාව |
| 7. 13 ව්‍යවස්ථා සංශෝධනයෙන් ලබාදුන් බලය නැවත | පැවරුණු විෂයයන් සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශ ඇති කර ඒ | පැවරුණු විෂයයන් සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශ ඇති | මධ්‍ය රජය |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

| | | | |
|---|---|---|---|
| ආපසු ලබා ගැනීමෙන් ගැටලු ඇති වී තිබේ. එමෙන්ම පොදු සේවාවන් හි වැදගත් අංශ මධ්‍යම රජය විසින් පවරාගෙන ඇති අතර සංවර්ධන ව්‍යායාමයේ අවසාන ප්‍රතිඵලය සම්බන්ධයෙන් වගකියන්නේ කවුරුන්දැයි නිශ්චිතව පැහැදිලි කර නොමැත.<br>උදාහරණ:<br>i මග නැගුම හා ගම නැගුම යනාදී ව්‍යාපෘතීන් විදේශාධාර ලබන අනෙකුත් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වීම සිදු වන්නේ ඉහළ සිට පහළට කෙරෙන සැළසුම් ඔස්සේය.<br>ii . ජාතික පාසල් හා ජාතික රෝහල් වල පාලනය මධ්‍යම රජයට පවරා ගැනීමෙන් ඇති වී තිබෙන තත්ත්වය<br>iii. පළාත් සභාව යටතේ පැවති රාජ්‍ය පාලනය හා ගොවිජන සේවා විෂය මධ්‍යම රජයට පවරා ගැනීම | අය සඳහා ප්‍රතිපාදන ලබාදීම පළාත් සභාව නොසලකා හැර ඇත.<br>මෙම විෂයයන් මගින් පළාත් සභාව විසින් කළ යුතු වුවත් දනට පැවරුනු විෂයයන් සඳහා රේඛීය අමාත්‍යංශ ඇතිකර ඒ අමාත්‍යංශ සඳහා අරමුදල් වෙන් කිරීම පළාත් සභා නොසලකා හැර ඇත.<br>ජාතික පාසල් හා පළාත් සභා පාසල් ලෙස වර්ග කර පළාත් සභා පාසල් වලට නිසි පරිදි සංවර්ධනයට අරමුදල් නොදීම.<br>පළාත් සභා රෝහල් සංවර්ධනයට ප්‍රමාණවකත් අරමුදල් නොදී රජය විසින් එම කටයුතු කිරීම | නොකර සැලසුම් ඉදිරිපත් කරන අවස්ථාවේදී පළාත් සභාවට එම අරමුදල් සපයා දීම හා එම කටයුතු වලට රජය පළාත් සභාව වෙත සහාය දීම<br>මෙම විෂයයන් පළාත් සභාවට පවරා ඒ තුළින් අවශ්‍ය ප්‍රතිපාදන නිසි පරිදි ලබා දිය යුතුය | |
| 8. පළාත් සභා මධ්‍යම ආණ්ඩුව අතර සම්බන්ධීකරණය දුර්වල වීම | පළාත් සභා අමාත්‍යාංශය ස්ථාපනය කර ඇත. | පළාත් සභා අමාත්‍යාංශය අතිගරු ජනාධිපති තුමා යටතට නීතිය මගින්ම පත්කොට සුදුසු යාන්ත්‍රණයක් ගොඩ නැගීම. | අතිගරු ජනාධිපතිතුමා |

# ඌව පළාත් සභා මූලික යෝජනා

## කණ්ඩායම් අංක 1

| ගැටලුව | පවත්නා තත්ත්වය | විකල්පය | වගකීම / වගවීම කාටද? |
|---|---|---|---|
| 01. මධ්‍යගත වූ බලය විමධ්‍යගත කිරීමට දක්වන අකමැත්ත හෝ මැළිකම | බලය විමධ්‍යගත කිරීමට මැලිකමක් දක්වයි | 13 වැනි ආ.ව්‍ය.සංශෝධනය සක්‍රීය ලෙස ක්‍රියාවට නැංවීම | ප්‍රජාතන්ත්‍රවාදී දේශපාන පක්ෂ තුළ සාකච්ඡාවක් හා සම්මුතියන් හරහා ක්‍රියාත්මක කිරීම |
| 02. අයකරන බදු බෙදා හැරීම සම්බන්ධයෙන් මුදල් කොමිසමට හෝ පළාත් සභාවට බලයක් නොමැතිවීම. | අය කරන බදු බෙදා හැරීම සම්බන්ධයෙන් මුල්‍ය කොමිසමට හෝ බලයක් නැත. ඉතා අසතුටුදායක තතත්වයකි. | ඌණ සංවර්ධිත පළාත් සඳහා ජාතික සමස්ත බදු මුදලින් සාධාරණ ප්‍රතිශතයක් ලබාදීම. මුදල් කොමිසම හා පළාත් සභාව එකතුව මෙම කටයුත්ත කළ යුතුය. | පළාත් සභාව මුදල් කොමිසම හා රජය |
| 03. දශක දෙකක් පළාත් සභා ක්‍රියාත්මක වුවත් බලය බෙදා හැරීම සම්බන්ධයෙන් දේශපාලන අධිෂ්ඨානයක් මධ්‍යම රජයේ නායකත්වයට නොතිබීම. | දශක දෙකක කාලයක් තුළ බලය බෙදා හැරීම සම්බන්ධයෙන් දේශපාලන අධිෂ්ඨානයක් රජයේ නායකත්වයට නොමැතිවීම | අවබෝධය තුලින් රජයේ නායකත්වය මේ සඳහා යොමු කිරීම | රටේ දේශපාලන පක්ෂ සිවිල් සංවිධාන |
| 04. පළාත් සභාවන් තුළ සිටින කුඩා ජන කොට්ඨාස වල අභිලාෂයන් නිසි ලෙස ආමන්ත්‍රණය කිරීමට නොහැකිවීම. | පළාත් සභාවක් තුළ සිටින කුඩා ජන කොටස් වල අභිලාෂයන් නිසි ලෙස ආමන්ත්‍රණය කිරීමේ අවස්ථාව ඉතා අල්පය | ලැබෙන ප්‍රතිපාදන ජාතික නියෝජනය හා අවශ්‍යතාවය මත බෙදා හැරීමට කටයුතු කිරීම | පළාත් සභාව නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂ |
| 05. ඉහළ සිට පහළට සැළසුම් කිරීමේ අඛණ්ඩ ක්‍රියාවලිය<br>උදා: අයවැය සම්පාදන හා මඟ නැගුම, ගම නැගුම වැනි වෙනත් විදේශ ආධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තව දුරටත් සිදු වන්නේ ඉහළ සිට පහළටය. | ඉහළ සිට පහළට සැලසුම් කිරීමේ අඛණ්ඩ ක්‍රියාවලිය අනුමත නොකරමු. | රජය පළාත් සභාව හා පළාත් පාලන ආයතන සංවාදයක් හරහා සම්මුතියකට එකඟවීම | රජය / පළාත් සභාව |
| 06. පොදු සේවාවන්හි වැදගත් අංශ මධ්‍යම රජයට පවරාගෙන ඇති | පොදු සේවාවන්හි වැදගත් අංශ මධ්‍යම රජයට පවරා ගෙන | වගකිම ඒ ඒ අංශ සඳහා නිශ්චිතව පැවරීම. | රජය / පළාත් සභාව |


© Copyright 2008 May Outreach Unit- Centre for Policy Alternatives

| | | | |
|---|---|---|---|
| අතර සංවර්ධන ව්‍යායාමයේ අවසාන ප්‍රතිඵලය සම්බන්ධයෙන් වගකියන්නේ කවුරුන්දැයි නිශ්චිතව පැහැදිලි නොකිරීම. | ඇත. සංවර්ධන ව්‍යායාමයන් හි අවසාන ප්‍රතිඵලය සම්බන්ධයෙන් වග කියන්නේ කවුරුන්දැයි දැනට නිශ්චිත නැත. | | |
| 07. ස්වකීය ජීවනෝපායයන් පිළිබඳ තීරණ වලදී පුරවැසි ජනයාගේ හඬට ඉඩක් නොමැතිවීම. | | පුරවැසි සංවිධාන ශක්තිමත් කරන වැඩ පිළිවෙලක් ක්‍රියාවට නැංවීම | රජය / පළාත් සභාව |
| 08. පළාත් සභා යටතේ පැවති රාජ්‍ය පරිපාලන සහ ගොවිජන සේවා විෂය ධාරාව නැවත පළාත් සභාවට අත්තර්ග්‍රහණය කිරීම. | පළාත් සභාව යටතේ පැවති රාජ්‍ය පරිපාලනය සහ ගොවිජන සේවා බලය ධාරාව ඉවත් කර ඇත. | නැවත පළාත් සභා පරිපාලනයට නතු කිරීම | රජය / පළාත් සභාව |
| 09.රාජ්‍ය සේවා පත්වීම්, මාරුකිරීම් සහ උසස්වීම් සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුව සහ පළාත් සභා අතර ප්‍රතිවිරෝධතා ඇතිවීම. | රාජ්‍ය සේවා පත්වීම්, මාරු කිරීම් සහ උසස් කිරීම් සම්බන්ධයෙන් රජය හා පළාත් සභාව අතර ගැටලුකාරී තතත්වයක් පවතී. | පළාත් සභා විශේෂ තනතුරු පිළිබඳ පූර්ණ බලතල පළාත් සභාවට පැවරිය යුතුය. | රජය |
